# 2026 මාර්තු මස 03 වන දින පෙරවරු 9.30 ට
# මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
# මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 49. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |
| 50. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. එල්. තිළිනි නෙත්සරණි මෙනවිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.03.03 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. <u>වාර්තාව පිළිගැනීම හා සළකා බැලීම.</u>

**01(1) 2025.12.11 දින පැවති විශේෂ මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2025.12.11 දින පැවති විශේෂ මාසික මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

නියෝජ්‍ය නගරාධිපති, ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2025.12.11 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**01(2) 2026.02.03 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2026.02.03 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු යැයි යෝජනා කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2026.02.03 දින සභා වාර්තාවේ 16 වන පිටුවේ මාගේ ප්‍රකාශයේ නම සංශෝධනය විය යුතුයි එය නිවැරදි කරන ලෙස ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය නගරාධිපති, ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.02.03 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව ඒකමතිකව සභා සම්මත විය.

## 02. <u>ගරු නගරාධිපතිතුමාගේ නිවේදන :-</u>

**02(01)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, 2026 පෙබරවාරි මාසයේ ස්ථාවර කමිටු සඳහා සහභාගී වීමට නොවීම සම්බන්ධයෙන් පහත නම් සඳහන් කමිටු සාමාජික මහා නගර සභා මන්ත්‍රීවරු විසින් නිවාඩු ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපි මහා සභාවට යොමු කරනවා.

- නියෝජ්‍ය නගරාධිපති, ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය 2026.02.09 දිනැති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවටත්, 2026.02.10 වන දිනැති ව්‍යාපෘති හා භෞතික සම්පත් පිළිබඳ ස්ථාවර කමිටුවටත් සහභාගි නොවීම පිළිබඳව ඉදිරිපත් කර ඇති නිවාඩු ඉල්ලා ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරනවා.

- මහා නගර සභා මන්ත්‍රී, එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය 2026.02.06 වන දිනැති මහජන උපයෝගීතා, ප්‍රජා සංවර්ධන හා කාන්තා කටයුතු පිළිබඳව ස්ථාවර කමිටුවට සහභාගි නොවීම පිළිබඳව ඉදිරිපත් කර ඇති නිවාඩු ඉල්ලා ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරනවා.

- මහා නගර සභා මන්ත්‍රී, යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා 2026.02.11 වන දිනැති ඵලදායිතාවය හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගි නොවීම පිළිබඳව ඉදිරිපත් කර ඇති නිවාඩු ඉල්ලා ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරනවා.

**02(02)** ගරු මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා අසනීප තත්ත්වයක් හේතුවෙන් අද දින මහා සභාවට පැමිණීමට නොහැකි බව මා වෙත දන්වා තිබෙනවා.

**02(03)** ගරු මන්ත්‍රීවරුනි, ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව මොරටු මහා නගර සභාව මගින් සංවිධානය කරන කාන්තා දින සැමරුම් වැඩසටහන 2026.03.05 වන දින පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා පැවැත්වෙන අතර, මේ සඳහා මොරටුව මහා නගර සභාවේ, මහා නගර සභා මන්ත්‍රීවරියන් සහ කාන්තා කාර්ය මණ්ඩලයට සහභාගි වෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**02(04)** 2026 වෙසක් පොහොය නිමිත්තෙන් බුද්ධාභිමාන වෙසක් කලාපය 2026 මැයි මස 30 වන දින සිට ජූනි 3 වන දින දක්වා මොරටු මහ නගර සභාවේ මූලිකත්වයෙන් ප්‍රදේශීය ලේකම් කාර්යාලය, පොලිසිය සහ අනෙකුත් රාජ්‍ය ආයතන වල දායකත්වයෙන් පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතින බව දන්වා සිටිනවා.

**02(05)** <u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

2026.02.03 දින පැවති මාසික සභා රැස්වීමට අදාලව සභාව අමතා එවන ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සංදේශ සඳහා ගත් ක්‍රියාමාර්ග කාරුණිකව ඉදිරිපත් කරමි.

- මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා ඉදිරිපත් කළ පෙත්සම සඳහා තාක්ෂණ නිලධාරි වාර්තාව ලබා දී ඇති බැවින්, එය ඉදිරි කටයුතු සඳහා නාගරික ඉංජිනේරු වෙත යොමු කරනවා.

- මහා නගර සභා මන්ත්‍රී, සුජිත් ඩිල්රෝල් ප්‍රනාන්දු මහතා ඉදිරිපත් කළ පෙත්සම සඳහා ගත් ක්‍රියාමාර්ගය යෝජක මන්ත්‍රීතුමාගේ සම්බන්ධීකරණයෙන් අදාළ ඉඩම්වල තක්සේරු දැන්වීම් පරික්ෂා කිරීමක් සිදු කර ඇති අතර ජුබිලි පාර මැල්වත්ත/ බිශොප් ටෙරස් හි නුගවත්ත ලක්ෂපතිය පාර වවුල්ගහවත්ත යන ජනාවාස වලට අදාල තක්සේරු දැන්වීම්වල අයිතිකරු ලෙස සටහන් ඇත. එබැවින් ඔප්පු ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු වන ලෙස යෝජක මන්ත්‍රීතුමා දැනුවත් කිරීම සුදුසු වේ.

- මහා නගර සභා මන්ත්‍රී, එල්. ඩී. තිලක් විජේතුංග මහතා ඉදිරිපත් කළ පෙත්සම සඳහා ගත් ක්‍රියාමාර්ගය අදාල ස්ථානය පරීක්ෂා කර විෂය භාර නිලධාරී විසින් කරුණු ඇතුලත් වාර්තාවක් ලබා දී ඇත. එය ඉදිරි කටයුතු සඳහා යොමු කරනවා.

- මහා නගර සභා මන්ත්‍රී, ජීවන්ත සෙනෙවිරත්න මහතා ඉදිරිපත් කළ පෙත්සම සඳහා ගත් ක්‍රියාමාර්ගය කැඩැස්තර සිතියම් අංක 520204/04/351, 354 මඟින් ප්‍රකාශිත මෙම ක්‍රීඩා පිටිය සභාව විසින් භුක්ති විඳින දේපළකි. නමුත් මෙම ඉඩම රජය සතු අතර පැවරුම් නියෝග ලබා ගැනීම සඳහා ප්‍රාදේශිය ලේකම් වෙතින් ඉල්ලීමක් සිදුකර ඇත. තවද බිම් සවිය ඉඩම් විස්තර ලැයිස්තුවේ සඳහන් පරිදි කඩයිම් සිතියම් අංක 520204/04/351, 354 මඟින් ප්‍රකාශිත මෙම ක්‍රීඩාංගණ අංක 1707/13 – 2011.05.25 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් රජය නමින් ගැසට් කර ඇත. ඒ හේතුවෙන් පැවරුම් නියෝග ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත.

## 03 සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.

**03(1)** මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනී, මොරටුව මහා නගර සභාවේ සෞඛ්‍ය පරිපාලකයෙක් විදිහට කටයුතු කරන චමින්ද්‍ර ප්‍රියන්ත පිරිස් මහත්මයා විසින් ඉදිරිපත් කරපු පෙත්සමක් සභාගත කරනවා. එතුමා මේ නගර සභාවේ දීර්ඝ කාලයක් සේවය කරලා, එවගේම එතුමගේ සේවය නවතාලීම සම්බන්ධව එතුමා කරපු ඉල්ලීමට විමර්ශනයක් පවත්වලා රැකියාව ලබා දෙන්න තීරණය කරලා, එතුමා දැනට රැකියාව කරනවා. එම තීරණයේදී වැටුප් රහිතව රැකියාව ලබාදෙන තීරණය කරනවා, නමුත් අභියාචනයෙන් පසු වැටුප් ලබා දෙන්න කමිටුව විසින් නිර්දේශ කරනවා, හැබැයි එහෙම නිර්දේශ කරලා තියෙද්දි නැවත වතාවක් නගර සභාවෙන් පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියක් ඉල්ලලා යවනවා. දැන් විමර්ශනයක් පවත්වලා වැටුප් ලබා දෙන්න නිර්දේශ කරලා තිබියදී මේ වැටුප ලබා නොදීම ඉතාමත් අසාධාරණ ක්‍රියාවක්. පළාත් පාලන කොමසාරිස්ගෙන් ලැබෙන තොරතුරු අනුව එතුමිය කියලා තියෙනවා එතුමියට බලයක් නැහැ මේක එවන්න විමර්ෂණය පවත්වලා එක ගන්න තීරණය අනුව දෙන්න පුළුවන් කියලා. මෙහි සුළු අතපසුවීමකින් හරි වෙන හානිය බරපතලයි මොකද දීර්ඝ කාලයක් රැකියාව නොකරම හිටපු නිසා එතුමා එවල තියෙනවා එතුමාගේ ගේ පවා උකස් කරලා තියෙනවා. ඒ වගේම ලොකු ආර්ථික ප්‍රශ්න වලට මුහුණ දීලා තියෙනවා. ඒ නිසා මෙය දුර දිග ගෙන යන්නේ නැතුව ඉක්මනින් සාධාරණයක් ලබා දෙන්න කියලා ඉල්ලනවා.

**03(2)** මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා

ගරු නගරාධිපතිතුමනී, කටුබැද්ද ඇවිදින මංතීරුවේ ඇවිදින පිරිසගේන් පෙත්සමක් තියෙනවා මේ සඳහත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලනවා. මේ ඇවිදින මංතීරුවට එන පිරිසගෙන් බොහෝ දෙනෙක් දැන් එන්නේ නැහැ. එතන ඉන්න ආරක්ෂක අංශ නිලධාරින්ගෙනුත් දැනගන්න පුළුවන් ඒ අයටත් ලොකු තර්ජන තියෙනවා. ඒ සම්බන්ධයෙන් තමයි මේ ලිපිය එවලා තියෙන්නේ. එතන තියෙන වංගුවල කළුවර තැන්වල තියෙන බංකු වල බලන්න බැරි නින්දිත විදියට හැසිරෙන අය ඉන්නවා. ගිහින් කියන්න ගියාම ආරක්ෂක නිලධාරින්ටත් පහර දෙන්න එනවා. ඇවිදින පිරිස් වලටත් පහර දෙන්න එනවා. එකට විකල්පයක් විදිහට එතන තියෙන බංකු ටික ඉස්සරහට කරන්න නැතිනම් ඒ බංකු ටික ඉවත් කරන්න කියලා ඔවුන් ඉල්ලීමක් කරනවා. මොකද කුඩා දරුවෙක්වවත් එක්කගෙන මේ ස්ථානයට එන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා. ඒ නිසා මේ සඳහා ඉක්මන් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**03(3)** මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා

ගරු නගරාධිපතිතුමනී, වාචික පැමිණිල්ලක් සහ ඉල්ලීමක් සිද්ධ කරන්න තමයි මේ අවස්ථාව යොදා ගන්නේ විශේෂයෙන් ඔබ අප කවුරුත් දන්නවා ලුනාව කලපුව අපට ඉතාම වැදගත් ස්ථානයක්, වසර ගණනාවක් තිස්සේ මේ කලපුව ක්‍රමක් ක්‍රමයෙන් විනාශයට පත්වෙලා තිබෙනවා. විශේෂයෙන් ඇවිදින මංතීරුව ඒ ආශ්‍රිත පාවිච්චි කරන ජනතාවගෙන් නිරන්තරයෙන් පැමිණෙන චෝදනාවක් සහ ඉල්ලීමක් තියෙනවා, එක්තරා කාලෙකදී මේ කලපුව තුළ විශාල දුර්ගන්ධයක් එනවා. විශේෂයෙන්ම ඒ වියලි කාලසීමාව ඇතුළත එතකොට මේ පහුගිය දින කීහිපය ඇතුලෙත් විශාල දුර්ගන්දයක් හැමුවා, දැන් යම් ප්‍රමාණයකට ඒකට අපි පිළිතුරු සපයලා තියෙනවා. අපි බලාපොරොත්තු වෙනවා ඊලඟ සති 2ක ඇතුලත ලබන 14, 15 වගේ දින යොදාගෙන ඒ අවට ප්‍රදේශය පිරිසිදු කිරීමේ ශ්‍රමදානයක් කරන්න. ඊට අමතරව මමත් තව මන්ත්‍රීවරු කිහිපදෙනෙක් වාචිකව අපිට ඉදිරිපත් කරපු පැමිණිල්ලට අනුව අපි ඒ ස්ථානය බලන්න ගියා. අපිට ඉතාම පැහැදිලිව පෙනුනා යම් කලර් එකක් ඒ කියන්නේ ඩයි එකක් වගේ එකක් අපිට නිරීක්ෂණය වුණා. මේකෙ ඇත්ත නැත්ත හොයන්න වෙන්නේ යම් සාධාරණ විධිමත් පරික්ෂණයක් ඇතුලේ එතකොට අපිට මීට කලිනුත් පැමිණිල්ලක් ලැබිලා තිබුනා යම් ආයතනයක් මඟින් මේ කලපුවට මේ ඩයි වර්ග මුදා හරිනවා කියලා. මෙය මීට කලිනුත් පරීක්ෂණයක් කරලා තිබුනා, ඒ පරීක්ෂණය ඇතුළේ යම් යම් නිර්දේශ ලැබිලා තිබුනා. නමුත් අපිට සාධාරණ සැකයක් තියෙනවා මොකද ඒ ආයතනය මගින් පිටවෙන ඒ වර්ණයත් කලපුවේ තියෙන වර්ණයත් කොළ පාට දෙකම එක හා සමාන බවක් අපිට පේනවා. ඒක බරපතල ප්‍රශ්නයක් අපිට කලින් නිර්දේශ වුනේ මේක මේ ඇල්ගී

එකක් මාර්ගයෙන් ඇතිවෙන තත්ත්වයක් කියලා නමුත් ඒක අපිට හිතන්න බැහැ. ඒ ඩයි එකේ වීඩියෝ දැන් අපි ගාව තියෙනවා. මම ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා නගරාධිපතිතුමනි මේ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරිය හෝ වෙනත් ඒ වගකිවයුතු ආයතනයක් හරහා විධිමත් පරීක්ෂණයක් සිද්ධ කරලා මේ පිළිබඳව ඇත්ත තත්ත්වය වාර්තා කරලා එකට අදාළ වැරදිකරුවන් සිටිනවනම් ඒයට ආදාළ නීතිමය ක්‍රියාමාර්ග ගන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපිට නිරීක්ෂණය වුණා සීවිච් රිසිඩන්ට් එක පැත්තෙන් යම් බටයක් එළලා තියෙනවා අඟල් 4ක විතර. මේක කාලයක් තිස්සේ සිද්ධ වෙන එකක් අපි දන්නේ නැහැ ඒ බටේ මොකටද කලපුවට යොමු කරලා තියෙන්නේ කියලා? දැන් ඒ බටේ තියෙන්නේ අර පාලම අයිනෙන් යන්නේ ඒක පහුගිය කාල සීමාවේ තිබුණ එකක් එතකොට ඒක පිළිබඳවත් අපිට විශාල සැකයක් තියෙනවා අපි දන්නේ නැහැ මේක අපිට නිකන් සැකය මතු වෙන්නේ ඒ සීවිච් රෙසිඩන්ට් එක හරහා එන යම් අපද්‍රව්‍ය ජලය යම් පිරිසිදු කිරීමට ලක් කරලා හෝ කලපුවට මුදාහරිනවද කියලා. එහෙම මුදාහරින්න බැහැ කලපුවට මේ පිළිබඳවත් ඉතාම ඉක්මනින් පරීක්ෂණයක් කරලා මෙයට විසඳුමක් ලබා දෙන්න කියලා ජනතාවගෙනුත් ඉල්ලීමක් තියෙනවා. අපිත් ඔබතුමාගෙන් කඩිනමින් මේ පිළිබඳ විමර්ශනයක් කරලා ඉක්මනින් මේකට අදාළ ක්‍රියාමාර්ග ගන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මෙය ඉතාම වැදගත් කාරණා දෙකක්, සෞඛ්‍ය කමිටු සභාපතිවරයා ලෙස මම හිතන්නේ මේ කරුණ වාචිකව ඉදිරිපත් කිරීමට වඩා පෙත්සමක් ලෙස ලිඛිතව ඉදිරිපත් කිරීමක් කරානම් තමයි වැදගත්,

**03(4)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ මම මීට පෙරත් ප්‍රකාශ කරා අනතුරු දායක පොල්ගසක් සම්බන්ධයෙන් පහළ ඉදිබැද්ද ප්‍රදේශයේ. දැනුත් ඔබතුමා ඔබතුමාගේ අදහස් ප්‍රකාශ කිරිමේදී ප්‍රකාශ කරා මේ ආයාචනා හා පෙත්සම් වලට ගත්ත ක්‍රියාමාර්ග පිළිබඳව. හැබැයි මෙය 2024 පළවෙනි මාසේ 30 මේ අනතුරුදායක පොල් ගස සම්බන්ධයෙන් ඒ මිනිස්සු පැමිණිලි කළා. දැන් අවුරුදු 2යි මාස 2ක් ගිහිල්ලා. හැබැයි මේ ස්ථානය පරික්ෂා කරපු නිලධාරියෙක් කියලා තියෙනවා මෙය අනතුරුදායකයි කියලා. හැබැයි තවම මෙයට ගත්ත ඉදිරි ක්‍රියාමාර්ග නැහැ. නමුත් අපි සභාව තුළ කතා කරනවා, සභාවෙන් අපිට ඉදිරි ක්‍රියාමාර්ග ගන්නවා කියලා ලිපි එවනවා, හැබැයි ඊට පස්සෙත් අපි සභාවේත් කතා කරලා අවශ්‍ය කරන ප්‍රධාන ඉංජිනේරුතුමා සමඟ කතා කරනවා, සබ්ජෙක්ට් එක කරන අයත් එක්ක කතා කරනවා, හැබැයි මේක එහෙම්ම තියෙනවා. අනතුරුදායක ගහක් සම්බන්ධ පැමිණිල්ලක් කලාම අවුරුදු දෙකයි මාස දෙකක් යනවනම් ඒකට ක්‍රියාමාර්ගයක් ගන්න මොකක්ද තේරුම. අපි මෙතන කතා කරනවා ඔබතුමා අහන් ඉන්නවා නිලධාරීත් අහන් ඉන්නවා මෙතනින් එහාට ගියාට පස්සේ නැවත අපි සභාවේ කතා කරනකම් පිළිතුරක් ලැබෙන්නේ නැහැ. ඔබතුමා මෙතනට ගියත් තේරෙනවා මේ ගස තියෙන්නේ ඒ මිනිස්සුන්ගේ ස්ලැබ් එක උඩ, මේ ගහ ඇදලාවත් අයින් කරන්න පුළුවන් ගහක් නෙමෙයි. මේක එන්න එන්න මේ ගෙදරට අනතුරුදායකයි. ජීවිත හානි වෙන්නත් පුළුවන්. හැබැයි මම දැනට මාස තුනකට ඉස්සෙල්ලා සභාවෙත් කිව්වා. හැබැයි මේක නැවතිලා තියෙන හේතුව තමයි මම එදත් කිව්වා පැමිණිල්ල කරපු මනුස්සයා කියලා තියෙනවා ගස ඉවත් කරගන්න කියලා. ඒ ගස අයිති කෙනා කියලා තියෙනවා මේ මිනිස්සුන්ගේ වත්තේ වතුර එනවා මෙහෙට ඒක නවත්තනකම් ගහ කපන්නේ නෑ කියලා. හැබැයි ඒ වත්තේ හිමියා කියන්නේ අවුරුදු 2ක් ගියාට පස්සේ අප ජලය එහෙට එනවා කියලා. දැන් උත්තරය හැටියට කියලා තියෙන්නේ අප ජලය එන එක නවත්තන්න එතකොට මේ ගස කපන්නම් කියලා. පැමිණිල්ල දාපු කෙනා ඔහුගේ මුදල් වලින් හෝ ගස කැපීමට කැමති වෙලා ඉන්නවා ඒ මනුස්සයගේ අනතුර නිසා හැබැයි එකටවත් තවම පිළිතුරක් නැහැ. වයසක ආච්චි කෙනෙක් මෙතුමලා දන්නවා, එන්නේ බොහොම අමාරුවෙන් අවුරුදු අසූපහක අනුවක කෙනෙක් මේ එන්නේ. එම නිසා මේ සඳහා ඔබතුමාගේ කාරුණික අවදානය යොමු කරලා හෙට දිනයේදී හෝ පිළිතුරක් ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(5)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, මොරටුව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ප්‍රාදේශීය බල මණ්ඩලයේ ගරු සභාපති ශ්‍රීමාල් ප්‍රනාන්දු මැතිතුමා විසින් හා ගරු ලේකම් කේ. සරත් කුමාර මහතා විසින් ඔබතුමා වෙත ඉදිරිපත් කරන ලද විශේෂ ඉල්ලීමක් සම්බන්ධව තමයි මෙම පැමිණිල්ල මම ඉදිරිපත් කරන්නේ. 2000 අංක 19 දරණ පාර්ලිමේන්තු පනතින් සම්මත වී ඇති දිවයින පුරා පිහිටා ඇති මොරටුව ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ප්‍රාදේශීය බල මණ්ඩලය සඳහා නිලධාරීන්ගේ ඉල්ලීමක් තියෙනවා. ස්ථිර වශයෙන් කාර්යාලයක් පිහිටවීමට අවශය ඉඩකඩ නගර සභාවෙන් ලබා දෙන්න කියලා. මම හිතන්නේ එය බොහෝම මානුෂිය ඉල්ලීමක්. නමුත් දැනට ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත් එකොළොස් වෙනි මාසේ තමයි ඔබතුමාට ඉදිරිපත් කරලා තියෙන්නේ. ඉතින් විශේෂ අවධානය යොමු කරන්න කැමතියි මොකද රටක වැඩිහිටි පුරවැසියන් සහ දරුවන් වෙනුවෙන් කටයුතු කිරීමේ විශේෂ අයිතියක් සහ විශේෂ යුතුකමක් තියෙනවා නගර සභාවකට. අපිට මන්ත්‍රීවරුන් සහ ඔබතුමාට නගරාධිපතිවරයා වශයෙන් ඉතින් ඊට අවශ්‍ය එතුමන්ලා බලාපොරොත්තු වෙන්නේ මම හිතන්නේ ලොකු දෙයක් නෙමෙයි. නගර සභාව සතු ස්ථානයක්. පොඩි ඉඩකඩක් තමයි එතුමන්ලා බලාපොරොත්තු වෙන්නේ. එතුමන්ලාගේ අවශ්‍යතාවය තමයි අනාගතයේ මොරටුව ජනතාව වෙනුවෙන් රෝද පුටුවක්, කිහිලිකරුවක්, අත්වාරුවක් වගේ දේවල් ජනතාවගේ අවශ්‍යතා මත ලබාදීම. මමත් ඒ යෝජනාව මොරටුව මහ නගර සභාවට ඉදිරිපත් කළා. එතුමන්ලාගේ යෝජනාව ඉටුකරන්න අවශ්‍ය පහසුකම් අපි සපයා දිය යුතුයි කියන තැන මම ඉන්නවා. මොකද රටක තිරසර සංවර්ධනය ඉදිරියට යන්න අපි ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ආරක්ෂා කරන්නට අවශ්‍යයි. ඔබතුමා මේ සඳහා හැකි ඉක්මනින් විසඳුමක් ලබා දෙන්න කියලාත් ඉල්ලීමක් කරනවා.

**03(6)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී,ඔබතුමා නියෝජනය කරන එගොඩඋයන කොට්ඨාසය,මෝදර කොට්ඨාසයෙන් මට පැමිණිලි රාශියක් ඉදිරිපත් කරනවා. ඒ කොට්ඨාසයේ මම හිතන්නේ කුණු කසල බැහැර කිරීම සම්බන්ධව ලොකු ප්‍රශ්න ගොඩක් තියෙනවා. කාණු පද්ධති වලින් ගන්න කුණු එළියේ තියලා නැවත ඒ කුණු කානු ඇතුළටම තැන්පත් වෙනවා කියලා නිතර ප්‍රකාශ කරනවා. මොරටුවේ නගරාධිපතිවරයා ප්‍රථම පුරවැසියා විදියට ඔබතුමාගේ කාර්යය භාර්යය ඒ සඳහා යොමු කරන්න ඔබතුමා පත්වෙච්ච කොට්ඨාසය ඔබතුමාට ඡන්ද හත්සිය ගාණක් ජනතාව ඡන්දය ලබා දුන්නා. ඉතින් එවැනි කර්තව්‍යන් ඔබතුමා බැහැර කරන්න එපා. ඒ ජනතාවගේ අවශ්‍යතාවයන් ඔබතුමා සපුරාලීය යුතුයි කියන තැන අපි ඉන්නවා. ඉතින් අපිට කරන්න පුළුවන් දෙයක් නැහැ. ඔබ ඔය පුටුවේ ඉන්නකොට ඔබට තමයි කරන්න පුළුවන්කම තියෙන්නේ. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**03(7)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, නිශේන්ද්‍ර ජයනාත් ප්‍රනාන්දු මහත්මා නොම්බර 46/17 වීර පුරන්අප්පු රජ මාවත මොරටුවේ සිට මේ පෙත්සම එවලා තියෙනවා. එතුමාගේ නිවසට අදාළ මාර්ගය අවහිරවීම සම්බන්ධ ඔබතුමා දැනුවත් කරලා තියෙනවා කිව්වා. නමුත් තවමත් ඒ සම්බන්ධයෙන් කිසියම් කටයුත්තක් සිදුවී නැති බවත් තියෙනවා එතුමාගේ අදාල ලියකියවිලි මම සහගත කරනවා. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කළ යුතුයි මොකද අපි මාස දැන් 8ක් ගෙවලා ඉවරයි. අපි යෝජනා දානවා අපි පැමිණිලි දානවා අපි ඉදිරිපත් කරන ඉල්ලීම් වලට සමහරක් වෙලාවට කිසිම ක්‍රමවේදයක් මෙතන නැහැ කියලා පෙනී යනවා. අපි මහා සභාවට ඉදිරිපත් කරන යෝජනා සම්බන්ධව ලිඛිතව ඉදිරිපත් කරන ඒවා වෙන්නේ නැත්නම් එතනින් එහාට ඔබතුමා මොනවා හරි පැහැදිලි ක්‍රියාමාර්ගයක් ඉදිරියට ගන්න කියලා ඉල්ලා සිටිනවා. මේ සම්බන්ධව විශේෂ නිලධාරියෙක් හරි පත්කරලා මේ කටයුතු නිසියාකාරව කරන්න. මේ මහා සභාව කියන්නේ මම හිතන්නේ ප්‍රධාන කර්තව්‍යන් කරන තැන. අපිට අපේ යෝජනා ඉදිරිපත් කරලා ඔබෙන් පිළිතුරක් නොලැබෙනවා නම් එතනින් එහාට පරිපාලන දුර්වලතාවයන් තමයි ඉදිරියට අපිට දකින්න ලැබෙන කියන එකත් කියන්න කැමතියි.

**03(8)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පැමිණිලි පෙත්සම් යටතේ ලක්ෂපතිය උතුර මහජන ආරක්ෂක කමිටුවේ සභාපතිතුමිය සහ ලේකම්තුමිය මාර්ගයක් අවහිර කිරීම සම්බන්ධයෙන් පෙත්සමක් ඉදිරිපත් කරලා තියෙනවා. මම එය සභාගත කරනවා.

**03(9)** <u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ වාචික කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමති, කාලෙක පටන් ගොළුමඩම හන්දියත් ආර්ථික මධ්‍යස්ථානයට සම්බන්ධ වෙන දෙවට පාරත් අතර කිලෝමීටරයක පමණ දුරක් තියෙන අපේ සභාව සතු පාරක් නෙවෙයි. නමුත් විශාල ගමනා ගමනයක් සිදුවෙනවා. ඒ වගේම විශාල පිරිසක් මේ මාර්ගයේ ගමන් කරනවා. ගොළුමඩම හන්දියේ සිට විරසේන සිල්වා මවත දක්වා තියෙන කල්දේමුල්ල ප්‍රධාන පාර මෙම පාර මොරටුවේ ජනතාව විශාල ලෙස භාවිතා කරන පාරක් කල්දේමුල්ල ප්‍රදේශයේ කොටසක් සම්බන්ද වෙනවා. අනිත් කොටස රත්මලාන ප්‍රදේශයට සම්බන්ද වෙනවා. මේක මහා මාර්ග අධිකාරියට අයිති පාරක් කාලයක පටන් කැඩී තියෙන නිසා ඒක සංවර්ධනය කරලා දෙන්න කියන ඉල්ලීම කරන්නවා.

**03(10)** <u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ රාවතාත්ත සුසාන භූමියේ සේවකයින් 6 දෙනෙක් පමණ සේවය කරනවා. මෙම පවුල්වලවල් දෙකක් තියෙනවා ඔවුන්ගේ කැමැත්ත මත සුද්ධ පවිත්‍ර කළා කියලා ඔවුන්ගේ වැටුප කපලා තියෙනවා. ඒක ප්‍රතිසංස්කරණය කළා කියලා මේ මහන්සි වෙලා සේවය කරන සේවකයින්ගේ මාසික වැටුපෙන් දොළොස්දහක් පවා කපලා තියෙනවා. මේක අසාධාරණයි මොකද ගහක් වැටුණත් එක කපන්න මාසයක් විතර යනවා. ඒ මොන ප්‍රශ්න තිබ්බත් ඒ ගොල්ලන් වළවල් කපනකොට මිනී මතුවෙනවා, වැඩ කරනකොට මහන්සිවෙලා වැඩ කරනවා. ඒ සේවකයින්ගේ වැටුප කපලා. අහිංසක මිනිස්සුනේ මම කියන්නේ මේ වගේ දේවල් ඉදිරියේදී නොවෙන්න වගබලා ගතයුතුයි.

**03(11)** <u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, පාරවල් කිහිපයක් කල්දමුල්ලෙ කැඩී තියෙනවා. මම දැනුවත්ව ගල් රෝල කැඩී තියෙන නිසා තමයි පාරවල් හැදෙන්නේ නැත්තේ. ඔබතුමා ගෙන් විමසනකොට ඔබතුමා කිව්වා අලුත් ගල් රෝලක් දාලා තියෙන්නෙ ගන්න කියලා. ඉතා ඉක්මනින් ඒක අරගෙන මම දැක්කා ෆේස්බුක් එකේ සඳහනක් දාලා තියෙනවා මේක සකසා දෙන්න කියන එක.

**03(12)** <u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ ගබඩා පරිශ්‍රය ස්ථාපිත කරලා තියෙන තැන නිරීක්ෂණය කරනකොට මන් දැක්කා ඉතාමත් දුෂ්කර තත්ත්වෙක තමයි ඒ කාර්ය මණ්ඩලයේ ඒ රාජකාරි කරන්නේ. ඒ සම්බන්ධව ඔබගේ අවධානය වහාම යොමු කරන ලෙස කරුණාක ඉල්ලා සිටිනවා මම එම ලිපිය සභාගත කරනවා.

**03(13)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඩී. තිලක් විජේතුංග මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයචන හා පෙත්සම් යටතේ පෙත්සමක් ඉදිරිපත් කරන්න තියෙනවා. කටුබැද්ද ඇවිදින මංතීරුව සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයක් තියෙනවා. මේ මොහොත වෙනකොට කටුබැද්ද මං තීරුව කලින් තිබුණු තත්ත්වයට වඩා හොඳින් ඒක පාලනය වෙනවා කියන එක මම කියනවා. මොකද කලින් තිබුන තත්ත්වයට වඩා මේ මොහොතේ පිරිසිදුකම අතින් හොඳටම ඒ ක්‍රියාවලීන් සිදුවෙනවා. නමුත් යම් යම් අයගෙන් ප්‍රශ්න තියෙනවා. මෙම ස්ථානයේ අශෝභන විදියට හැසිරෙන තත්ත්වයක් තියෙනවා. මම එම ලිපිය සභාගත කරනවා.

**03(14)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රථමයෙන් ඔබතුමාට විශේෂ ස්තුතියක් කරන්න ඕනේ ගිය සභා වාරයෙදී මගේ යෝජනාවක් තිබුණා අපේ රේඛා තරංගනී ලංකාදීප වාර්තාකාරනීය පිළිබඳ. එතුමියට ඔබතුමාගේ මැදිහත් වීම මත මුදලක් ලැබිලා තියෙනවා. එ සඳහා බොහොමත්ම ස්තුති වන්ත වෙනවා. ඒ වගේම ඔබතුමාට වාචික පැමිණිල්ලක් ඉදිරිපත් කරන්න තියෙනවා. 2025 මැයි මාසේ ඡන්දෙන් ජයග්‍රහණය

කරලා ඔබතුමාලා දැන් මාස අටක් ඇවිල්ලා තියෙනවා. කොමසාරිස් පාලන කාලෙවත් නොතිබුණු විදියට කාර්මාන්ත අංශයේ ගොඩක් වෙනස්කම් වලට භාජනය වෙලා තියෙනවා. අපි ඔතන ඉන්නකොට මිනිස්සු ඇවිල්ලා කියන දෙයක් තමයි වීථි රේඛා සහතිකයක් ගන්නට වඩා ලේසියි බැංකු ලොන් එකක් ගන්න එක කියලා. එච්චරට ඩොකියුම්න්ට්ස් ඉල්ලනවා විථිරේඛා සහතිකයක් ලබා ගන්න. අපේ පාලන කාලේ රුපියල් දෙසිය හතළිහයි අපි විථිරේඛා සහතිකය ලබා ගන්න අයකලේ. දැන් හාරදාහකට වඩා ගානක් මිනිස්සුන්ගෙන් අයකරනවා. මේ විථිරේඛා සහතිකයක් ගන්නේ මොකටද, එක්කෝ බිල්ඩින් එක හදන්න, නැත්නම් බැංකු ණයකට යන්න. මම මේ ගිය සතියේ ඇවිල්ලා බලනකොට මෙතන ලොකු විස්තර පත්‍රිකාවක් තියෙනවා. මේ විදිහට කොමසාරිස් පාලන කාලයේවත් වුනේ නැහැ. අවුරුදු 20ක් තිස්සේ ෆෝම් එක දුන්නට පස්සේ සටහන් කරා විනාඩි 5ක් යනකොට ලබා දුන්නා. ඔබතුමාව මේ සම්බන්ධයෙන් දැනුවත් කරනවා. මම මේ පැමිණිල්ල ඉදිරිපත් කරන්නේ මෙහි තියෙනවා, ඡායා පිටපත් ඉදිරිපත් කිරීමේදී පරීක්ෂණය සඳහා ඔරිජිනල් එක ඕනෙලු. ඡායා පිටපතක් දෙනකොට ෆයිල් එක තියෙනවා කර්මාන්ත අංශයේ එකෙන් බලලා ඕන කෙනෙකුට පරික්ෂා කර ගන්න පුළුවන්. අයදුම්කරු අත්සන් කරලා ෆොටෝ කොපියක් දුන්නම ඇති, මේ විථිරේඛා එකෙන් මුකුත් හොරකමක් කරන්න බැහැ. ඇයි දන්නේ නැහැ ඔබතුමා මේ විදිහට අනුමැතිය දුන්නේ ඉඩමට අවශ්‍ය පිඹුරු පතේ පිටපතකුත් ඕනේ කියනවා. කිසියම් බැංකුවකින් ණයක් ලබාගෙන තිබේනම් එම දේපළට අදාල බැංකුවේ මිනින්දෝරු සැලැස්මෙහි මුල් පිටපත ඒ බැංකුවේ රඳවා තබාගෙන ඇතිනම් අදාල බැංකුවේ කළමණාකරු විසින් ලියුමක් දෙන්න ඕන මේ විථි රේඛා සහතිකය ලබා ගන්න. ඉල්ලුම් කරුගේ ජතික හැඳුනුම් පතේ පිටපතක් ඕන, වරිපනම් ගෙවපු රිසිට් පතක් ඕන, ඊට පස්සේ කියනවා අයදුම් පත්‍රයේ 1,2,3,4,5 අනිවාර්යයෙන්ම සම්පූර්ණ කළ යුතුයි. ඉඩමේ හිමිකම්, විථි රේඛා, ගොඩනැගිලි සීමා අයදුම්පත් ඉදිරිපත් කරන තැනැත්තාට හිමි නොවේනම් ඉහත අයදුම් පත්‍රයේ අනුව අංක 6 කොටස සම්පූර්ණ කළ යුතුය.ඉහත උපදෙස් සමඟ සම්පූර්ණ කල අයදුම්පත්‍රය විෂය භාර නිලධාරියාට භාරදී ආදාල ගාස්තු ගෙවා ලදුපතක් දෙන්න ඕනේලු. දැන් වීථිරේඛාව ගන්න ඕන මෝදර කියන්නකෝ, දැන් ඔබතුමාගේ ගමේ වීථිරේඛා සහතිකය ගන්න යනකොට මෙයාලා දානවා ට්‍රාන්ස්පෝට් එකක්, මෙතන ඉදලා මෝදරට යන්න ට්‍රාන්ස්පෝට් ලොකු ගාණක් දානවා. මෙතන ඉඳලා ඉදිබැද්දට කිලෝමීටර් හතරක් තියෙනවනම් ඉදිබැද්දට ගිහින් එන්න ත්‍රිවිල් ගාස්තු රුපියල් 800ක් කියන්නකෝ නමුත් මෙහෙන් 1600ක් අනිවාර්යයෙන්ම දානවා. වීථි සීමා, ගොඩනැගිලි සීමා සහතික නිකුත් කරන ලෙස නිකුත් කරනු ලබන්නේ අනුමත සැලසුම් සඳහා පමණි. ඒ කියන්නේ සර්වර් ප්ලෑන් එකක් ඇප්රූල් නම් විතරයි සහතිකයක් දෙන්නෙ නැත්නම් දෙන්නේ නැහැලු. එවා හරි වැරදියි, මේ මහා නගර සභාවක පර්චස් හයට වඩා වැඩිවෙන්න ඕනෙ අනිවාර්යයෙන්ම ප්ලෑන් එකක් පාස් වෙන්න. පර්චස් පහේ කෙනෙක්ට බැංකු ලෝන් එකක් ගන්න බැරිද, මොකද්ද මේ නීතිය ඒ නිසා අනුමත නොවූ අනෙකුත් සැලසුම් සඳහා විථි සීමා හා ගොඩනැගිලි සීමා සඳහා ලිපියක් පමණක් නිකුත් කරනු ලැබේ. පස්සෙන් දුවන්න ඕන එක ගන්න, දවස් තුනක් යනවා, සල්ලි යනවා එක ගන්න. සැලසුම් අනුමත නොමැතිනම් ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ යුතු බැවින් සීමා හා ගොඩනැගිලි සීමා ගාස්තුවට අමතරව පෙර සැරි ගාස්තුව සහ ප්‍රවාහන ගාස්තුවක් ගෙවිය යුතුය. හොඳම කතාව තමයි ඉඩමට යාබද ප්‍රවේශ මාර්ගවල අවම පලල අඩි දහයක් නැත්නම් අයදුම් පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලබයි. මෙන්න ඔබතුමලාගේ පාලනේ අලුත්ම දේ මේ විනාඩි පහෙන් දෙන වීථි රේඛා සහතිකයට දවස් තුනක් ගන්නවා, හාරදහක් පන්දාහක් ගන්නවා මිනිස්සු අඬනවා. ඔබතුමාලා කරගෙන යන්න ප්‍රශ්නයක් නැහැ කොමසාරිස් පාලන කාලයේදීවත් මේ වගේ කරේ නැහැ. මේ නිලධාරින් කියන විදිහට යන්න එපා, අපි මිනිස්සුන්ට සේවය කරන්නේ මිනිස්සු ගොඩක් දොස් කියනවා මේ සම්බන්ධයෙන්. මේ විථි රේඛාවකින් හොරකමක් කරන්න බැහැ. ඒ නිසා ඔබතුමාගේ ගෞරවනීය මැදිහත් වීම මම බලපොරෙත්තු වෙනවා.

**03(15)** <u>මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් පැමිනිලි අයිතමය යටතේ ඔලිවර් ප්‍රනාන්දු කියලා මහත්මයෙක් එවා ඇති පෙත්සම ඉදිරිපත් කරනවා. 2026 පෙබරවාරි මස 03 වන දින මහා සභා රැස්වීමේදී සමන්ත සිල්වා මන්ත්‍රීවරයාත් මේ කාරණය ඉදිරිපත් කළා. එතුමාගේ ඉඩම් කැබිලි දෙකක් සම්බන්ධයෙන් සාධාරණ විසඳුමක් හැකි ඉක්මනින් ලබාදෙන්න කියලා. ඒ සම්බන්ධ තොරතුරු මෙම ලිපියේ තියෙනවා. මම එම ලිපිය සභාගත කරනවා.

**03(16)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් එම්. ඊ. පෙරේරා මාවත සමඟ ප්‍රධාන පාරට මුහුණලා තිබෙන මෝදර පාරට මුහුණලා තිබෙන ඉඩම අපේ සභාවට පැවරීමක් පසුගිය කාලයේ සිදුවුණා කියන දේ පිළිබඳ අපිත් දැනුවත් වීමක් තිබුණා. මට ආරංචි මේ දිනවල ඒතන බැඩ්මින්ටන් කෝට් එකක් දාන්න අවශ්‍ය තාවකාලික සංවර්ධනය කරනවා. ඒක ඇත්තටම ඒ බැඩ්මින්ටන් කෝට් එකක් දාන්න තරම් සුදුසු ඒකක් නෙමෙයි ඒක. ඊට වඩා වටිනා දෙයක් සභාවට රැස්කරගන්න පුළුවන් තැනක් එතන. කොරළවැල්ල ප්‍රදේශයේ කඩ වීදිය. එම කඩ වීදිය සභාවට ආදායම් මාර්ගයක් හදාගන්න පුළුවන් ගොඩනැගිල්ල නිර්මාණය වෙනවනම් ඒක ඇත්තටම වටිනවා. විශාල ආදායමක් සභාවට ගන්න පුළුවන්. බැට්මින්ටන් කෝට් එකක් දානවානම් ඒකට අදාල ඉඩමක් තියෙනවා තැනුත් තියනවා ඒක සමගම තියෙන කොරලවැල්ල ක්‍රීඩාංගන මාවත ඒ කටයුතු කරන්න පුලුවන්. දෙවෙනි එක තමයි, ආරංචි වුණ ආකාරයට සංවර්ධන කමිටුව හරහා මුදල් යොදවලා ගොඩනැගිල්ලක් ඉදි කරන්නත් සැලැස්මක් තියෙනවා කියලා ආරංචි. කෙසේ වෙතත් ගරු නගරාධිපතිතුමනි, මේ ඉඩම පිළිබඳව සැබෑ අයිතිය අපිට තියෙනවද කියන එක අපි නැවත වතාවක් පරීක්ෂා කළ යුතුයි. ඊයේ පෙරේදා එතනට කාර් එකකින් ඇවිල්ලා ඒ ඉඩමේ අයිති කට්ටිය මේ සංවර්ධන කටයුතු කරනකොට, මොකක්ද මේ කරන්නේ මේ ඉඩම අයිති මට කියලා එතන හිටපු ත්‍රීරෝද රථ රියදුරන්ට සහ එතන හිටපු පිරිසට කියලා ගිහිල්ලා තියෙනවා මේක මගේ ඉඩම මේක කොහොමද අනිත් අය සංවර්ධනය කරන්නේ කියන එක ප්‍රකාශයක් කරලා එක පුද්ගලයෙක් ගිහිල්ලා තියෙනවා. ඒ නිසා අපි රජයේ මුදල් යොදවන්න කලින් අපි නිසියාකාරව සොයලා බලලා කටයුතු කළේ නැතිනම් අපරාදේ මුදල් නාස්තියක් සිද්ධ වෙන්න පුලුවන්. රංගන මන්ත්‍රීතුමත් මනෝජ් මන්තිතුමත් ඒ ප්‍රදේශයේ ඉන්න නිසා විශේෂ අවධානය යොමු කරන්න මොකද මෙවැනි දේවල් සිදුවෙලා පසුගිය කාලේ අනුන්ගේ ඉඩම්වල ගොඩනැගිලි හදන්න ගිහිල්ලා මුදල් නාස්ති වෙච්ච අවස්ථාවල් අපි දැකලා තියෙනවා.

**03(17)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඔසඳ මන්ත්‍රීතුමාගේ ඉදිරිපත් කිරීමට ඉතාමත් මගේ කැමැත්තත් ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මා දන්නා පුද්ගලයෙක්ගේ සැලසුමක් දීලා දැන් මාසෙකටත් වැඩි. එතුමා දැන් පස් හය වතාවක් ආවා ඒ W20 සැලැස්ම මයිකල් ලොකුගේ කියන මහත්මයාගේ සැලැස්ම. එතුමාගෙන් ඉල්ලන ඉල්ලන දේවල් ලබා දීලත් තාම ඒක උන් නෑ කියන එක ඒ කණගාටුව ප්‍රකාශ කරන්න කියලා කිව්වා රස්තියාදු වීම සම්බන්ධයෙන් මයිකල් ලොකුගේ මහත්මා. ලිඛිත ඉල්ලීම් පවා එතුමා දීලා තියෙනවා, ඊට පස්සේ ලෝයර් කෙනෙක්ගේ මාර්ගයෙන් ලිපියක් ඉල්ලා තියෙනවා ඒකත් දීලා තියෙනවා. ඉතින් සමහර තැන්වලදී පොඩ්ඩක් මීට වඩා අවධානය යොමු කරලා කටයුතු කරනවා නම් මේ සැලැස්ම අනුමත කරන්න පුලුවන් සැලැස්මක්. මේක නූලටම කරන්න ගියාම ජනතාවට. ඔසඳ මන්ත්‍රීතුමා කිව්වා වගේ විශාල අපහසුතාවයන්ට මිනිස්සුන්ට මුහුණු දෙන්න සිද්ධ වෙනවා. අපි මිනිස්සුන්ව තාඩන පීඩනයට ලක් කරන තැනැක් නෙමෙයි මේක සේවයක් කරන තැනක් වශයෙන් තමයි සිදුකළ යුත්තේ.

**03(18)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම මම මේ අපේ ඉංජිනේරු මහත්මයාගෙන් ඉල්ලීමක් කළා මීට මාස දෙකකටත් වැඩියි. සභා වාර දෙකක්. මේ සභාව තුළ ඉල්ලීමක් කළේ නැහැ නමුත්, මොරටුව, නව ගාලු පාරේ කඩවීදියේ බුලියන් ජුවෙලස් ඒක ඉස්සරහ පාරේ යන පේමන්ට් එකේ කාණුවට දාන ස්ලැබ් කෑල්ල කැඩිලා. මේකෙදි අනතුරුදායක අවස්ථා ගොඩක් තියෙනවා. නෑ ඒක නගර සභාවට අයිති නැති උනත්, එතුමා කිව්වා RD එකට කියලා තියෙනවා. නමුත් RD එකෙන් ඕවා කෙරෙන්නෑ. ඒක කරනකන් බලන් හිටියොත් මිනිස්සු දෙතුන් දෙනෙක් වැටිලා මිනිස්සු අපහසුතාවයට පත්වෙන්න වෙනවා තුවාල වෙනවා. ඒනිසා අපි සභාවක් වශයෙන් ඔතනට ස්ලැබ් කෑල්ලක් හදලා දාන්න පුළුවන්. ඒ ගැන හොයන්නැතුව අපි ආයේ කතා කරනකම්ම ඉන්නවා. මේකේ අවලාද එන්නේ පාලක පක්ෂයට. ආණ්ඩු බලය තියෙන්නෙත් ඔබතුමාලාට, නගර සභා බලයක් තියෙන්නෙත් ඔබතුමන්ලාට. මම හිතන්නේ වසරකටත් වැඩි ඇති. ඒ වෙනකම් ස්ලැබ් කෑල්ලක් දාගන්න බැරි නම් මොකක්ද ඒ පාලනේ ඇති වටිනාකම කියන එකට ජනතාව කතා කරනවා. අපිටත් මේක කතා කරන්න සිද්ධ වෙනවා. ඒ

නිසා ඒ වැනි පොඩි පොඩි දේවල් ටිකකට විශේෂ වැඩපිළිවෙළක් යොදන්න ගරු නගරාධිපතිතුමනි. ඔබතුමාගේ කාලේ හරි නැත්තම් මේවා සිද්ධ වෙන්නේ නෑ. ඔබතුමාට හැමදාම හොයන්න බෑ. කවුරුහරි කිව්වම ජනතාවට හානි වෙන දෙයක් ගැන නිලධාරී විශේෂ අවධානය යොමු කරන්න කියලා ඔබතුමා කළමණාකරණ කමිටුවෙදි තීන්දුවක් අරන් කරන්න. මොරටුව පුරා දැන් නව ගාලු පාර වගේම, මං කිව්ව බුලියෙන් ජුවෙලස් එක පරණ පාර වගේම නව ගාලු පාරෙත් ගොඩක් තැන්වල පේමන්ට් එක හරහා තියෙන කාණු පද්ධතිවල ස්ලැබ් කැලි කැඩිලා. විශේෂයෙන්ම ලී ලොරි යනකොට පටවනකොට ඒ ස්ලැබ් කැලි කැඩෙනවා. නමුත් මේවා කවදාවත් ආයේ හැදෙන්නේ නෑ. මේක RD එකෙන් කරන්න ඕන වැඩක්. සංවර්ධන කමිටුවෙදි හරි තීරණයක් අරගන්න ඔබතුමන්ලා මේගොල්ලන්ට විශේෂ බලපෑමක් කරන්න. RD එකෙන් මේ ප්‍රදේශයට අදාළ ඒ නිලධාරීන්ට කරන්න තියෙන වැඩ කොටස් ඔවුන් මේ අතපසු කරන්නේ. ඒනිසා ඔබතුමාලගෙත් ඒ ගැන අවධානය යොමුකරන්න කියන ඉල්ලීම කරනවා.

**03(19)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන්ම සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න. මොරටුවැල්ල ක්ලොවිස් මාවත සහ ඒ ප්‍රදේශයන්වල සමහර තැන්වල මොරටුව පුරාමත් තියෙනවා කාණු පද්ධති සුද්ධ වන ප්‍රවණතාවය හරි අඩුයි. උදාහරණ වශයෙන් ගත්තම මොරටුවැල්ල ක්ලොවිස් මාවත ගත්තොත් ඒ ප්‍රදේශයම කානු දහයක් විතර තියෙනවා. මේ කාණු දහය මුහුද දක්වා ගමන් කරන කානු පද්ධති තියෙනවා. මේවා සුද්ධ වෙන්නේ නෑ. එක කාණුවක් සුද්ධ කළාම ඊලග කාණුවට මාසෙකින් වත් එන්නෑ. මදුරුවෝ බෝවෙලා ජරා ජීර්ණ වෙලා විශාල අපහසුතාවයන්ට පත්වෙනවා. මේවට සැලැස්මක්වත් යොදවන්න කියන ඉල්ලීමත් කරනවා. ඒ කාණු පද්ධතිය දුර්ගන්ධ වෙලා. ඒ ප්‍රදේශය පුරාම පුළුවන් නම් ශ්‍රමදානයක් දාලා ඒ ටික සුද්ද කරලා දෙන්න කියන ඉල්ලීමත් කරනවා.

**03(20)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම මාසික මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන්න නගර සභාවට අදාළ මාතෘකා දෙකක් සම්බන්ධයෙන් යෝජනා දෙකක් බාරදුන්නා ඔබතුමාට. ඒකේ පළවෙනි එක තමයි ආදාහනාගාරය මොරටුවේ පදිංචිකරුවෝ වෙනුවෙන් ආදාහනාගාරය නොමිලේ කරන්න කියලා. ගරු නගරාධිපතිතුමා, ඔබතුමා දන්වලා තියෙනවා මට ලියුමක්, ඒ ලියුමේ තියෙනවා මේකේ පිරිවැය මොරටුව මහා නගර සභාවේ ආදාහනාගාරවල මෘතදේහ ආදාහනය කිරීම සඳහා දැනට අයකරන ගාස්තුව ඉතා අවම මුදලක් වන බැවින් හා ඒ සඳහා වන පිරිවැය ආවරණය වීමක් හෝ එම ගාස්තුව තුලින් සිදුනොවන බැවින්ද වාර්ෂික ඇස්තමේන්තුව යටතේ ඉහත ආදායම 2026 වර්ෂයේ අයවැය ලේඛනයට ඇතුළත් කර ඇති බැවින් එම යෝජනාව මේ අවස්ථාවේ සලකා බැලීමට නොහැකි වීම කියලා මට ලියුමක් එවලා තියනවා නාගරික ලේකම් අත්සන් කරලා. ගරු නගරාධිපතිතුමා මේක මම බජට් එකේ බැලුවා, බජට් එකේ මේ සෑම ආදාහනාගාරයකින්ම මොරටුවේ තියෙන අවුරුද්දටම අපිට ලැබෙන්නේ ලක්ෂ තිස්දෙකයි කියලා ඇස්තමේන්තු කරලා තියෙනවා. මේ ලක්ෂ තිස් දෙකක් කියල කියන්නේ නගර සභාව ගත්තහම නොසලකා හැරිය යුතු ගානක් හැටියට තමයි අපි දකින්නේ. මොකද අපේ මොරටුව මහා නගර සභාව කියලා කියන්නේ විශාල ආදායමක් තියෙන නගර සභාවක්, ඒනිසා දැන් කොළඹ මහා නගර සභාවේ ඔය ගාන ගත්තොත් එහෙම ඔයිට වඩා දහදොළොස් ගුණයකින් වැඩි ගාණක් තමයි කොළඹ මහා නගර සභාවේ තියෙන්නේ. ඒහේ තියෙන්නෙත් ඔබතුමාගේ පාලනයක්. කොළඹ මහා නගර සභාවේ නගරාධිපතිවරිය මුළු කොළඹ ඉන්න කොට්ඨාශ පහේම ජනතාව වෙනුවෙන් ඒක ෆ්‍රීකලා. එතකොට ඒක කළේ බජට් එකෙන් පස්සේ. බජට් එක ඉදිරිපත් කරලා බජට් එක පැරදිලා ආපහු බජට් එක දිනලා. බජට් එකේ සඳහන් වෙලා තිබුනේ නැහැ. හැබැයි ඒකත් මන්ත්‍රීවරු යෝජනාවක් ගෙනල්ලා ඒකමතිකව සම්මත කරලා තමයි ඒ වැඩේ කළේ. මේක ශ්‍රී ලංකා කාරයෝ මැරුණම ෆ්‍රී කරන්නවත්, යූ.එන්.පී.කාරයෝ මැරුණම ෆ්‍රී කරන්නවත්, පොහොට්ටු කාරයෝ මැරුණම ෆ්‍රී කරන්නවත් නෙවෙයි අපි කිව්වේ. අපි කිව්වේ මොරටු ජනතාව වෙනුවෙන් මේක ෆ්‍රී කරන්න කියලා. මොකද හේතුව ඒ මරණයක් සිදුවන වෙලාවක ඒ රුපියල් හයදහ අපි දැන් නිකන් බැලුවහම රුපියල් හයදහ නිකන් නොසලකා හැරියුතු ගානක් වගේ තමයි පේන්නේ. හැබැයි රුපියල් හයදහත් ඉතාමත් වටිනවා මරණයක් වෙච්ච වෙලාවකට බොහෝ දෙනෙකුට. ඒ තරම් අසරණ වෙනවා.

ඒනිසා මේ යෝජනාව ප්‍රතික්ෂේප කිරීම, අනිත් එක තමයි මේක නගර සභාවට අදාල යෝජනාවක්, මේක පරිපාලනයට අදාළ යෝජනාවක්, මේක සාමාන්‍යයෙන් ප්‍රතික්ෂේප කරන්න පුළුවන් වෙන්නේ ඔබතුමාට මේ විෂය පථයට අදාළ නොවන යෝජනාවක්, මේ විෂය පථයට අදාළ නොවන යෝජනාවක් නෙවෙයි මේක විෂය පථයට අදාළ වන යෝජනාවක්. මොරටු ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරපු යෝජනාවක්. ඒනිසා මේක ප්‍රතික්ෂේප කිරීමම නීත්‍යානුකූල නෑ. ඒනිසා මේක ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අපි අපගේ විරෝධතාවය ප්‍රකාශ කරනවා. මේ ගැන සාකච්ඡා කරලා, මේක අපි තීන්දුවක් ගන්න තිබ්බත් කමක් නෑ, මේක දාලා සාකච්ඡා කරන්න තිබ්බා. එහෙම තැනකට වත් ඔබතුමා ඇවිල්ලා නෑ මේක ප්‍රතික්ෂේප කරලා.ඒ කියන්නේ අපි ජනතාව වෙනුවෙන් ඉදිරිපත් කරන යෝජනාවක්වත් න්‍යාය පත්‍රයටවත් ගන්නැතුව ප්‍රතික්ෂේප කරන තැනට ඔබතුමා පත්වෙලා තියෙනවා.

**03(21)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම යෝජනාවක් දැම්මා සේවක මාරුවීම් සම්බන්ධයෙන්. අද වෙනකොට නෙමෙයි සෑම පාලනයක් යටතේම මේ සේවක මාරුවීම් ඉතාමත්ම අසාධාරණ විදිහට සිද්ධ වෙනවා. ඒ නිසා අඩුම තරමින් මේක ඉදිරියේදී හරි ක්‍රමවත්ව සිදු කරන්න. ඒ කියන්නේ නගරාධිපතිවරයත් එක්ක තරහ වුණාම, මන්ත්‍රීවරයෙක් එක්ක සේවකයෙක් ප්‍රශ්නයක් ඇති කරගත්තහම සේවක මාරුවෙන් සිදුවෙනවා. උදාහරණයක් ද සොයිසා ක්‍රීඩා පිටියේ ඉන්න සේවයකින් දෙන්නෙක් මාරු කළා. එක සේවකයෙක් මාරු කරන්න හේතුව මොකක්ද කියල බැලුවහම එතන අසළ තියෙන අඹ ලෑල්ලට ගිහිල්ලා අඹ ගෙඩියක් කාලා ඒ අඹ ලෑල්ල කරන අපේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා ඒ මන්ත්‍රීවරයත් එක්ක කතා කිරීම තමයි වරද. ඒ නිසා තමයි මාරු කරේ කියලා කියලා තියෙන්නේ.අද ඒ තත්ත්වයට ඔබතුමාගේ පාලනය පත්වෙලා. අනිත් ඒක තමයි සේවක මාරුවීම් දැඩි ලෙස පළිගැනීම් ස්වභාවයකට පත්වෙලා තියෙනවා. දැන් මේකේ බොහොම ලස්සන වචනයක් සඳහන් කරලා තියෙනවා. සභා කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර අනුයුක්ත කිරීම් සිදුකිරීම සේවා අවශ්‍යතාවය මත හා පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවලට විධිවිධාන යටතේ සිදුකරනු ලබන පරිපාලන ක්‍රියාවක් බැවින් එම යෝජනාවේ දැක්වෙන කරුණු ඉටුකල නොහැකිවීම. අපි මොකක්ද කළේ යෝජනාව සේවක මාරුවීමක් තියනවනම් ඒක ආයතන කමිටුවට එවන්න. ආයතන කමිටුවට ඇවිල්ලා ආයතන කමිටුවේ සාකච්ඡා කරලා මේ මාරුවීම් විනිවිදභාවයෙන් කරන්න. විනිවිදභාවයකින් යුක්තව ඒ මාරුවීම් කරන්න කියලා කිව්වහම මේක තනිකර ඒකාධිපතිත්වයට යන මාර්ගයක් ඔස්සේ මේ කරන්න ඕනි නිසා ඔබතුමාලගේ පාලනය නෙමෙයි දැන් ඊළඟට එන පාලනයෙත් ඕක වෙන්න පුලුවන්. ඒනිසා අපි කියන්නේ මේ සේවකයන්ට ගහන එක කොහෙන් හරි නවතින්න. මේ සේවකයන්ගෙන් පළිගන්න එක කොහෙන් හරි නවතින්න ඕනේ. සේවකයෝ අවුරුදු දොළහ දහතුන ලිපි ලේඛන වැඩ කරලා තියෙන සේවකයන්ව දානවා අතුගාන්න. එක පාරටම අතුගාන්න. ඇයි ඒ සේවාව අවශ්‍යතාවයට. ලිපි ලේඛන වැඩ කරන සේවකයව අතුගාන දාන්න මොකක්ද තියෙන සේවා අවශ්‍යතාවය , මේ සේවා අවශ්‍යතාවය කියන එක අර්ථ නිරූපනය කරගන්නේ කොහොමද, කවුද මේ සේවා අවශ්‍යාවය කියන ඒක අර්ථ නිරූපනය කරන්නේ. ඒ නිසා කාට හරි ප්‍රශ්නයක් පත්වීමට අනුව කරනවනම් මේ සියලු දෙනාට එක හැන්දෙන් බෙදන්න ඕනා. එහෙම නැතුව තමන්ට විරුද්ධව කතා කළා, තමන්ට විරුද්ධව ඉන්න මිනිස්සුන්ව විතරක් සේවා අවශ්‍යතාව මත යවන්න බෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රශ්ණයක් මට තියෙනවා. කරුණාකරලා මේ සේවක ගැටලු පෙත්සම් යටතේ කතා කරන එක සාධාරණ නැහැ. ආයතන කමිටුව තියෙනවා. මොකද මේ පාලක කණ්ඩායම විදිහට අපිට අවස්ථාව නැහැ මේවට උත්තර දෙන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ ගැන සාකච්ඡා කරන්න තමයි අපි මේ යෝජනාව දැම්මේ. ඔබතුමා මේ යෝජනාව ප්‍රතික්ෂේප කරලා තියෙනවා. අඩුම තරමේ සේවකයන් ගැන මේ සභාවේ කථා කරන්න තියෙන අවස්ථාවක් පවා ඔබතුමා මගහැරලා තියෙනවා. ඒ නිසා මේක මේ පානයේ විතරක් නෙමෙයි මේ යෝජනාව වටින්නේ පාලක කණ්ඩායම් විදිහට අපිට අවස්ථාව නැහැ මේවට උත්තර දෙන්න. මේ

පාලනයේ විතරක් නෙමෙයි මේ යෝජනාව වටින්නේ මේ ඉදිරියේදී එන පාලන තන්ත්‍රයන් වලට පවා මේ යෝජනාව වටිනවා. කලිනුත් ඒ දේ වුණා කියන එක දැනගෙන තමයි ඒක දාන්නේ. කලිනුත් වුනා, දැනුත් වෙනවා, ඉදිරියේදිත් වෙනවා. ඒ වෙන එක නවත්තන්න

**සභා ඝෝෂා**

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, ඔබ හොඳ අත්දැකීම් තියෙන මන්ත්‍රීවරයෙක්, ඔබට ප්‍රශ්ණ ගැටලු පෙත්සම් ඉදිරිපත් කරන්න පුළුවන්.කිසි ගැටලුවක් නැහැ, ඔබතුමාට ඒ අයිතිය තියෙනවා. හැබැයි ඔබ දන්නවා පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ ඉදිරිපත් කළ යුතු ස්වභාවය ස්වරූපය. එතකොට ඒක බිඳගෙන දැන් මේ යනවා. ඒ නිසා මම ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා ඔබ කියන බොහෝ කරුණු ඔබ කියන්න. ඒක ඔබේ අයිතිය. ඒ කියනකොට ඔබ හොඳින් අනුගමනය කරන්න අර පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ අපිට තියෙන ඒ ප්‍රතිපාදන වලට අනුගත වෙලා ඉදිරිපත් කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, බොහොම ස්තුතියි. හැබැයි ඔබතුමා කියපු එක මම පිලිගන්නවා. තර්කයක් නැහැ. මුලසුනට අපි එකඟයි. පිලිගන්නවා. හැබැයි ඒක ඔබතුමා මට කියනකොට ඔබතුමා ඔබතුමාගේ පැත්තෙ උදවියටත් කියන්න ඕනේ මේ පෙස්සම් පැමිණිලි ඉදිරිපත් කරන කොට බාධා කරන්න බැහැ. ඒක කියන්න. එතකොට මේක අපි බොහෝම සංයමයෙන් ඉදිරිපත් කරනකොට ඒ බාධ කිරීම් ආවම තමයි නගරාධිපතිතුමා මේ සංයමය බිඳෙන්නේ. ඒ නිසා නගරාධිපතිතුමා මේ සේවකයෝ කියලා කියන්නේ අර කැලේ ඉන්න කොටියට කොටියත් එක්ක ප්‍රශ්නයක් ඇතිකරගෙන කැලේ ඉන්න කොටියත් එක්ක තියෙන තරහට ගෙදර තියෙන කොටි හමට තලනවා වගේ පලිගැනීම් මේ සේවකයන්ගෙන් සිදුවෙනවා. සේවකයො අපි මේ සේවකයෝ ගත්තොත් මොරටුව මහ නගර සභාවේ සේවකයෝ ඉන්නවා එකසිය ගානක් වැඩ ක්ෂේත්‍ර කම්කරු සහ සෞඛ්‍ය කම්කරු සේවකයෝ ඉන්නවා. හැබැයි ඒ ඇවිල්ලා තියෙන්නේ බොහෝ අවස්ථාවල ඒ සේවකයෝ කාර්යාලවල විවිධ කාර්යයන්වල නිරත වෙනවා. ඒ කියන්නේ ඒ සේවකයෝ හරහා විශාල කාර්යභාරයක් සිද්ධ වෙනවා. කළමනාකරණ සහකාරවරුන්ගේ කාර්යභාරයක් විශාල කාර්යභාරයක් ඒ සේවකයන් හරහා සිද්ධ වෙනවා. ඒ සේවයන්ට ගෙවන්නේ කම්කරු වැටුප හැබැයි කම්කරු වැටුප ගෙව්වට ඒ සේවකයෝ විශාල කාර්යභාරයක් කළමණාකරණ සහකාරවරු එක්කෙනෙක්ගේ නෙමෙයි තුන් හතර දෙනෙක්ගෙ කාර්යභාරයක් සමහර වෙලාවට විෂයන් තුන හතරක් කවර් කරන සේවකයෝ මේ නගර සභාව තුළ ඉන්නවා. ඉතින් ඒක නිසා එහෙම අවුරුදු දොළහ දහතුන වැඩ කරන සේවකයන් ගරු නගරාධිපතිතුමා එක පාරටම අල්ලලා උඹ ගිහිල්ලා අතුගාපන් කියලා දාන එක කොච්චර දුරට සදාචාර සම්පන්නද කියන එක පිළිබඳව ඔබතුමා හිතන්න. ඒ වගේ දිගින් දිගටම මේ අසාධාරණකම් සිද්ධ වෙනවා. ඒ අසාධාරණකම් කොහෙන් හරි නවතින්න ඕන. අතුගාන්නයි තව තව දේවල් කරන්නයි දාලා ඊට පස්සේ ඒ නිකන් ඉන්නෙත් නෑ තව තව ලියුම් ගහනවා. තව තව පළිගැනීම් කරනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමා අපි කියන්නේ මේ සේවක පළිගැනීම් කරුණාකරලා නවත්වන්න. ඒක කවුද කරන්නේ කියන එක අදාල නැහැ. ඒක නිශාන්ත ප්‍රදින්නාන්දු ද කරන්නේ, ඒක සමන්ලාල් ප්‍රනාන්දු හිටපු නගරාධිපතිවරය ද කළේ, ඒක රවිනාත් ගුණසේකර හිටපු නගරාධිපතිවරයා ද කළේ , ඒක ඒ.ටී.කේ. චන්ද්‍රදාස මහත්තයද කළේ, ඒක ආනන්ද කුසුම්සිරි හිටපු නගරාධිපතිවරයද කළේ, ඒවා අදාළ නෑ. කවුරු කරත් මේ කරපු දේ වැරදියි. ඒ නිසා මේකට මොන ක්‍රමයෙන් හරි තිත තියන්න ඕනේ. ඒ නිසා ඔබතුමාලගේ පාලනය ගැන මිනිස්සු ඔබතුමාලගේ පාලනය ගෙනාවේ ඒගොල්ලෝ කරපු දේවල් කරන්න නෙමෙයි. දැන් හැබැයි වෙන්නේ ඒගොල්ලේ කරපු දේවල් තමයි මේ සිදුවෙමින් පවතින්නේ. ඒනිසා අපි යෝජනා කරනවා අපි මේ සභාවට මේ යෝජනාව ගේන්න ප්‍රධාන හේතුව වුනේ මේ සභාවේ ඉන්න ඒ අහිංසක සේවක මහත් මහත්මීන්ව ආරක්ෂා කරන්න. ඒ නිසා අපි බොහොම ඕනෑකමින් කියනවා මේ නගර සභාවේ ඒ අසාධාරණකම් වලට නිශාන්ත ප්‍රදිනාන්දුගේ පාලනය ඉඩ දෙන්න එපා. ඒක මහා පහත් වැඩක්. ඒ නිසා අඩුම තරමින් ඔබතුමා මේ යෝජනාව ගේන්න දුන්නනම් අපි මීට වඩා කරුණු කාරණා මීට වඩා සාධනීය කරුණු අපි ඉදිරිපත් කරන්න සූදානමින් හිටියා. හැබැයි අපෙන් ඒ

අවස්ථාව ගිලිහිලා ගියා. අපි බොහො ගෞරවයෙන් ඉල්ලනවා ඔබතුමාගෙන් මේ සේවක මාරුවීම්, මේ සේවක මාරු කිරීම් වහාම නවත්තන්න. එහෙම මාරු කරන්න ඕන නම් එහෙම සේවා අවශ්‍යතාවයක් තියෙනවා නම් සේවා අවශ්‍යතාවය කියන එක අර්ථ නිරූපණය කරගන්න. මෙතන ඔෆිස් ඒහෙක වැඩක් කරගෙන ඉන්න කෙනෙක්ව සේවා අවශ්‍යතාවය කියලා කියන්නේ නගරාධිපතිතුමා තව තැනක කොහේ හරි ඒ ඔහු කරන රාජකාරිය කොහේ හරි තැනක හිස් වෙලා තියෙනවා නම් අන්න ටක් ගාලා එතනට දාලා සේවයේ අවශ්‍යතාවය. අපි ඒක පිළිගන්නවා. අපිට සේවක අභ්‍යන්තර මාරුවීම් සම්බන්ධය මැදිහත්වීමට අවශ්‍යතාවයක් නැහැ. අභ්‍යන්තර මාරුවීම් සිදුවෙන වෙලාවල් තියෙනවා. ඒක ප්‍රශ්ණයක් නැහැ. හැබැයි මේ අභ්‍යන්තර මාරුවීම් කරන්නේ, දැන් මේ අභ්‍යන්තර මාරුවීම් කරන්නේ අඹ ගෙඩිය කැවා කියලා. මේ කරන අභ්‍යන්තර මාරුවීම් සාධාචාර සම්පන්න නැහැ.

සභා ඝෝෂා

**03(22)** <u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෝල්පේ සොයිසා පාර ගිහිල්ලා අන්තිමට පිළියන්දල පාරට වැටෙන තැන ඉන්න මහත්තයෙක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ මහත්තයා ලංකාවේ ක්‍රිකට් කණ්ඩායමේ ඕපනින් බැස්මන්ට් කෙනෙක්. විකට් කීප කෙනෙක් හිටපු අමල් සිල්වා මහත්තයා, හොඳ මනුස්සයෙක්, හොඳ ක්‍රීඩකයෙක්. ලෝඩ්ස් වලත් සෙන්චරියක් ගහපු එක්කෙනෙක්. ඉතින් එයාගේ ගෙදරට, එතන පාර උස්සලා දෙපැත්ත ඉඩම් පුරෝලා හින්දා ඒ වතුර ටික දැන් ඔක්කොම බැහැලා යන්න එයාගේ ගෙදරින්ලු. සහ ඉස්සරහා තර්ට්ලේන් එක කියල පාරෙනුත් ඒක  වතුර ටික වෙන යන්න තැනක් නැහැ එයාගේ වත්තේ ඇතුලෙන් තමයි යන්නේ. ඉතින් ඒකට සබ් මැසිකල් පම්ප් එකක් දාගෙන එයා හැමදාම පම්ප් කරනවා හැබැයි වුනාට මොන හරි කරන්ට් පිලින් ඒකක් වුනොත් ඔක්කොම වතුර ටික ගේ ඇතුලෙලු. ඉතින් මම ඒක ඉදිරිපත් කරනවා ගරු නගරාධිපතිතුමා ඔබතුමාගේ අවධානයට යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**03(23)** <u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එම්. ජේ. සී. ප්‍රනාන්දු මාවත මස්කඩේ පාර කියලා කියන්නේ අපි හැමෝම දැන් ඔය මස්කඩේ පාරේ එන වතුර තමයි හැමදාම කුරුස හන්දිය පිරෙන්නේ. මස්කඩේ පාරෙන් විශාල වතුරක් එනවා වහින දවසට ඒක ඇවිල්ලා තමයි කුරුසන්දි පිරෙන්නේ. මොකද ඒ වතුර එන්නේ කානුවට යන්න බැරුව, කානුවට යන්න බැරි හින්දා එතන වෙලා තියෙන්නේ එම්. ජේ. සී. ප්‍රනාන්දු මාවතේ තියෙන කාණුවේ බැම්ම කැඩිලා පස් ටික ඔක්කොම කාණුවට වැටිලා. ඒක උඩ තිබුණු කොන්ක්‍රීට් කැල්ලත් කාණුවට වැටිලා. වතුර ටික ඔක්කොම පාරට එන්නේ ඉතින් වැහිවෙලාවකදී මෙය දහපහළොස් ගුණයකින් වැඩිවෙලා වතුර එන්නේ ඔක්කොම ගාලු පාරට. ගාලු පාර පිරෙනවා. එතකොට තමයි අපිට සුද්ද කරන්න වෙන්නේ ඔක්කොම. මන් හිතන්නේ ඒක විසඳගන්න පුළුවන් මේ කාණුව පොඩි කැල්ලක් අඩි හතරක විතර කැල්ලක්. ඒ කානුවේ බැම්ම හදලා උඩ කොන්ක්‍රීට් කැල්ල දැම්මා නම් මම හිතන්නේ ඒ වතුර ඇවිල්ලා වෙන ප්‍රෙෂර් එක ගොඩක් අඩු කරගන්න පුළුවන් එතනින්.

ගරු නගරාධිපතිතුමනි, පොඩි කාරුණික ආයාචනයක් කරන්න ඕන, දැන් දෙපාරක් විතර වගේ කොමසාරිස්තුමියටත් කිව්වා, ලේකම්තුමාටත් කිව්වා මේකට මොකක් හරි කරන්න කියලා. ගියපාර සභාවෙත් මම ඉල්ලුවා. මේකනේ හරි ග්ලෙයාර් එකක් එනවා, මේ අව්ව වෙලාවට, ඉතින් පොඩ්ඩක් කාරුණික සලකා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(24)** <u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, අපේ පශු වෛද්‍යවරිය අද මට උදේ දුන්න මේ දුන්න ලීෆ්ලට් එක ජලභීතිකා එන්නත සම්බන්ධව. හැබැයි එතුමියගේ මේ කාර්යභාරය ඉතාම අගය කළ යුතුයි මේක බොහොම ඕගනයිස් විදියට සාමාන්‍යයෙන් කෝප්රේට් මට්ටමේ තියෙන දෙයක්, එකේ ඩේ චාට් එකත් දාලා හදලා දීලා තියෙනවා. මේ වගේ කාර්යභාරයක් හැම නිලධාරියෙක්ගෙන්ම කරනවානම්, අපේ මේ මහා නගර සභාව මීට වඩා ඉහළ තැනකට ගෙනියන්න පුලුවන් කියලා මම යෝජනා කරනවා.

**03(25)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන පෙත්සම් පැමිණිලි යටතේ විශේෂයෙන් ස්තුතියක් කරන්න තිබෙනවා, ඔබ සියලු දෙනා දන්නවා අපේ මාධ්‍යවේදනිය නගර සභාව වසර දහයක කාලයක් වාර්තා කරපු රේඛා තරංගනී ෆොන්සේකා මහත්මිය මේ වන විට හෘදයා බාධයකින් දැඩි ලෙස රෝගාතුර වෙලා ඉන්නේ. ඒ සම්බන්ධයෙන් ඇය මාවත ලිඛිත එවා තිබෙනවා. විශේෂයෙන්ම නගරාධිපතිතුමා සහ උප නගරාධිපතිතුමිය ඒ වගේම විපක්ෂ නායකතුමා ආණ්ඩු පක්ෂයේ සියලු මන්ත්‍රීවරු සහ විපක්ෂයේ සියලු මන්ත්‍රිවරු, කොමසාරිස්තුමිය සහ නාගරික ලේකම්තුමා ඇතුළු අදාළ කාර්ය මණ්ඩලයට ඇයගේ විශේෂ ස්තුතිය පුද කරලා තිබෙනවා. නගර සභාවේ අරමුදල මගින් ඇයට ලබාදීලා තිබෙන අදාළ ආධාර මුදල් ලැබීම සම්න්ධයෙන් මොකද ඇයට අත්‍යවශ්‍යම අවස්ථාවේ තමයි නගර සභාවේ සත්කාරය කරලා තිබෙන්නේ. අපි හැමදෙනාම වගේම හිතට ගන්න ඕන කාරණයක්, බොහොම සංවේදී කාරණයක් ඇය ලිපිය පටන් ගන්නකොට ලියලා තියෙනවා. ඒ ලිපියේ ඒ කොටස පමණක් කියවන්න අවසර ඉල්ලනවා. මියගිය පසු විනාඩියක නිශ්ශබ්දතාවක් පවත්වනවාට වඩා වැඩියමක් මා ජීවත්ව සිටියදි මට අවශ්‍ය මොහොතේ සිදු කළ ඔබ සැමගේ මනුස්සකමට මාගේ ගෞරවනීය ස්තුතිය පළ කරනවා. ඇත්තටම අපි ජීවත් වෙලා ඉන්නකොට ආදරය කරන්න ඕන, ජීවත් වෙලා ඉන්නකොට රැකගන්න ඕන. මියගියාට පස්සේ භූමිදානය කරන්න ඕන, වලදාන්න ඕන. ඒ නිසා ඇගේ කාරණය ඉතාම වැදගත්, මොකද මේ මා කතා කරන මොහොතෙත් සමහර වෙලාවට ඊළඟ සභා වාරය වෙනකන් හෝ ඇයගේ ජීවිතය අවධානම් තත්ත්වයක තිබෙන්නේ. විශේෂයෙන්ම නගරාධිපතිතුමා ඇතුළු මා පෙර කී සියලු දෙනාට ඇයට අවශ්‍යම මොහොතේ ඒ අදාළ උදව්ව කිරීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කරනවා.

**03(26)** <u>මහා නගර සභා මන්ත්‍රී - ජේ. සෙනවිරත්න මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඉතාම කෙටියෙන් දෙනවා, විල්ලෝරාවත්ත බටහිර, දේවානන්ද පාරේ නිවාස කිහිපයක වැසි ජලය බැසයාම සම්බන්ධයෙන් ආයාචනයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ කාණුව පොඩ්ඩක් කැඩිලා තියෙන්නේ, මමත් ගිහිල්ලා බැලුවා. ගමේ ඉල්ලීම සලකා බලන ලෙස. මෙම ලිපිය සභාගත කරනවා.

**03(27)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ දවස්වල ලංකාවේ තෙල් පෝලම වගේ මාස තුනක් තිස්සේ ධීවර නිවහන් පෙදෙසේ වතුර පෝලිම. 2026 වර්ෂයේ මම හිතන්නේ ජනවාරි මාසයේ ඉඳන් ධීවර නිවහන් පෙදෙසේ ජනතාවට වතුර එන්නේ නැහැ. උදේ ඉඳන් රාත්‍රිය වෙනතුරු වතුර නැහැ. ඒ වගේම තමයි ගරු නගරාධිපතිතුමනි, පාන්දරට එන්නේ ඒකත් අඩු පීඩනයකින් තමයි එන්නේ. ඉතින් නගරාධිපතිතුමා, ඒ ධීවරනිවහන් පෙදෙසේ ජනතාව 2026 වර්ෂයේ ජනවාරි මාස හය වෙනිදා ලිපියක් බාර දීලා තියෙනවා ජල සම්පාදනයට. එතනින් නගර සභාවට ඒ ලිපිය යොමුකරලා තියෙනවා. මම ඔබතුමාට ඉල්ලීමක් කරනවා මේ සඳහා අවශ්‍ය මැදිහත්වීම නගර සභාවක් විදියට කරන්න කියලා.

**03(28)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, නගර සභාවට ස්තුතිවන්ත වෙනවා, කාලයක් පුරාවට අපි විපක්ෂයක් විදියටත් නගර සභාව තුළ හඩ නැගුවා, කොරළවැල්ල ටකරන් දෙවට මාර්ගය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. ඒවගේම තමයි නගරාධිපතිතුමා ඒ සංවර්ධනය කරලා තියෙන්නෙත් භාගෙට, තවත් මීටර් පනහක් හැත්ත පහක් විතර ප්‍රමාණයක් ගල් අල්ලන්න තියෙනවා. අර භාගෙට ගල් අල්ලපු නිසාම වර්ෂාවකදී ඉතුරු ප්‍රමාණය සංවර්ධනය නොවිච්ච ප්‍රමාණය වර්ෂාවෙන් යටවෙනවා සහ ඒ අවට නිවෙස් වලටත් වතුර දානවා ඉතින් නගරාධිපතිතුමා මම බැලුවා ඔබතුමන්ලගේ 2026 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මේ කොරළවැල්ල බටහිර කොට්ඨාසයට සංවර්ධන යෝජනා කිහිපයක්ම දාලා තිබ්බත් මේ ටකරන් දෙවට ගැන සඳහන් කිරීමක් කරලා නැහැ ඉතින් මම යෝජනා කරනවා නගරාධිපතිතුමනි, අලුතෙන් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කරන්නට කලින් භාගෙට නවත්තපු සංවර්ධන වැඩසටහන් ඉවර කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(29)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ප්‍රමාද වෙලා හරි ස්තූති කරන්න අවශ්‍යයි ජනවාරි 20 මොරටුව ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මංගල්‍ය තිබුණා. ඒ මංගල්‍ය වෙනුවෙන් සෞඛ්‍ය අංශයේ සේවකයන්, සේවක මහත්මීන් ඒ මංගල්‍යයන පෙරහර ශුද්ධ පවිත්‍ර කරලා සකස් කරලා ලබා දුන්නා. ඒ අවශ්‍ය දේවල් කරලා ලබා දුන්නා මංගල්‍යය ගමන් කරන්න. ඒ වගේම තමයි කුහකකමකින් තොරව මම විශේෂ ස්තූතියක් පුද කරනවා එන්පීපී ජනතා විමුක්ති පෙරමුණේ නාගරික මන්ත්‍රීවරුන්ට අපි දැක්කා මොරටුව ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ මංගල්‍ය වෙනුවෙන් එතුමන්ලා එතුමන්ලගේ ශ්‍රමදායකත්වය ලබාදෙනවා. හැබැයි නගරාධිපතිතුමා මම ඒ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාව ඉදිබැද්ද බ්ලාසියුස් පල්ලියේ මංගල්‍යයේදි දැක්කේ නැහැ. ඉදිරියෙදිත් නගරාධිපතිතුමා මංගල්‍ය එනවා කොරළවැල්ල, උයන, කටුකරුන්ද, ලුනාව, අගුලාන, කටුබැද්ද, විල්ලෝරාවත්ත, කඩලාන වගේ. ඒ දේවල් වලදිත් පාට බලන්නේ නැතුව ඔබතුමන්ලාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(30)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අඟුලාන මහජන මාවතේ කානු පද්ධතියේ වතුර බැස යන්නේ නෑ ඒ ගැන අසල්වැසි ජයන්ත අමරසිරි මහත්මයා ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා එය සභාගත කරනවා.

**03(31)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් පැමිණිලි අයිතමය යටතේ සංදේශයක් ඔබතුමාට භාරදෙන්න සූදානම, ඒ සම්බන්ධයෙන් අදහසකුත් පල කරලා. මොරටුව ලුනාව සීවී රෙසිඩන්ස් නිවාස සංකීර්ණයේ පහුගිය කාල සීමාව තුළම වරක් දෙපාරක් නෙමේ තුන් වරක් විතර තක්සේරු දැන්වීම් ලබාදීම සඳහා අපේ තක්සේරු දැන්වීම් නිලධාරීතුමා කමල්සිරි මහත්තයා ආවා. ඒ අවස්ථාවේදී ගරු නගරාධිපතිතුමනි, මම එතුමාගෙනුත් ඒ වගේම අදාල නගර සභාවේ ඒ අදාළ නිලධාරී මහත්ම මහත්මීගෙනුත් විමසුවා මේ තක්සේරු දන්වීම්වල අයිතිකරු ලෙස එහෙම නැත්තම් මේ වරිපනම් කොළයේ අයිතිකරු ලෙස සඳහන් වෙන්නේ කවුද කියලා. එහිදී පැහැදිලිව ඔවුන් ප්‍රකාශ කළා අයිතිකරු විදිහට සඳහන් වෙන්නේ මහා නගර සභාව කියලා. එතකොට අපේ නිවාස සංකීර්ණයේ කිසිවකු අතිශය බහුතරයක් සමහරු නොදන්නවා දන්න අය නගර සභාව අයිතිකරු කියන එක පිළිගන්න සූදානම් නැහැ. නිවාස සංකීරණයේ ඉඩම ප්‍රශ්නය වෙන එකක් නමුත් වරිපනම් දීමේදි ගරු නගරාධිපතිතුමනි, අයිතිකරු මහා නගර සභාව වූ විට අයිතිකරු අනවසර පදිංචිකරුවකු ලෙස පරිවර්තනය වීම නිරායාසයෙන් සිද්ධ වෙනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි මම සංදේශය යටතේ ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ කාරණාව නිරාකරණය කරන්න. ඒ ලේඛනයේ අයිතිකරු කියන කොටසේ මහා නගර සභාව වෙනුවට ඒ අදාළ නිවැසියන්ගේ නම සඳහන් වන ඒ කාරණාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න. මොකද අපි එතකම් භාරගත්තේ නැහැ කිසිකෙනෙක් මේ තක්සේරු දැන්වීම. ඒ අපි හැමෝම කැමතියි වරිපනම් ගෙවන්න මේ නගර සභාවට නමුත් මේ තියෙන තාක්ෂණික දෝෂය මගහරවා ගන්න නගර සභාවේ ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් ඒ අදාළ නිලධාරීන් සහ අපේ නිවාස සංකීර්ණයේ අදාළ නිවැසියන් කොටසක් එක්ක සාකච්ඡාවක් සඳහා අවස්ථාව ලබා දෙන ලෙස මම ඉතාමත් ඕනකමින් ඉල්ලා සිටිනවා.

**03(32)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වාචිකව කාරණාවක් තියෙනවා ඉදිරිපත් කරන්න සමන්ත මන්ත්‍රීතුමා වෙන පැත්තකින් කිව්වා මම ඔබතුමාටත් ඒවගේම මේ සභාවේ පෙත්සම් පැමිණිලි අයිතම යටතෙත් ඉදිරිපත් කරලා තිබ්බා. ඔබතුමාටත් මම ඒ කාරණා ඉදිරිපත් කරා . ලුණාව මංසන්ධිය අසල තියෙන සීවී රෙසිඩන්ස් නිවාස සංකීර්ණ ඉදිරිපිට ශාන්ත සෙබස්තියන් උයන පාරේ ඉතාමත් භයානක වලක්, ඒ වලේ විශාල ස්ලැබ් එකක් දාලා තියෙනවා, එක උස්සන්න බැහැ හරි බරයි. ඒ නිසා ඒ ස්ලැබ් එක අයින් කරලා සැහැල්ලු ස්ලැබ් කැට දෙකක් යොදන්න කියලා ඉල්ලීමක් කළා. ඔබතුමා ඊට පහුවෙනිදම ඒක යොමු කරල තිබ්බා අදාළ ඉංජිනේරු දෙපාර්තමේන්තුවට. කලිනුත් කතා කළා, ඉංජිනේරු දෙපාර්තමේන්තුවෙන් ඇහුවම අපේ ඉංජිනේතුමා එතුමා කියනවා ඍජු ශ්‍රමයෙන් ස්ලැබ් කැට දෙකක්

දාන්න කෙනෙක් නැහැ. සමන්ත මන්ත්‍රීතුමාගේ කාරණාව තිබ්බෙත් ඕක. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මෙතන වගකීම තියෙන්නේ අදාළ ඉංජිනේරුතුමා වුනාට මෙතනදි යම් අනතුරක් වුනොත් ගරු නගරාධිපතිතුමනි, ඊයේ පාන්දර පහට මාරාන්තික රිය අනතුරක් සිදුවුණා ඔය මංසන්ධියේ. බස් රථයක් සහ යතුරුපැදිකරුවෙක්. ඉතාමත් මාරාන්තික රිය අනතුරක්. එතන හරි පටුයි ගරු නගරාධිපතිතුමනි. ඒ මංසන්ධිය වාහනවලින් හැරවුම් කරද්දී හරි අනතුරුදායකයි. මේ තියෙන ස්ලැබ් එක අතර අඩියක විතර ලොකු වලක් තියෙනවා ගැප් එකක්. ඒ හිඩැසින් කෙනෙක් වැටෙන්න පුළුවන් දෙතුන් දෙනෙක් මේ වෙනකොට වැටිලා තියෙනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි වාහන හරවද්දි ඒ සියල්ල බේරලා හරවනකොට අනතුරු සිදුවීමේ ඉඩ වැඩි. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, යමක් සිද්ධ වුනාට පස්සේ අපේ ඉංජිනේරුතුමා එතනට එන්නේ නෑ අපිට මෙතන ස්ලැබ් එක දාන්න සෘජු ශ්‍රමය නෑ කියලා කියන්න. යමක් සිදු වුණාම වගකීම වෙන්නෙ පාලකයෙක් විදිහට ඔබතුමාට. ඒවගේම ඒ අවට ඉන්න අපේ මන්ත්‍රීවරු තුන්දෙනෙක් ඉන්නවා. අපි තුන්දෙනාටත් අපි පක්ෂද විපක්ෂද අදාල නෑ අපිටත් මේකේ වගකීමක් එනවා.ඒනිසා ගරු නගරධිපතිතුමනි එතන තියෙන මහා බර ස්ලැබ් එක අයින් කරලා ඒ ගල් කැටිය අයින් කරලා සැහැල්ලු ස්ලැබ් දෙකක් දාලා නිතරම සුද්ද කරන්න පුළුවන් විදියට මොකද එතන විශාල වශයෙන් වතුර එක්රැස් වෙනවා. අපේ තුසිත් මන්ත්‍රීතුමත් ඔය කාරණා මතුකරනකොට ඒකෙ එක කොටසකුත් තියෙනවා ඔය පාරේ ඔය කානුවේ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි එතන වතුර බහින්නැත්තෙත් ප්‍රධාන වශයෙන් ඔය ස්ලැබ් එක උස්සන්න බැහැ. ඒ නිසා ස්ලැබ් ඒක උස්සලා සුද්ධ කරන්න බැහැ අපේ සේවකයන්ට. ඒ නිසා ඒ පහසුවත් ඇතිවෙනවා සැහැල්ලු ස්ලැබ් කැට දෙකක් දැම්මොත් ඉතින් ඒ නිසා මම මෙවරත් ඉල්ලා සිටිනවා ඔබතුමාගෙන් කරුණාකරලා ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා.

**03(33)** <u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් අපේ මේ වෙලාවේ මොරටුව නගර සභාවේ නාගරික මන්ත්‍රීවරියක් හෝ ඒ වගේම නගරාධිපතිවරයෙක් ලබා ගන්නා ජයග්‍රහණ ලෝක මට්ටමෙන් අපේ මොරටුවට ඉතාම වැදගත්. ඒ නිසා විශේෂයෙන්ම ඊයේ දවසේ මට ඇමරිකා එක්සත් ජනපදයෙහි හිතවතෙක් විශේෂ පණිවිඩයක් යොමු කරලා තිබ්බා. ඒ තමයි ලබන අප්‍රේල් හතරවෙනිදා ඉඳලා මැයි දාසය වෙනිදා දක්වා පැවැත්වෙන ලෝක නායකයන්ගේ විශේෂයෙන් හිටපු ජනාධිපති හයිසෙක් අවර් මහත්මා සංවිධානය කරන ඇමෙරිකා එක්සත් ජනපදය වගේම අනෙකුත් රටවල්වල දායකත්වය ලබන මේ ලෝක තරුණ සම්මේලනය සඳහා මොරටුව නගර සභාව නියෝජනය අපේ මහා නගර සභා මන්ත්‍රීතුමිය නීතිඥ ලිහිනි ප්‍රනාන්දු මහත්මිය නියෝජනය කරනවා. විශේෂයෙන්ම ඒක අපිට සතුටක්. එතුමියට අපි සභාවක් විදිහට සුභපතන්න අවශ්‍යයි. විශේෂයෙන් මීට පෙර මට මතක විදිහට ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තරුණ ලේකම් මහ ලේකම් විදියට නියෝජනය කරන ජයත්මා වික්‍රමනායක ඒ අවස්ථාව උදා කරගත්තා. තවත් කිහිප දෙනෙක් පමණක්. ඒනිසා මම හිතන්නේ මේ ලැබෙන අවස්ථාව ඇයගේ පොස්ට් ඒකේ දාලා තිබුනේ මොරටුව මහා නගර සභා මන්ත්‍රී, ඒක තමා වැදගත්. ඒනිසා ලබන අප්‍රේල් හතර වෙනිදා ඉඳලා මැයි දාසය දක්වා ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝක් වල පැවැත්වෙන ඒ වැඩසටහනට සම්බන්ධ වෙන නීතිඥ ලිහිණි ප්‍රනාන්දු මහත්මිය ලොකු අවස්ථාවක් උදාකර ගත්තා. ලෝක රටවල්වල නායකයෝ රටවල් 27ක නායකයෝ එකතුවෙලා කරන. ඒ අවස්ථාව නගර සභාවටත් රටටත් ඉතාමත් වැඩදාය අවස්ථාවක් වාසිදායක අවස්ථාව බවට පත්වෙයි. එනිසා එතුමියට මම හිතන්නේ සභාවක් විදිහට අපේ සුභාෂිංශනය පිරිනමන්න මම අවස්ථාවක් බවට පත්කර ගන්නවා.

**03(34)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පෙත්සම් හා අයිතම යටතේ බිෂොප් ටෙරස් නිශාන්ති ප්‍රනාන්දු මහත්මීන් විසින් මා වෙත ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා. ලක්ෂපතිය බිෂොප් ටෙරන්ස් පළවෙනි පටුමඟ අංක 20/1 ප්‍රේමසිරි ප්‍රනාන්දු යන අය විසින් පාර අවහිර වන සේ තාප්පයක් ගසා ඇත. එයට නිසි විමර්ශනයක් කරලා ඒ මාර්ගය ජනතාවට ගමන් කිරීමට හැකි අන්දමට සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**03(35)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජීත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලක්ෂපතිය, අර්නස්ට් පෙදෙස, මාර්ටින් හෙන්රි ප්‍රනාන්දු මාවතේ අවුරුදු ගණනාවක් තිස්සේ භාවිතා කරන මෙම නම ඉදිරියටත් පවත්වාගෙන යාමට අනුමැතිය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**03(36)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අද මාර්තු 03 වෙනිදා මොරටුවට ආභරණයක් වෙච්ච මොරටුව වේල්ස් කුමර විදුහලේ ආදි කාතෘ දිනය අද. මොරටුවට මේ වගේ පාසලක් දායාද කල ශ්‍රීමත් හෙන්රි ද සොයිසා මැතිතුමාව වේල්ස් කුමරුවෙක් හැටියට මේ අවස්ථාවේදී සිහිපත් කරනවා.

**03(37)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සේවකයෝ ගැන කතා කරපු වෙලාවෙදි මට සේවකයෙක් පිළිබඳ අගය කිරීමක් කරන්න තිබෙනවා. කොමසාරිස්තුමිය දන්නවා තට්ටයා පාලම ගාව තියෙන කාලයක් තිස්සේ තිබුණු මේ කුණුගොඩ කිහිප වතාවක් කිව්වත් ඒක හරියට වැඩේ කෙරුන් නැහැ. නමුත් ගිය සෙනසුරාදා අපේ ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂක තුමාත් ඒ වගේම සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමත් දන්නවා මංජුල කියලා සුපවයිසර් කෙනෙක් ඉන්නවා, තවත් එක සේවකයෙක් එක්ක මමත් ගෙදර හිටියෙ නෑ ඒ වෙලාවෙ, තනියම විල්බරෝ එකකින් කළපුවේ කුණු ගොඩදාන කට්ටියට කියලා ඒගොල්ලන්ගෙන් අවසරය අරගෙන එය විල්බරයකින් ඇදලා මට සතුටු වෙන්න පුළුවන් ආකාරයට ජනතාවට සතුටු වෙන්න පුළුවන් ආකාරයකට සුද්ද පවිත්‍ර කරලා දුන්නා. ගරු නගරාධිපතිතුමනි, අපි ඒ විදිහට ම ඒක පවත්වාගෙන යා යුතුයි. ඒ වගේ තමයි මට කියන්නට ඕනා ඉල්ලීම් හා ආයාචනා කිහිපයක් තිබෙනවා. ගරු නගරාධිපතිතුමනි, මේ ඉල්ලීම් හා අභියාචනා අපි ඉදිරිපත් කරන්නේ ඇත්තටම ඔබතුමාලා අපහසුතාවයට පත් කරන්න නෙවෙයි. ගරු සභාවක් හැටියට අපි කැමති වුණත් අකමැති වුණත් මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට මේ නගර සභාවත් සමඟ යා යුතුයි.

**03(38)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ අගුලානේ පල්ලියේ දිට්වා සුළි කුණාටුවෙන් සිද්ධ වෙච්ච හානිය ඒ පල්ලියේ වහලයට සම්පූර්ණයෙන්ම විනාශ වුණා. ගරු අධිකරණ ඇමතිතුමා තමන්ගේ මුදලින් තමන්ගේ පෞද්ගලික මුදලින් හරි මේක හදල දෙන්නම් කියලා කිව්වා. ඒ වගේම තමයි ඔබේ නායකතුමා ගරු ජනාධිපතිතුමා තහඩු වගයක් ලක්ෂ දහයක් දෙනවා කියලා කිව්වා. නමුත් නගරාධිපතිතුමනි, ඉතාමත්ම කණගාටුයි තාමත් ඒ මුදල ලැබිල නැහැ. කරුණාකරලා ඔබතුමාගෙන් ආයාචනය කරනවා මේ සඳහා ඔබතුමා මැදිහත් වෙන්න. ගරු අධිකරණ ඇමතිතුමාට දන්වන්න කියලා මේ අවස්ථාවේදි ඉල්ලීමක් කරනවා.

**03(39)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දිට්වා සුළි කුණාටුවේ බලපෑම් මත ඔබතුමාට මතක ඇති, අපේ මන්ත්‍රීතුමාට මතක ඇති රිවසයිඩ් ගාර්ඩන් වත්තේ ගස් කිහිපයක් කපා දැමුවා. කණගාටුයි කියන්න, ඒ කුණාටුව සිද්ධවෙලා මාස ගානක් සිද්ධවෙලත් තාමත් ඒ ගස් කොටස් ඒ වත්තේ තිබෙනවා, දරුවෝ වැටිලා තුවාල වෙනවා. ඒ නිසා මේක හරි කරදරයක්. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ ගස් කොටස් ඉක්මනින් ඉවත් කරලා දෙන්න කියල මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා.

**03(40)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා පල්ලියේ උත්සවයට ආපු වෙලාවේ ඔබතුමාට සම්මානෙකුත් පිරිනැමුවා පල්ලියෙන්. මම ඔබතුමා අඬගහගෙන ගිහිල්ල පෙන්නුවා පිටිපස්සේ තියෙන මහා විශාල කුණුගොඩ, ඔබතුමා කිව්වා විසඳුමක් දෙන්නම් කියලා. තාමත් ඒකට විසඳුමක් ලැබුණේ නැහැ නගරාධිපතිතුමනි, කනත්ත පැත්තතේ කුණු ගොඩක් තියෙනවා ඒකත් සුද්ධ කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(41)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලීප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ලිපියක් සභාගත කරනවා. ඒ රිවසයිඩ් ගාර්ඩන්, දැන් අපි මේ සභාවේදී මේ ගැටළු ගැන කතා කරාම සමහර වෙලාවට අපි මේ බොරු කියන්නේ කියලා තමයි මේ සමහර මන්ත්‍රීවරු කියන්නේ. කානුව සුද්ද කරන්න දෙන්නේ එතුමට විතරයි, කාණුව සුද්ධ කරද්දි අත්දෙක බැදගෙන හිටියා කියලා වැඩේ වෙන්නේ නෑ. ඒනිසා ගරු නගරාධිපතිතුමනි සොයා බලන්න. මේ රිවර්සයිඩ් ගාර්ඩන් පිටිපස්සේ 22 වත්ත මැද තියෙන කුණුගොඩ බලන්න කොයිතරම් අපිරිසිදු වෙලදා කියලා.කරුණාවෙන් ඉල්ලා සිටිනවා මේ ගැන සොයා බලන්න. සෞඛ්‍ය කමිටුවේ ගරු සභාපතිතුමාට මම ඉල්ලීමක් කරනවා මම දැක්කා එතුමා බයිසිකලයෙන් වටේ යනවා, අපේ ගේ ගාව්නුත් ගියා.හරිම හොඳයි. මම ඉල්ලීමක් කරනවා ගම ඇතුලටත් ගිහිල්ලා වුවටක් බලන්න කියලා මේ අවස්ථාවේදි ඉල්ලීමක් කරනවා. මේ කාණුවල කුණු පිරිලා තියෙන්නේ මේවා දකින්නැද්ද කියලා තමයි මේ අවස්ථාවේදි ඉල්ලන්නේ. ගරු නගරාධිපතිතුමනි ඔබේ පාලනය බලය වුණාට ඔබට විතරක් නෙමේ බයින්නේ ඔබේ මන්ත්‍රීවරයාට විතරක් නෙමේ බයින්නේ මේ නගර සභාව නියෝජනය කරන අපිටත් බනිනවා. ඒ නිසා මේ වගකීම ඔබතුමාට විතරක් නෙමෙයි මෙතුමට විතරක් නෙමෙයි අපි ඔක්කොටම තියෙනවා. එහෙනම් මම කියන්නේ එතුමාටත් දෙන්න අපිටත් දෙන්න අවස්ථාවක් අපි කරලා පෙන්නනන්නම්. එක දවසක් දෙන්න කාණු කණ්ඩායම කරලා පෙන්නන්න කොහොමද වැඩක් හරියට කරන්නේ කියලා.

**03(42)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලීප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සන්තෝසයි කියන්න අපේ චුල්ලා මහත්තයාට ස්තුති කරන්නට ඕනෑ අගුලානේ ළිං වගයක් තියෙනවා.ඒ පිළිබඳ ලිපියක් ඉදිරිපත් කළා. එකෙන් ළිං දෙකක් නගර සභාව සතුයි කියලා තියෙනවා ඒ දෙක විතරයි සුද්ධ කරන්නම් කියලා කිව්වේ. ගරු නගරාධිපතිතුමනි, මේ ළිං නගර සභාවේ වටිනා මුදල් වත්කම් වියදම් කරලා තමයි මේවා හදලා තියෙන්නේ ඒ නිසා අපිට පවරගන්න පුළුවන්කම තියෙද්දී ඇයි මේවා අපි පවරගන්නේ නැත්තෙ කියන එකම මේ අවස්ථාවේදී ඉල්ලීමක් කරනවා කරුණාකරලා ඉක්මනින් මේවා පවරා ගැනීම සඳහා කටයුතු කරන්න කියලා.

**03(43)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලීප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අඟුලානේ වීථි පහන් පිච්චිලා තියෙනවා ඒවත් සොයා බලන්න කියලා ඉල්ලීමක් කරනවා. කාණු සුද්ද කිරීම ගැන කියනකොට විශේෂයෙන්ම පොදු ජය මාවත, ඒ වගේම මහජන මාවත මේ පාරවල් වල මදුරුවෝ පිරිලා ඒ නිසා ඒවා ක්‍රමවත්ව සුද්ද කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒවගේම තමයි පොදු ජය මාවතේ අනුබද්ධිත පාරක් තිබෙනවා, අපේ යසන්ත මහත්තයා ඉන්නකොට ඒ පාරේ මිනිස්සුන්ගේ කුණු ටික අරන් ආවා. අනේ නගරාධිපතිතුමා ලෙඩ්ඩු ඉන්නවා ඒ පාරේ ඒ මිනිස්සුන්ගේ කුණු ටික ගැනෙන්නේ නැහැ දැන් හරියට, ඒනිසා ඒකත් හොයලා බලන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(44)** <u>මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලීප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් සඳහන් කරන්න ඕනා අගුලාන නියෝජනය කරන මන්ත්‍රීවරයා හැටියට වැරදි වැඩක් කරලා තියෙනවා, ආදාහනාගාරයේ තියෙන මැෂින් එක අරන් ගිහිල්ලා කොරළවැල්ල ආදාහනාගාරයේ සවිකරලා තියෙනවා, මගේ බලවත් විරෝධය පලකරනවා. කරුණාකරලා මේක නිවැරදි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(45)** <u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මුලින්ම ස්තුතිවන්ත වෙනවා සජිත් දුමින්ද පීරිස් මන්ත්‍රීතුමාට කළ ඇගැයීම සම්බන්ධයෙන්, මට කරුණු තුනක් ඉදිරිපත් කරන්න තියෙනවා ගරු නගරාධිපතිතුමනි, අපි ගිය ඔක්තෝම්බර් මාසයේ ඉඳන් හැමදාම මේ සභාවේ කියලා ඔබතුමා පාර මැද අයිලන්ඩ් එක සුද්ද කළා, ඒවා සුද්ධ කළාට වැඩක් නැහැ ඒවා පවත්වාගෙන යන්න ඕනේ. දැන් ආයිත් තණකොළ වැවිලා , ආයේ තණකොළ වැවුණම අපි ආයේ ඇවිල්ලා මේක කියලා, එහෙම කියන එක ඇත්තටම කණගාටුවට කරුණක්. නගර සභාවක් කියන්නේ අපි කියලා කරවගන්න එකක් නෙවෙයි ඔබතුමාලට ක්‍රියාකාරී

සැලැස්මක්ම තියෙනවනේ ඒ සැලැස්ම හරහා මේවා සුද්ධ කරන ක්‍රමවත් වැඩපිළිවලක් තියෙන්න ඕනා. දිලිප් මන්ත්‍රීතුමා කිව්වා වගේ මිනිස්සු පාරේ යනකොට ඔබතුමලාට විතරක් නෙමෙයි අපිටත් බනිනවා. ඔගොල්ලෝ නගර සභා මන්ත්‍රීවරු නේද මේවා පෙන්නේ නැද්ද කියලා. ඉතින් අපි ඇවිල්ලා මෙතන කිව්වට විතරක් වැඩක් නැහැ අඩුම ගානේ සුද්ධ කරන්න, ඔබතුමන්ලා විශාල පරිශ්‍රමයක් දාලා ඔබතුමන්ගේ දේශපලාන අධිකාරියේ පුද්ගලයිනුත් අරගෙන විශාල ශ්‍රමදානයක් කරලා සමාජ මාධ්‍ය පිටුවල දාලා විශාල ව්‍යාපෘතියක් කළා ඒ තත්ත්වයට යන්න එපා. තණකොළ අඩි දෙක තුනක් උසට වැවෙන්න ඕන නැහැ සුද්ද කරන්න. අපි ඉල්ලීමක් කරනවා ඔබතුමන්ලාගෙන් මේ නගරය ක්‍රමවත්ව පිරිසිදුව පවත්වාගෙන යන්න කියලා අඩුම ගානේ ඊළඟ සභාවට කලින් හරි අයිලන්ඩ් එක ආයෙත් පාරක් සුද්ධ කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**03(46)** <u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටු ගම් 18 කියලා පිටුවක සඳහන් වුනා කල්දෙමුල්ල ප්‍රදේශයේ ප්‍රදේශවාසියකු විසින් එයාගේ දුක්ඛිත තත්ත්වය. මට වාචිකව දුරකතන මාර්ගෙනුවත් දැනුවත් වීමක් කළා, මම මෙය සභාගත කරන්න කැමතියි. කල්දේමුල්ල ප්‍රදේශවාසියකු වශයෙන් පසුගිය අවුරුදු එකහමාරක කාලයේ තුළ මේ ප්‍රදේශයේ කිසිදු සංවර්ධන කටයුත්තක් මා විසින් දැක නොමැති අතර, මේ වනවිට අලි නැවිය හැකි මට්ටමේ වලවල් විශාල ප්‍රමාණයක් ප්‍රදේශවාසීන්ට උරුම කර දී ඇත. වර්තමාන පාලනයට සහාය දැක්වූ පක්ෂ සංවිධායකයින්ද විශාල පිරිසක් සෑම දිනකම ගමන් කරන මෙම මාර්ගයේ ප්‍රදේශවාසීන්ට ගමන් කළ හැකි ආකාරයට අවම මට්ටමකින් හෝ තාර දමා සකස් කිරීමට නොහැකියාව පිළිබඳ ගම්වාසීන්ට මනාව පසක් කර දී ඇත. අප බලධාරින්ගෙන් විමසූ විට පවසන්නේ පාරවල් සකස් කිරීමට ගල් රෝලක් ගැනීමට නොහැකි නිසා මෙවැනි තත්ත්වයක් උදා වී ඇති බවයි. ගල් රෝල ගැනීමට දායකත්වය දක්වා ඔබත් මොරටුව කල්දමුල්ල පුනරුදයට දායක වන්න. ලැජ්ජයි ගරු නගරාධිපතිතුමා, මම ඔබතුමාලට විතරක්නේ කියන්නේ මේක අපිටත් ලැජ්ජයි. ෆේස්බුක් එකේ මෙහෙම දානවා. මේක අර කිව්වාගේ අපි හැමෝම මේ වගකීමට බැඳෙනවා. ඉතින් මේ ඇත්තටම නගර සභාවට ගල් රෝලක් නැද්ද. මේකේ පින්තූරත් දාලා. මේවල ගිහිල්ලා තියෙන කමෙන්ස් දැක්ම ඇත්තටම කණගාටුයි නගරාධිපතිතුමනි. මම ඔබතුමාට කියනවා මේ තත්ත්වයට පත්වෙන්න එපා. ඕගොල්ලෝ කිව්ව දේවලුයි කරන දේවල් අතර විශාල පරතරයක් තියෙනවා. ඔබතුමාගේ අවධානයට මෙය යොමු කරනවා.

**03(47)** <u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, තුසිත් මන්ත්‍රීතුමා කිව්වා එම්. ජේ. සී. ප්‍රනාන්දු මාවත මැද වතුර ගලනවා කියලා වහින වෙලාවට. පානදුරේ නගර සභාව විසින් ඔබතුමන්ලා බලයට පත්වුණාම කානු ඔක්කොම ගලි දාලා බැකෝ දාලා ගලී ඇතුලවල් ඔක්කොම සුද්ද කළා. මැන් හෝල්ස් ටික ක්ලීන් කළා. මම ඔබතුමාගේ ඉල්ලීමක් කරනවා මේ මෙතන ටවුන් එක මැද වහිනකොට ඔක්කොම යට වෙනවා, මේ මැන් හෝල් ටික ඔක්කොම විවෘත කරලා, විශාල පරිශ්‍රමයක් යොදලා, මම සෞඛ්‍ය කමිටු සභාපතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා මේ වහින්නේ නැති මාස දෙක තුනේ හරි ඒක කරන්න කියලා.

**03(48)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාවනා හා පෙත්සම් යටතේ මම අගෝස්තු මස මහා සභාවේදිත් ඉදිරිපත් කළා ඒවගේම ඔක්තෝබර් හත්වෙනිදා තිබූ මහා සභාවෙදිත් ඉදිරිපත් කළා ඉදිබැද්ද බිලාසියුස් පාර, එම්.පී. හොටෙල් එක ඉස්සරහ තියෙන පල්ලමේ කානුව, මීට පෙර කොමසාරිස්තුමීගේ පාලනය යටතෙත් එතුමියට ලියුම් හම්බ වෙලා තියෙනවා. තාම ඒ පිළිබඳ කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙන නෑ ගරු නගරාධිපතිතුමනි. මේ කලාපයේ දැන් ඩෙංගු රෝගීන් ඉන්නවා මම හිතන්නේ ඩෙංගු රෝගීන් ඉන්නවා හත් අට දෙනෙක් ඒ හරියේ. ඒ කාණුව උඩින් ගමන් කරන ගෙවල්වල, මේක ඉතාමත්ම සැලකිල්ලට ගෙන ඔබතුමාගේ මැදිහත්වීමෙන් අපේ ප්‍රධාන සෞඛ්‍ය පරික්ෂතුමාවත් මැදිහත් කරගෙන ඉතා ඉක්මනින් මේ කානුව පිරිසිදු කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(49)** <u>මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම විශේෂ ස්තුතියක් කරනවා ඉදිබැද්ද බ්ලාසියුස් මුණිඳුන්ගේ දේවස්ථානයේ තිබුණු වාර්ෂික මංගලායයේදී ඒ සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතුවලට ගොඩක් සහය වුණා අපේ මොරටුමුල්ල කලාපයේ අපේ පරිපාලකතුමා එතුමා ඉතාමත් හොඳින් ක්‍රියාත්මක වෙමින් ඒ පාරවල් ටික අවශ්‍ය ප්‍රමාණයට සුද්ධ කරලා දුන්නා. ඒ කළාපයේ සිටින පරිපාලකතුමා ඇතුළු පී.එච්.අයි.මහත්මා ඇතුළු ඒ සේවක මහතුන් සියලු දෙනාට ඒ ක්‍රියාමාර්ගය කර දීම ගැන ඉතාමත් ස්තුතිවන්ත වෙනවා.

**03(50)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ගිය අවුරුද්දේ අඟුලාන ආදාහනාගාරය සම්බන්ධව මුදලක් අනුමත වුණා ලක්ෂ පහළොවක් පමණ. එම මුදල අනුමත වෙලා ඒ අනුමත මුදල ටෙන්ඩර් එකට දැන් ඉදිරිපත් කළා. ටෙන්ඩර් එකට මේ වෙනකොට දැන් මාස තුනක් විතර වෙනවා, ඒ ටෙන්ඩර් එක කාටහරි ප්‍රදානය කරලා, එයා තාම පටන් අරගෙන නැහැ. ඉතින් නගරාධිපතිතුමනි කරන්නේ නැත්තම් වෙන කෙනෙකුට හරි මේ ටෙන්ඩර් එක භාරදීලා මෙම කටයුතු ඉක්මන් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**03(51)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ලුනාව ඇවිදින මංතීරුවේ මංතීරුව යටින් යන බෝක්කුව, ඒ බෝක්කුවේ එහා පැත්තෙනු මෙහා පැත්තෙනුත් ගල් අතුරලා තියෙන තැන්වල බැහැල තියෙන්නෙ බෝක්කුවෙන් නෙමෙයි වතුර බහින්නේ බෝක්කුවට පිටින්. ඒ වගේම පෞද්ගලික ඉඩම් වලිනුත් බෝක්කුව ගිහිල්ලා තියෙනවා. ඒ පෞද්ගලික ඉඩම් වලිනුත් බෝක්කුව ඇතුලෙන් නෙමෙයි වතුර ගොඩක් වෙලාවට යන්නේ බෝක්කුවට පිටින්. ඔක්කොම පස් ටික ගහගෙන ගිහිල්ලා ගං ඉවුරේ තියෙන්නේ. ඒවගේම ඒ ගං ඉවුරේ පස් ටික ගහගෙන ගිහිල්ලා නගරාධිපතිතුමනි, කුඹුක් ගස් ටික ඇලවෙලා. හුළඟක් ආවොත් මේ කුඹුක් ගස් ටික පෙරළෙනවා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා ගඟේ පස් ටික භාරලා නැවත ගං ඉවුර හදන්න කියලා. ඒ වගේම අර බෝක්කු ටික බෝක්කුව පිටින් යන වතුර පාර නවත්තන්න කොන්ක්‍රීට් එකක් දාන්න, ඔබතුමා නිරීක්ෂණයට ගියොත් බලාගන්න පුළුවන් මමත් සමන්ත මන්ත්‍රීතුමත් ගිහිල්ලා බැලුවා, පුලුවන් ඉක්මනට ගිහිල්ලා, ඒ අයගේ පෞද්ගලික ඉඩම් වලිනුත් මේ පස් බැහැලා ඒ ඉඩම් ඔක්කොම වලවල් වෙලා තියෙන්නේ එය සකසා දෙන්න. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, අඟුලාන ආදාහාගාරය සම්බන්ධව ඔබතුමාගේ අවධානය විශේෂ අවධානය යොමු කරන්න. ඒ වගේම මම ඉල්ලීමක් කළා නගරාධිපතිතුමනි, ඔබතුමා අඟුලාන මෝයකට ළඟට යනකොට ලුනාව පැත්ත තනිකර කළුවරයි. මේක දැන් මාස හය හතක් තිස්සේ කියනවා මෙතන ලයිට් කනුවක් දාලා මට ලාම්පු දෙකක් තුනක්වත් දාලා දෙන්න කියලා. මීටර් 400ක් විතර කළුවරේ කාන්තවකට එන්න බෑ අනාරක්ෂිත පාලමක් උඩින් යන්න තියෙන්නේ. මේ පාලමේ දෙපැත්තෙම වැට නැහැ. හයියෙන් වාහනයක් ගියොත් ගඟට තමයි පනින්න වෙන්නේ මිනිස්සුන්ට. ඉල්ලීමක් කරලා කර්මාන්ත කමිටුවට එතකොට සුදේශ් මන්ත්‍රීතුමා හිටියේ. සුදේශ මන්ත්‍රීතුමා කිව්වා මේක හදමු මේක ලොකු මුදලක් යන වැඩක් නෙමෙයි කියලා. තවමත් මේක කරන දෙයක් නෙමෙයි නගරාධිපතිතුමනි. මාස 06 ක් විතර වෙනවා මේ යෝජනාවල් වලට, තවම මේ ගැන කිසිම කථාවක් නැහැ. කමිටුවලත් මේ ගැන සාකච්ඡා කළා ,

**03(52)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, ඒ වගේම උයන උතුර කලපුවේ මන්තීරුව වටේ විතරයි හැමෝම කතා කරන්නේ. උයන උතුර ප්‍රදේශයේ ගරු නගරාධිපතිතුමනි ඔබතුමා මොරටුවටම නගරාධිපතිතුමා. උයන උතුරටත් නගරාධිපතිතුමා ඔබතුමා. උයන උතුරේ කලපුව අයින පාරේ මේ වෙනකොට ගිනි ගොඩවල් ගහලා, ගල් ගොඩවල් ගහලා හරිම අවලස්සනයි.මම ඉල්ලීමක් කරනවා මේ ඔක්කොම සුද්ද කරන එකෙන් නගරාධිපතිතුමා උයන උතුරේ ගං ඉවුර ඔක්කොම, මන් දන්නෑ මොකක්ද ප්‍රශ්නේ කියන එක ඔබතුමා මොරටුවට වගකියන ප්‍රධාන පුරවැසියා වශයෙන් ඒ ගං ඉවරේ තියෙන කුණු ගොඩවල් ටික අයින් කරලා සුද්ද පවිත්‍ර කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, පෙත්සම් හා පැමිණිලා අයිතමය අවසන් වෙනවා. මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා ඒ ඉදිරිපත් වෙච්ච පෙත්සම් පැමිණිලි හරහා කියවුණු බොහෝ ගැටලු ඒවා ඉදිරිපත් වෙච්ච ආකාරයේ වෙනස්කම් තිබෙනවා නමුත් මහ නගර සභාවක් විදිහට අප විසින් කළ යුතු දේවල් මහ නගර සභාවට පැවරිච්ච වගකීමක්. පෙත්සම් ලෙස ඉදිරිපත් වෙන්නේ ඒ අදාළ මන්ත්‍රීවරුන්ට භූමියේ ජනතාවගෙන් එන පැමිණිලි, ඔවුන් දකින ඒවත් අදාළ මහජනතාව විසින් දැනුම් දෙන ඒවාත්, සභාව වෙත ඉදිරිපත් කරන මහජන නියෝජිතයින්ගේ ගැටලු වගකීමෙන් මීට වඩා වැඩි වගකීමකින් අදාළ දෙපාර්තමේන්තුවල නිලධාරින් කටයුතු කළ යුතුයි. ඔබ දන්නවා මේ සමහර සමහර කාරණා කරන්න බැරි ඒවා. හැබැයි බහුතරයක් කළ හැකි ඒවා. මේ මහා ප්‍රතිපාදන වියදම් කරන්න ඕනේ ඒවත් නෙවෙයි. ඉතාමත් සරළ කාරණාහැමදාමත් ඉතිහාසෙත් අදත් වර්තමානයේත් මේ ගැටළු එහෙම තමයි. හැබැයි ඒවට යම් සාධනීය උත්තර දෙන පිළිතුරු දෙන විසඳුම් දෙන එහෙම එකක් භූමියට ජනතාවට දැනෙන්න ඕන. ඒ පණිවුඩය අරගෙන යන නියෝජිතයෝ තමයි මේ ප්‍රශ්න ටික ඉදිරිපත් කරන්නේ. නිලධාරින්ගේ පැත්තටත් වැඩි වගකීමක් තිබෙනවා මටත් හොඳටම අවබෝධයක් තිබෙනවා බොහෝ බොහෝ කාරණා කොච්චර කිව්වත් ඒවට අවශ්‍ය අදාළ බරෙන් කටයුතු කරන්නේ නෑ. දැන් සමහර වෙලාවකට අර සේවා අවශ්‍යතාවය මත පදනම් වෙච්ච වෙනස්කම් කිරීමට දරන උත්සාහයන් ඔය තත්ත්වයන් එක්ක තමයි එන්නේ. හැබැයි සේවකයින්ගේ කිසි කෙනෙක්ගේ හිත් රිදවන්නේ නැතුව කොහොමද මේ කටයුතු කරන්නේ නිලධාරින් එක්ක කොහොමද කටයුතු කරන්නේ.මේ දීර්ඝ කාලයක් හුරු පුරුදු වෙච්ච රටාවන් වෙනස් කරගන්නේ කොහොමද, හැකි හැම විටම ඒ පිළිබඳව හිතමින් කල්පනා කරමින් මහන්සි වෙමින් මන්ත්‍රීවරු ගොඩාක් ඉවසමින් මේ ගමන යන්නේ. කරන්න ඕන ඒවා කොච්චර තිබුණත් හැකියාව ගොඩක් ඊට වඩා පිටිපස්සේ තියෙන්නේ. උවමනාව නැතුව නෙවෙයි. ඉතින් ඒ නිසා සමහර ඒවා කියනකොට ඉතාම සරල කාරණා විශාල කාලයක් වෙනවා. පොල් ගහක් කපා ගන්න බැහැ අවුරුදු ගාණකින්. මේවා නැවත නැවත කියන්න ඕන ඒවා නෙවෙයි. ඒ නිසා මම කියන්නේ මේ සභාවටවත් අඩුම තරමේ ගරු කරලා සභාවේ අදාළ මහජන නියෝජිතයෝ මහා සභාවේ කියන එකවත් ගරු කරලා. ඒවා එහෙම ඉටු නොවෙනවා නම් මම කියන්නේ ඊට වඩා ගැටුම්කාරී ස්වභාවයකට යන්න වෙයි. කරන්න පුළුවන් වැඩ මෙතනින් ඇහුවා අර පැත්තෙන් පිට කළා නිකං හිටියා. එනිසා ඒ අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන්ට ඉතාම වගකීමෙන් කියනවා ඔබ වැඩ නොකරනවා කියන එක නෙවෙයි මේ කියන්න ඔබ වැඩ කරනවා මහන්සි වෙනවා හැබැයි ඔබ ගරු කරන්න මේ සභාවට, මේ මහජන නියෝජිතයින්ට. දේශපාලන බෙදීමක් නැහැ. සමහර දේශපාලන අරමුණු සහිතව සමහර කථා පැවැත්වෙනවා. ඒක එහෙම තමයි. ඒක සීයට සීයකින් වළක්වන්න ඕන එකකුත් නෙවෙයි. හැබැයි එතනින් ගතයුතු දේ ගතයුතුයි නේ. කළයුතු දේ කරන්න ඕනනේ. එනිසා පෙත්සම් පැමිණිලි අයිතමයේ ලොකු කාලයක් අරගෙන තිබෙනවා. ඒ කාලය ඇත්තටම වැදගත් වෙන්නේ හෙට මේ ඉදිරිපත් කරපු ඒවාගෙන් කොච්චර කරගන්න අපි සමත් වෙනවද. ඒ නිසා නැවත නැවතත් මගේ පැත්තෙන් මට පුළුවන් හැකි උපරිම මැදිහත්වීම මන්ත්‍රීවරුනි හැමවිටම කරනවා. නිලධාරින්ටත් ඉල්ලීමක් කරනවා කරුණාකරලා මේ එන හැම පෙත්සමක්ම අත්සන් කරලා ලේකම්තුමාට භාර දෙනවා. ලේකම්තුමා ඔබ දෙපාර්තමේන්තුවලට එවනවා. මේවට වෙන්නේ මොකද කියලවත් කියන්න.

## 04. <u>ප්‍රශ්න</u> - නැත

## 05. <u>යෝජනා</u>

**05 (1) මහා නගර සභා මන්ත්‍රී, එම්. බී. සෙව්වන්දි නිලංගික ප්‍රනාන්දු මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

ලක්ෂපතිය ප්‍රදේශයේ ලුනාව ඇළ ව්‍යාපෘතිය මගින් ඉදිකළ ඇළ මාර්ග ආරක්ෂිත යකඩ වැට පොළවට සවිව ඇති කොටස් දිරාපත් වෙමින් පවතී. මෙම වැට ආරක්ෂා කර ගැනීම සඳහා මෙම සවිවන යකඩ කොටසට කොන්ක්‍රීට් කුට්ටි යොදා ප්‍රතිසංස්කරණය කර දෙන මෙන් යෝජනා කර සිටින්නීය.

නියෝජ්‍ය නගරාධිපති ඩබ්. පී. ප්‍රභාෂිනි වික්‍රමසිංහ මහත්මිය විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි 05(1) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(2) මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මොරටුව මහා නගර සභාව සතු බල ප්‍රදේශය තුළ දැනට අප සතුව ඇති මාර්ග ලේඛනය යාවත්කාලීන කරන ලෙස මෙම සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී, ඩී. සමන්ත සිල්වා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි 05(2) යෝජනාව ඉදිරි කටයුතු සඳහා ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(3) මහා නගර සභා මන්ත්‍රී, ඩී. සමන්ත සිල්වා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

මොරටුව බල ප්‍රදේශය තුළ වාසය කරන දීර්ඝ කාලයක සිට පදිංචිව සිටින ජනතාවට ඔවුන්ගේ නිවාස සඳහා ඔවුන්ගේ නමින් වරිපනම් නොමැති වීම හේතුවෙන් විවිධ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදුවන බැවින්, එම අපහසුතාවයන්ගෙන් එම ජනතාව මුදවා ගැනීම සඳහා ඔවුන්ගේ නිවැරදි අයිතිය හඳුනා ගෙන ඉදිරියේදී සිදු කිරීමට නියමිත තක්සේරු ප්‍රතිශෝධනය තුලින් එම අයගේ නමින් වරිපනම් පත ලබාදීමට කටයුතු කළ යුතු යැයි මෙම සභාවට යෝජනා කරන්නීය.

මහා නගර සභා මන්ත්‍රී, එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සමන්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව මේ නිශ්චිත මොහොතේ හරිම වැදගත් යෝජනාවක්. අතිශය වැදගත් යෝජනාවක් මොකද එක පැත්තකින් ජනතාව මහත් පීඩාවකට පත්වෙලා ඉන්නවා මේ වරිපනම් පිළිබඳ ගැටලුව. පරිපාලනය ලේඛණය පිළිබඳව විශාල පීඩනයකින් ජනතා ඉන්නවා. සභාවත් ඒ වගේම ඉන්නවා. සභාවත් පොදු ජනතාවත් මුහුණ දෙන විශාල ගැටලුවක් තමයි මන්ත්‍රීතුමා මේ වෙලාවේ ඉදිරිපත් කරන්නේ. මම හිතනවා මේ යෝජනාව වැඩි සැලකිල්ලක් අරගෙන කරලා මුදල් කමිටුවට යොමු කරලා කටයුතු ඉක්මනින් කළ යුතුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මීට පෙර අවස්ථාවන්වලදී එහෙම ප්‍රතිශෝධනය කරන අවස්ථාවල එහෙම නමින් දීපු අවස්ථාවන් තියෙනවා. ඒ නිසා එම ක්‍රමවේදත් ක්‍රමයටත් උපයෝගී කරගෙන කළානම් බැරිවෙන එකක් නැහැ. ඔබතුමා කියනවා නම් අපි කමිටුවක් දාලා හරි කරමු.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අවශ්‍ය උපදෙස් ගමු. මෙහි නීතිමය තත්ත්වයක් තිබෙනවා. මට දැනුනේ විශාල ජනතාවක් මොරටුවේ සැහෙන අසීරුතාවයකට පත්වෙලා ඉන්න යෝජනාවක්. මෙයට ඉක්මනින් විසඳුමක් සොයමු.

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(3) යෝජනාව ඉදිරි කටයුතු සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

## 06. <u>2026 පෙබරවාරි මස ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශන් සළකා බැලීම.</u>

**06(1) 2026.02.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සළකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(5) කරුණ සම්බන්ධයෙන් කතා කරන්නට අවශ්‍යයි. පළමුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙන්න ඕන අපි මොනම මොහොතක හරි ඔබතුමාට දුරකථන ඇමතුමක් ගත්තහම ඔබතුමා ඕනෑම අවස්ථාවක ඒ සඳහා අපිට උපදෙස් ලබා දෙනවා. ඒ සඳහා අපි ඔබතුමාට ස්තුතිවන්ත

වෙනවා මෙම කරුණු සම්බන්ධයෙනුත් මම ඔබතුමා සමග දූරකථනයෙන් කතාකරා හැබැයි ඒ අවස්ථාවේදී ඔබතුමා ළඟ තොරතුරු නොතිබුණත් ඔබතුමා විනාඩි දෙක තුනක් යනකොට මට දැනුම් දීම කළා මේ සාකච්ඡාව කරන්න බැරි වුණා කියලා. ගරු නගරාධිපතිතුමනි ඔබතුමාට තමයි මේ යෝජනාවේ ලිපිය භාර දීලා තියෙන්නේ, හැබැයි බාර දීලා තියෙන්නේ නමවෙනි මාසේ, මම මීට පෙර සභාවේදීත් කිව්වා මේකට පළමුව කරන්න ඕනේ මේ පදිංචිකරුවන්ව ගෙන්වලා සාකච්ඡාවක් කරන්න කියලා මීට මාස දෙක තුනකට කලින් මම කිව්වා. නමුත් මේ වනතුරුත් කිසිම දෙයක් සිදුවෙලා නැහැ. පළවෙනි මාසේ නමවෙනිදා තියනවා ඉඩම් කමිටුව නමුත් මේ ගැන ඒ කමිටුවේදීවත් සාකච්ඡා වෙලා නැහැ. ඊට පස්සේ මේ සිකුරාද තිබුණ කමිටුව හැබැයි ඊට පෙර පදිංචිකරුවන්ව ගෙන්න ගන්න තිබුණා නම් හොඳයි. මොකද මේ පදිංචිකරුවන් කිහිපදෙනාගෙම ගෙවල් තියෙන එකම ළඟ. නැත්තම් ඉඩම් කමිටුවෙන් පස්සේ ආයෙ දිනයක් දෙනකොට තවත් කාලයක් යනවා, මේ කමිටුවටම මේ නිර්දේශය එවන්න පුළුවන්කම තියෙනවා. ඒ නිසා මේ සඳහා ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මෙතන අත්‍යවශ්‍ය වෙන්නේ මම හිතන්නේ පදිංචිකරුවන් දෙදෙනයි ඔවුන් දෙදෙනාම ගෙන්නලා අනිත් පදිංචිකරුවනුත් ඒ ආසන්නයේමයි ඉන්නේ ඔවුන්ටත් මේ පණිවිඩය යවලා මේක සාකච්ඡා කරානම් යම් කමිටුවට කලින් ඊළඟ ඉඩම් කමිටුවේදී මේ සඳහා නිර්දේශය ලබාගන්න පුළුවන්. මේ සඳහා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, 02 (2) යෝජනාව සම්බන්ධයෙන් මට කතා කිරීමට අවශ්‍යයි මේ යෝජනාව පිළිබඳ දැනට තිබෙන්නේ සතුටුදායක තත්ත්වයක්. විශේෂයෙන් මේ සඳහා ස්තුතියි පුදකරනවා අපේ චූලරතන මහත්මයාට, ඒ මහතා නිලධාරියෙක් වශයෙන් ලොකු කැපකිරීමක් කරනවා ඒ සඳහා. ඒ නිලධාරීන් කටයුතු කරන ආකාරය ගැන සතුටට පත් වෙනවා. ඒ යෝජනාව ඉදිරියේදී සාර්ථක යෝජනාවක් බවට පත්කරගන්න බලාපොරොත්තු වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, 02(3) කරුණේ ප්‍රශ්නයක් මතු වුණා අපේ ඉංජිනේරුතුමා පාරවල් සංවර්ධනය කිරීම සඳහා පවරා නොගැනීම හේතුවෙන් ප්‍රශ්න මතුවීමක් ගැන කර්මාන්ත කමිටුවේදී ගැටලුවක් ඉදිරිපත් වුණා. එය ඊට පසුව තමයි ඉඩම් කමිටුවට ආවේ. ඉඩම් කමිටුවේදී අපි මේක දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ඒ අවස්ථාවේදී අපේ නීති නිලධාරීතුමිය කිව්වා 49 වගන්තියෙන් මේක කරන්න බැහැ කියලා. ඊට පසුව අපි එයට විකල්පයක් වශයෙන් 65 වගන්තියෙන් කරන්න බලනකොට, අපේ ශාන්තිනේ වල්ගම මන්ත්‍රීතුමියයි නීති නිලධාරීතුමිය සමග අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා එතනදීත් යම් තැනකදි සාදන පත්‍රයක් සැකසීම සම්බන්ධයෙන් ගැටළුවක් මතුවුණා, සාදන පත්‍රයක් සැකසීම නොතාරිස්වරියක් විසින් සිදු කරන්න ඕනේ, අයිතිය සනාථ කරන්න ඕන. ටයිටල් සර්ච් එකක් කරලා තමයි ඒක කරන්න ඕනේ එතකොට අපිට ඒකටත් ලොකු ගෙවීමක් කරන්න වෙනවා ඒ ලෝයටත්, එම ක්‍රමයත් ප්‍රායෝගික නොමැති නිසා ඊට පසුව ලේකම්තුමා කැස්බෑව නගර සභාවෙන් ඒගොල්ලෝ පාවිච්චි කරන සරල ගිවිසුමක් සම්බන්ධයෙන් එදා ඉඩම් කමිටුවේදී ඉදිරිපත් උනා ඒ අවස්ථාවේදී එතැනදී අපි තීරණය කරා මේ 49, 65 කියන වගන්ති සඳහන් නොකර අපි සරල ගිවිසුමකින් නගරාධිපතිවරයාට ප්‍රවේශ අයිතිය භාර දීලා ඉල්ලීමක් මත අනාගතයේදී පාරවල් සංවර්ධනය කිරීම සඳහා භාරගන්න කියලා. මම ඉතින් හැම දෙනාගේම ඉල්ලා සිටිනවා සාදන පත්‍රය හොඳින් කියවලා බලලා මේ විදිහට කටයුතු කරන්න හැමදෙනාම එකඟ වෙමු කියලා. එතකොට අපිට මේ වැඩේ සරලව කරගන්න පුළුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනී, එම කරුණු සම්බන්ධයෙන් වැඩිදුර කතා කරනවනම් පනතේ පැහැදිලිව සඳහන් වෙලා තියෙනවා කොහොමද කළ යුත්තේ කියලා. පාරක් පවරාගන්නවා නම් ඒ අදාළ බිමේ අයිතිවාසිකම තියෙන පුද්ගලයාට පමණයි ඒක ලබා දෙන්න පුළුවන්. අපි නගර සභාවෙන් පාරක් පවරා ගන්නවා සියලු දෙනාම අත්සන් කරලා ඒ ක්‍රමය වැරදියි. ඒක තමයි අපි මේ සභාවේදී සඳහන් කළේ.

දැන් තුසිත් මන්ත්‍රීතුමා කියනවනම් කැස්බෑව නගර සභාවේ ගිවිසුමකින් කරනවා කියලා ඒකත් නීත්‍යානුකූල නැහැ. හේතු අපේ පනතේ පැහැදිලිව සඳහන් වෙනවා මම ඔබතුමාට ඉල්ලීම කරන්න කැමතියි මේ සම්බන්ධයෙන් පළාත් සභාවට ආණ්ඩුකාරතුමාට ලියන්න කියලා ඊට පසුව එතුමාගේ ඩිරෙක්ෂන් එකක් අරගෙන මේක කරන්න කියලා, නැත්නම් මේක නීතියට පටහැනියි හරි නම් මේකට සංශෝධනයක් ගෙනල්ලා අනු නීතියක් සම්මත කරගන්න ඕනේ. පහුගිය පාලන තන්ත්‍රය ඇතුළත සියලු දෙනාම අත්සන් කරලා පාරවල් සංවර්ධනය කරපු ක්‍රමය කරාට ඒක වැරදියි. දැන් ඔබතුමන්ලා කියනවනම් ගිවිසුමකින් පවරගන්න කියලා ඒක ඊටත් වඩා වැරදියි. මේක කරගෙන යාමේ අවශ්‍යතාවය තියෙනවා නම් මේක ඉහලට ලියලා මේ සම්බන්ධයෙන් නීති නිලධාරියට කියන්න එතන නීතිය අංශයක් තියෙනවා එතනින් උපදෙසක් ගන්න කියලා. නැත්නම් මෙතැනදී ඔඩිට් කුවරි එකක් ආපු වෙලාවක ඔබතුමාට නීතිය අභිබවා කටයුතු කිරීම කියන වරද එනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනී, පළාත් පාලන ආයතනයෙන් අපිට විශාල පැහැදිලි කිරීමක් අපට කරල තියෙනවා. අපි ඒ ලියුම සලකා බලලා තමයි මෙතනට ආවේ ඒකේ කියන්නේ මේ කිසිම ලෝයර් කෙනෙක්ගෙන් ඇහුවත් මේ ආඥා පනතට පිටින් කිසිම දෙයක් කරන්න කියලා කියන්නේ නැහැ. ආඥා පනත ගත්තහම සොයිල් රයිට් තියෙන කෙනෙකුට පමණයි පාර පවරාදීමේ අයිතිය තියෙන්නෙ. සොයිල් රයිට් තියෙන මිනිස්සු නැහැ හොයන්න මේ කාලෙකට ඉස්සෙල්ලා වතු වෙන්දේසි කරලා ඉඩම් වල මිනිස්සු ගෙවල් හදලා ඒ ඉඩම්වල අයිතිකාරයෝ දැන් නැහැ. උදාහරණයක් විදිහට වොට්සන් පීරිස් මාවත ගත්තකෝ, වොට් පීරිස් මාවතේ අයිතිකාරයි ඉන්නවද, මැරිලත් දැන් අවුරුදු පනහකට වැඩියි. හැබැයි ගිය රජයන් කාලෙදිත් මේ පවරා ගැනීම් කරලා තියෙන්නේ ඉතාමත් සරල විදිහට. මේ සඳහා කිසිම ගැටලුවක්වත් කවදාවත් ඇවිල්ලා නැහැ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සභාවේ මතුවෙන කාරණයි, භූමිවල ඇතිවෙලා තිබෙන තත්ත්වයයි නිසා ඇත්තටම ජනතාව විශාල ලෙස තමන්ගේ මාර්ගය සංවර්ධනය කර ගැනීමට පෙර ගැටළු වලට මුහුණ පානවා, අපිට සමහර පාරවල් පවරා ගැනීමට සිද්ධ වෙනවා, පවරා ගැනීමට යෑමේදී අපිට මෙන්න මේ ගැටලුව මතු වෙනවා. ඒ ගැටලුව විග්‍රහ කර ගැනීමේදී නීතිමය උපදෙස් අරගත්තත් තාමත් මම කියන්නේ අපිට පිළිගත හැකි මට්ටමේ හොඳම විසඳුමක් තවමත් හම්බ උනේ නැහැ. ඒ නිසා මට හිතෙන්නෙ අපි තවදුරටත් අපි මන්ත්‍රීතුමිය කිව්වා වගේ තවදුරටත් අදාළ පාර්ශව සමග සාකච්ඡා කරලා යම් නීතිමය පැත්තේ තිබෙන ගැටලු තිබෙනවා නම් ඒවා නිරාකරණය කරගෙන යා යුතුයි. හැබැයි මේ ඉක්මණින් කරගත යුතුයි.ඒ නිසා 02(3) කරුණ සඳහා ඊලඟ කමිටුවේදී ක්‍රියාමාර්ග අරගෙන ඊලඟ මහා සභාවට එවන්න කියලා කියනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනී, ඒ කාරණය සම්බන්ධයෙන් අපි කමිටු සාමාජිකයෙකු විදිහට මෙතුමට පැහැදිලි කිරීමක් කරා. මොකද මෙතුමා කියන හැමදෙයක්ම අපිට පිළිගන්න බැහැ කමිටුවේදී. මොකද එතුමා නවකයෙක් දේශපාලනය පැත්තෙන් පරිපාලන පැත්තෙන් අත්දැකීම් අඩුයි. එතුමා අපි කියපු දේ පිළිගත්තේ නැහැ. අපි ඒ අවස්ථාවෙදීත් පැහැදිලි කළා ඔබතුමාගේ තනි තීරණ ගැලපෙන තීරණ නෙමෙයි කියලා. පැහැදිලිව අපි ඔබතුමාගේ සභාපතිතුමාට ඒ පිලිබඳව සඳහන් කළා. අපි එතුමටත් කිවුවා ඔබතුමා අමාරුවේ වැටෙන්න එපා සමහර තීරණ නායකත්වය සමඟ එකතු වෙලා රාමුවක් ඇතුලේ අපි ගතයුතුයි. මොරටුවේ ජනතාවගේ පවුල් පනස් පහන්දාහකගේ ප්‍රශ්නයක් තමයි මෙතන තියෙන්නේ. මේ ප්‍රශ්නය එක එක්කෙනාට අවශ්‍ය විදිහට තීරණ අරගෙන තීන්දු අරගෙන කරන්න පුළුවන් දේවල් නෙමෙයි. අනිත් එක නෛතික රාමුව පිළිබඳ නොදැනි කතා කිරීම අපි බෝහෝ අවස්ථාවන් වල කමිටුවේදී අපහසුතාවයට පත්වෙනවා. මේ සඳහා අපිට විශේෂ රැස්වීමක් අවශ්‍යයි කියලත් අපි කිවුවා. නමුත් අපිට අද වෙනතුරු මේ සම්බන්ධයෙන් කිසිම දැනුවත් කිරීමක් ලැබිලා නැහැ. මම සභාපතිතුමාට පැහැදිලිව කිවුවා අපි මේ කරුණට විරුද්ධයි කියලා, කියන විදිහට හැමදෙයක්ම කරන්න බැහැ. තමන්ගේ අවශ්‍යතාවයන් මත දේවල් කරන්න බැහැ. සමස්ත මොරටු ජනතාවගේ ජීවන තත්ත්වය සම්බන්ධ ගැටළුවක් මේක. එම නිසා අවශය අයගෙන් උපදෙස් අරගෙන මේ සම්බන්ධව කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මේ පාරවල් පවරා ගන්නේ අපි අද ඊයේ නෙමෙයි. මෙය දීර්ඝකාලයක් තිස්සේ කරගෙන ආපු දෙයක්. එක ගිවිසුමක් පෙන්නන්න කියලා කියන්නකෝ 49 හෝ 65 ගිවිසුම් වලින් කර ගත්ත එකක්. මේ අය මේ කාලයක් තිස්සේ ඉඳලා මේ විදිහටම කරලා දැන් අපේ කුකලෙන් අදින්නයි මෙක කරන්නේ. අපිට සංවර්ධනය කරගන්න බැරිව අපිට ජනතාවගෙන් බැනුම් අහන්න වෙනවා. 49, 65 වගන්ති දෙකෙම මේක කරන්න ප්‍රොවිශන් එකක් නැහැ, මොච්නු මේ විරුද්ධතාවය පෙන්නන්නේ සත්භාවයෙන් නෙමෙයි. කිසිම ලොයර් කෙනෙක් කවදාවත් කියන්නේ නැහැ ආඥා පනතෙන් පිට දෙයක් කරන්න කියලා. අපිත් කියන්නෙත් නැහැ, හැබැයි අපි කියන්නේ අපිට ජනතාවට දෙයක් කරන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් අපි කොච්චර තර්ක කරත් පනතට පරිබාහිරව වැඩ කරන්න බැහැ තුසිත් මන්ත්‍රීතුමා කියනවා වගේ වැඩේ කෙරෙන්නත් ඕනා. මේකට හොඳම දේ තමයි අපි මෙතෙක් කල් කරපු ක්‍රමවේදයක් තියෙනවානෙ. ඒ ක්‍රමවේදය අභියෝගයකට ලක් වෙලා නැහැ. අපි ඒ කරපු ක්‍රම වේදය හරිද වැරදිද කියලා නැවත වරක් අහගන්න අපිට පුලුවන් ආණ්ඩුකාරවරයාගෙන් පාලිත මහත්තයාගෙන් අහලා හරියන්නෙත් නැහැ. ආණ්ඩුකාරවරයාගෙන් ලිඛිතව ගන්න ඕනා අපි කුමක්ද මේකට කරන්න ඕනා කියලා.

<u>ගරු නගරාධිපතිතුමා - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ අවස්ථාවේදී මම හිතන්නේ හොඳම දේ තමයි ඊළඟ කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කරන එක.

<u>මහා නගර සභා මන්ත්‍රී - එච්. චන්දන පී. විතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව බල ප්‍රදේශයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ හිමිකම සහතික කිරීම යටතට යටත් කරලා තියෙනවා. එතකොට රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මේ සම්පූර්ණ ප්‍රදේශයේම ආවරණය කරන පරිදි මිනුම් කටයුතු කරල තියෙනවා. හැම පාරක්ම හැම නිවාසයකටම යන ඉඩම් ඒකකයක්ම මිනුම් කරල තියෙන්නේ. මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කැඩැස්තර පැහැදිලිව මේ ඉඩම් කැබලි අංක කරලා තියෙනවා. ඒ අංක වීමට යටතේ හැම පාරක්ම අංක වෙලා තියෙනවා. ඒ අනුව ඒ පාර පෞද්ගලික පාරක් නම් ඒ පාරට මාර්ග ප්‍රවාහන අයිතිය තියන අය කවුද කියන එක ඒ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ කැඩැස්තර සිතියම් වල තියෙනවා. ඒ පාරවල් වල අයිතිවාසිකම් තියෙන්නෙ කවුද කියන එක අවසාන වශයෙන් තීරණය වෙන්නෙ එතනින්. අපිට ඒ තොරතුරු අරගෙන ඒ මත කටයුතු කරන්න හැකියාව තියෙනවා. ඒක තමයි වඩාත් සාර්ථක ක්‍රමය.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2 (8) කරුණ නාගරික ඉංජිනේරු විසින් ඉදිරිපත් කරලා තියෙන්නේ. උයන පාර මොරටු මාර්ගයට සම්බන්ධ අතුරු මාර්ග සංවර්ධනය කිරීම. මෙය පැහැදිලි නැහැ. මොරටු පාර කියන්නෙ මොන පාරද කියලා.

<u>ගරු නගරාධිපතිතුමා - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, එකොළොස් වන මාසයේ 11 වැනි දිනැති කමිටුවේ වාර්තාවේ ඇමුණුම 06 සඳහන් වෙනවා. ඔබ අප කවුරුත් දැන් යම් අපහසුතාවකට පත්වෙනවා මේකට අදාළව මේ මාර්ග මොනවාද කියලා දිගටම පවත්වාගෙන ආවා නම් හොඳයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගෙන් ඇහුවේ උයන පාරයි මොරටු මාර්ගයයි සම්බන්ධ කරන මාර්ගය පිළිබඳවයි අපි කතා කරන්නේ. ඒ පාරවල් ලේඩි සොයිසා ඩ්‍රයිව් වල සම්බන්ධ වන පාරවල්ද කියලා මම අහන්නේ. මොරටු පාර කියලා හඳුන්වන්නේ මොකක්ද කියලා මට දැනගන්න අවශ්‍යයි.

<u>ගරු නගරාධිපතිතුමා - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඉල්ලීමක් ආපු එකක් තමයි කමිටුවට යොමු කරලා තියෙන්නෙ ඉංජිනේරුව හම්බවෙලා ඒක නිවැරදි කරගන්න.

**2026.02.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2026.02.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 02(2), 02(4), 02(8), 02(10) කරුණු වලට පක්ෂවත්, අංක 02(3) ට විරුද්ධවත් අනෙකුත් සියලුම කරුණු වලට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |

12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිලිනි නෙත්සරණි මෙනවිය

**2026.02.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

01. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
02. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.02.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.02.06 දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා)

**06(2) 2026.02.06 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද එච්. අබේකෝන් මහතතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2(3) සිරි සුහසාධක සංගමයේ ලිෆ්ට් හදලද කියලා දැන ගන්න අවශ්‍යයි. ඒ වගේම මේන් ඩෝ එක හදලා ඉවරද, 2(4) දිගරොල්ල පොළ භූමිය සම්බන්ධව ඔබතුමාලා ස්ථානීය පරීක්ෂණයක් කරා. එහි සංවර්ධනය කරන්න ඕනි මොකක්ද කියල දැනගන්න කැමති.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැනට මාණයක් මාලු ලැල්ල නිසා තේරුමක් නැති විදිහට අත්හැරලා තියෙන්නෙ. ඊළඟට අර දෙපැත්තටම බක්කි දාලා තියෙන එක විසින් සහ සමහර වෙළඳුන්ගේ යම් යම් හිතුවක්කාරකම් නිසාත් මේ පොළට එන මිනිස්සුන්ට ගමන් කරන්න තියෙන බාධාව විශාල එකක්. ඒ නිසා කල්පනා කරනවා සාකච්ඡා කරනවා කොහොමද අපි දැනට මේ ඉන්න වෙළඳුන්ට නිදහසේ වෙළඳාම කරගන්නත් මාර්ගය බාධා නොවෙන ලෙස දෙපැත්තෙන් පළල් කරගෙන කොහොමද මේ කටයුත්ත කරන්නෙ. හරි අපරාධයක් සිදු වෙමින් තියෙන්නේ සිදුවෙමින් තිබෙන්නේ එකක් අර වැසිකිලි පද්ධති තුලත් ලොකු ගැටලු සහගත තත්වයක් තියෙනවා. වැසිකිලිවල වෙනස්කමකුත් අදහස් කරනවා

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද එච්. අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපිට වඩා ඔබතුමා තමයි දන්නේ හොඳටම ඒ නිසා අනිවාර්යෙන්ම හොඳ දෙයක් කරන්න. කරුණු අංක 2(6) කොරලවැල්ල ක්‍රීඩාංගන මාවතේ ඇති පුස්තකාල ගොඩනැගිල්ල අලුත් වැඩිය හා සම්බන්ධවයි. ඒකෙ දැනුම් දීල තියෙනවා මේ අලුත්වැඩියා පැත්තට හැරිලා තියෙන්නේ කඩාවැටෙන්න ළඟයි කියලා. ඒ සම්බන්ධව ස්ථාන පරීක්ෂණයක් කරලා තියෙනවා. තීන්දුව දීලා තියෙන්නේ උක්ත කරුණ සලකා බැලූ කමිටුව, බස්නාහිර පලාත් සභාවේ ව්‍යුහාත්මක

ඉංජිනේරුවකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට නිර්දේශ කරන ලදී කියලා. මේක වෙලා තියෙන්නේ පුස්තකාල ගොඩනැගිල්ල සම්බන්ධව ඒකට ඇස්තමේන්තුවක් තියෙන්න ඕන. එතන නිර්දේශයක් තියෙන්න ඕනේ සභාපතිතුමිය. මොකක්ද වෙලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ක්‍රීඩාංගන මාවතේ තියෙන පුස්තකාලේ ගොඩනැගිල්ලේ ස්ථානයට වෙනත් කටයුත්තකට ගිය අවස්ථාවක ඒ පුස්තකාල භාර නිලධාරියා පෙන්නුවා මේක පොඩ්ඩක් ඇදවෙමින් තියනවා කියලා. මේකට අදාලව ස්ථානීය පරීක්ෂණයක් අපේ ටීඕ මහත්මිය විසින් සිදු කරලා මාස කිහිපයක් මේ කරුණ මේ කමිටු වාර්තාවේ ගියා ස්ථානය පරීක්ෂණයක් සිදුකරලා ඒ තාක්ෂණ නිලධාරීතුමිය කියනවා එහෙම තත්ත්වයක් ඒ ගොඩනැගිල්ලෙන් නැහැ කියලා. වැඩිදුරටත් තව මේ ගොඩනැගිල්ල පරීක්ෂා කිරීම සඳහා තමයි අපි මේ ව්‍යුහාත්මක පරීක්ෂණය සඳහා ඉංජිනේරු වරියෙක්ගේ සහයෝගය ලබාගන්න ඕන. මේකෙ ඇස්තමේන්තුවක් අපිට හදන්න විදිහක් නැහැ මොකද මේ තාක්ෂණ නිලධාරිතුමිය කියනවා. අපි ගිය වෙලාවක පුස්තකාල නිලධාරී අපිට පෙන්නුවා මේක මෙහෙමයි කියලා. අපි ඒක නිසා කමිටුවට යෝජනාවක් විදියට ගෙනාවා ඒකේ කේසින් එකක් ඇද වෙලා තියෙනවා. එයා ඒක පෙන්නලා තමයි කිව්වෙ කේසින් ඇද වෙලා තියෙන්නේ මේ බිල්ඩින් එක ඇදවෙන හින්ද වෙන්න ඕනේ කියලා. මොකද ඒක තට්ටු දෙකේ ගොඩනැගිල්ලක්. එයා කිව්වා පහුගිය පාලන කාලේ මේකේ හරියට කණු දාන්නෙත් නැතුව පරණ ගොඩනැගිල්ලක් උඩ තමයි මේක නග්ගල තියෙන්නෙ කියලා. එකෙ හොඳට අපි මේක කමිටුවට ගෙනාවා. අදාල පරීක්ෂණයක් කරන්න කියලා. අබලන් තත්ත්වයක් තියනවානම් ඒක කඩිනමින් අලුත්වැඩියා කටයුතු වලට යොමු කරන්න. ගියපාර කමිටු වාර්තාවෙ තියෙනවා ටීඕගෙ නිර්දේශය. එහෙම තත්ත්වයක් නැහැ කියලා. නමුත් අපි මේ කරුණ කමිටුවෙන් ඉවත් කරන්නෙ නැතුව මේ ව්‍යුහාත්මක ඉංජිනේරු වරයෙකුගේ උපදේශන සේවයක් ලබාගෙන මේක හරියටම පැහැදිලි කරගන්න ඕන.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ ක්‍රමවේදය හරි හැබැයි අපිට තියන අත්දැකීම ඇතුලේ මේ ගොඩනැගිල්ල අලුතින් හැදුවේ. බොහොම මෑත කාලයේ හදපු ගොඩනැගිල්ලක් මමත් පෞද්ගලිකව ගිහිල්ලා බැලුවා එය ඉදිකිරීම් වල යම් ගැටළු ප්‍රමාණයක් තියෙනවා.නමුත් අර කියන විදිහට මේක කිසිම විදිහකට කඩාගෙන වැටෙන බවක් අපිට පේන පෙනුමට නැහැ. එහෙම ප්‍රශ්නයක් නෑ හැබැයි ඒ අදාල දැනුම තියෙන අපේ ටි ඕ මහත්මියගේ වාර්තාව ඇතුලේ කියනවා නම් එහෙම නැහැ කියලා එතනින් ඔබ්බට අපි යන්න ඕන නැහැ කියන එක තමයි මගේ අදහස. මේ ආපු තොරතුර දීපු කෙනා අර බෙලි ගෙඩියක් වැටුනම අහස කඩාගෙන වැටුණා කියලා දැන් ඔක්කොම දුවනවා. කමිටුව විදියට මේ ගත්තු ක්‍රමවේදය නිවැරදියි හැබැයි ඉතින් ආපහු සැලකිල්ලට ලක්කරලා අපේ ටිඕ මහත්මිය එක බලලා කරලා ඇගේ දැනුමෙන්නේ අපට මේක කියන්නේ. එක දෙගිඩියාවට ලක්වෙන්න හේතුවක් නැහැ නව ගොඩනැගිල්ලක් නිසා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධව මීට පෙරත් ඇත්තට කොරළවැල්ලේ වෛද්‍ය මධ්‍යස්ථානය මේ ස්ථානයට රැගෙන යන්න කරපු සාකච්ඡාව අතරතුරෙදීත් මේ ගැන මතුවුණා. පහුගිය පාලනය කාලයේදී හදපු එකක්, එතනදී කණු යන්න ඕන ප්‍රමාණයකට ගිහිල්ල නැති එක තමයි ගැටළුව. මේ වාර්තාවත් එක්ක ඒක සොයා බැලීමක් කරලා පටන් ගන්නවානම් හොඳයි මොකද ඊට පස්සේ අනතුරක් වුණාම කතා කරලා වැඩක් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(11) යෝජනාව අපේ යෝගේෂ් මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ, එතුමා ශ්‍රද්ධාවෙන් ඉදිරිපත් කරපු යෝජනාවක් හැබැයි ලුනාව මංසන්ධිය කියන්නේ පටු ස්ථානයන්. මෙතන බස් හෝල්ට් එකක් ඉදිකරන්න පුළුවන් ස්ථානයක් මම හිතන්නේ නැහැ තියෙනවා කියලා. එතන 3 වෙනි ඇමුණුම බලන්න ඒකෙ වෙනත් කරුණක් සම්බන්ධව තමයි තියෙන්නේ. එතන මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියටත් ඉදිරිපත් කිරීමක් කරලා තියෙනවා නගරාධිපතිතුමා මේ යෝජනාව සම්බන්ධව. පටු මාර්ගයක අපිට බස්හෝල්ට් එක හදන්න පුලුවන් අවස්ථාවක් තියනවාද?

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කමිටුවේදී ඒක සාකච්ඡා කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, 9 වෙනි කරුණ සුව ශක්ති ප්‍රජාමණ්ඩල තියෙනවා. ප්‍රජා ශක්ති වෙනම තියෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කරන එක. සුව ශක්ති ප්‍රජා මණ්ඩල නගර සභාවෙන් පිහිටුවන එක.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ නගර සභාවෙන් පිහිටුවන ප්‍රජා සංවර්ධන අනුබද්ධිත කමිටුවක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, ඇයි මේකට කොළඹ දිස්ත්‍රික් අනුමැතිය අවශ්‍ය වෙන්නේ. මෙය පනත යටතේද තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කිරීම සඳහා ව්‍යවස්ථාවක් තියෙනවා. ඒකට අනුව ප්‍රජා මණ්ඩල ලියාපදිංචි කරන්න ඕන. මම ඔබතුමියට ඒ ව්‍යවස්ථාව ලබා දෙන්නම්. මේක නගර සභාව මගින් කරන සමිතිය. මම ඔබතුමියට හෙට ව්‍යවස්ථාව දෙන්නම්. මේක ඒ ක්‍රමවේදයට අනුව යන සමිතියක්.

<u>මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 02(8) යෝජනාව මම ඉදිරිපත් කරපු යෝජනාවක්, ඒ සම්බන්ධයෙන් මට දැනගන්න අවශ්‍යයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, අපි මේ පිළිබඳව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට යොමු කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. ඩබ්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2(12) යෝජනාව දැයට පිපෙන පෙර පාසල කිතලන්දළුව සම්බන්ධව යෝජනාව සම්මත වෙලා තියෙන්නෙ 2025.08.12 මේකෙ තාම කිසිම ප්‍රගතියක් නැහැ. එහි තත්ත්වය පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, බොහොම ඉක්මනින් වැඩ පටන් ගන්නවා.

**2026.02.06 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |

13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්. කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්. කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ. ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.02.06 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කරුණු අංක 09ට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ලබා දීමෙන් වැළකී සිටිය අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - පී. සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිලිනි නෙත්සරණි මෙනවිය

**2026.02.06 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 2(8) හා 2(9) කරුණු වලට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ලබා දීමෙන් වැළකී සිටිය අතර අනෙකුත් සියලුම කරුණු වලට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.02.06 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.02.06 දින පැවති මහජන උපයෝගීතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා) |

**06(3) 2026.02.09 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2026.02.09 දින පැවති ආයතන හා නීතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්. පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි. ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්. කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ. ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2026.02.09 දින පැවති ආයතන හා නීතිය පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ අංක 09 කරුණට විරුද්ධවත්, අංක 03 අංක 07 යන කරුණු වලට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ලබා දීමෙන් වැළකී සිටිය අතර අනෙකුත් සියලුම කරුණු වලට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජේ.ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |

10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
15. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
17. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. මනෝජ් මධුරංග විජයරත්න මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
19. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිලිනි නෙත්සරණී මෙනවිය

**2026.02.09 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.02.09 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.02.09 දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා

**06(4) 2026.02.10 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ගිය මාසයේ සෞඛ්‍ය කමිටුවේ වාර්තාවට වාණිජ කසල පිළිබඳව සහ ද්‍රව්‍ය ප්‍රතිශෝධන මධ්‍යස්ථානයේ ඒ වාර්තාව ඉදිරිපත් කරන්න බැරි වුණා. ඒ අදාල විෂය කරන මහත්මිය දැඩි ලෙස රෝගාතුර වීම නිසා එය ලබන කමිටුවට ඒ මාසයේ එකත් එක්ක අපි ඉදිරිපත් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, කලවම් කසල අදින වැඩේ මොකක්ද දන්නේ නැහැ වුනේ? සමහර කලවම් කසල ඇදලා කුණු වත්තට යනවනෙ. කුණු වත්තත් ප්‍රශ්න ගොඩක තියෙන්නෙ. අපි මොරටුවක් විදියට අපි කරගෙන ආව වැඩේ කරගෙන යන්න ඕනේ නැත්නම් ආයෙත් අර තැන් තැන්වල කඩවල් වලට තමයි කට්ට්ට බෙදලා ගන්න කුණු ටික ප්ලාස්ටික් ටික පොලිතින් ටික යන්නෙ. ඔබතුමන්ලා නිසියාකාර වැඩපිළිවෙලක් හදලා නැහැ කියලා මම හිතනවා. මම දිගින් දිගටම කියන්න යන්නෙ නැහැ. චෝදනාවක් එල්ල වෙයි මිනිසුන්ගෙන්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 2(10) සම්බන්ධයෙන් ද්‍රව්‍ය ප්‍රතිසාදන පහසුකම් මධ්‍යස්ථාන තුළ පවතින ගැටලු සම්බන්ධයෙන් ඉදිරිපත් කරලා තියෙනවා මහජන සෞඛ්‍ය පරීක්ෂක එන්. එච් විජේසිරිවර්ධන මහතා විසින් ඉදිරිපත් කරපු කරුණු එකොළහක් තියෙනවා. එහි කමිටු නිර්දේශය තියෙන්නේ උක්ත කරුණ සලකා බැලූ කමිටුව බේල් කිරීමේ යන්ත්‍ර හතරක් මේ වන විට ක්‍රියාත්මක මට්ටමේ පවතින බව නාගරික

යාන්ත්‍රික ඉංජිනේරු කමිටුවට ප්‍රකාශ කළ අතර අනෙකුත් යන්ත්‍රද කඩිනමින් අලුත්වැඩියා දෙන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු වෙත පැවරීමට නිර්දේශ කරන ලදී. නමුත් කරුණ අංක 01 සේවය දිරිගැන්වීමේ යම් දිරි දීමනාවක් ඇත්නම් ස්ථිර සහ ශ්‍රම මිලදී ගැනීම් සියලු දෙනා සඳහා එම දීමනා ලබාදෙන ලෙසට ඉල්ලා සිටිමි. අංක 02, 2025.08.22 දින පැවති වෛද්‍ය පරීක්ෂණයේදී වෛද්‍යවරයා විසින් නියම කල ඖෂධ වර්ග ලබාදීමට හැකියාවක් ඇත්නම් එම ඖෂධ ලබාදෙන ලෙස මෙයින් ඉල්ලා සිටිමි. මේ වෙනකොට ලෙඩක් තිබුනා නම් මැරිලත් ඉවරයි. ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානය තුළට රැගෙන එන පොලිතීන් සහ රෙදි සමග යකඩ ටින්, ප්ලාස්ටික්, බැටරි වැනි වෙනත් කසල මිශ්‍රවී පැමිණෙන බැවින් සියලු කලාප සඳහා නිවාස දැනුවත් කිරීමේ වැඩසටහනක් අත්පත්‍රිකා බෙදීම ප්‍රචාර රථයක් යොදාගෙන නිවේදන කටයුතු කිරීම සිදුකළ යුතුවේ. වරහන් ඇතුලේ ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානය තුළ සිදුකළ යුත්තේ කසල වර්ග කිරීමයි. කසල කලවම් නොකර වෙන්කර රැගෙන ඒම කලාපවල වගකීමකි. අංක 04 බාහිරෙන් පැමිණෙන ආයතන වලින් පැමිණෙන සේවකයින් සඳහා තේපැන් සංග්‍රහයක් ලබාදීමට යම් මුදල් ප්‍රමාණයක් වෙන් කිරීම. 05 ද්‍රව්‍ය ප්‍රතිසාධන පහසුකම් මධ්‍යස්ථානය සඳහා ප්‍රථමාධාර පෙට්ටියක් සකස් කිරීමට ඉල්ලා ඇත. එය තවමත් ලැබී නොමැත. ඒ සඳහා අවශ්‍ය ඖෂධ වර්ග ලැයිස්තුවක් ද ඉල්ලා ඇති නමුත් එම ඖෂධ තවමත් ලැබී නැත. 06 ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගැනීම කාර්යක්ෂමව කර ගැනීම. 07, සේවකයන් සඳහා කසල කළමනාකරණය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීමට අවස්ථා ලබාදීම. 08, කරදියාන කසල අංගනය වෙත වෙනත් කසල යැවීම සඳහා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය වෙනුවෙන් වෙන්කල ටිපර් රථයක් හෝ ටැක්ටර් රථයක් ලබා ගැනීම. 09 පොලිතින් කොටස්වලට වෙන්කර වෙන් කිරීම සඳහා මේස දෙකක් වත් අමතරව අවශ්‍ය වේ. වෙන්කළ පොලිතින් ඇඹරීම සඳහා කොටස් කිරීමට ඇඹරීමේ යන්ත්‍රයක් මිලදී ගැනීම 10. අඹරන ලද පොලිතීන් උණුකර ඉන් පෙර පසු පෙර සැකසූ අච්චුවක් භාවිතා කර යම් නිර්මාණයක් සිදු කිරීම. උදාහරණ මල් පෝච්චි. එම නිර්මාණය විකිණීමෙන් වැඩි මිලක් ලබා ගැනීමට හැක 11 දැනට කරදියාන කසළ අංගනය වෙත වෙනත් ප්ලාස්ටික්, බෑග්, සපත්තු විකිණීමට ගැනුම්කරුවන් සොයා ගැනීම එසේ නොමැති නම් විශාල මුදලක් වැය කර එම කසළ බැහැර කිරීමට සිදුවේ. නිර්දේශය උක්ත කරුණ සලකා බැලූ කමිටුව බේල් කිරිමේ යන්ත්‍ර හතරක් මේ වන විට ක්‍රියාත්මක මට්ටම් පවතින බව නාගරික යාන්ත්‍රික ඉංජිනේරු කමිටුවට ප්‍රකාශ කළ අතර අනෙකුත් යන්ත්‍ර ද කඩිනමින් අලුත්වැඩියා කරන ලෙස නාගරික යාන්ත්‍රික ඉංජිනේරු වෙත පැවරීමට නිර්දේශ කරන ලදී. මේක බලන්නේ නැතුවද මේ කමිටු නිර්දේශය දීලා තියෙන්නේ. කමිටු නිර්දේශය අනිවාර්යයෙන් වෙනස් වෙන්නට ඕන. හැබැයි 2025.08.22 මේ තමයි මේක වෙලා තියෙන්නෙ. 2025.09.17 දිනැතිව තමයි කමිටුවට මේක දාලා තියෙන්නේ. ඉෂ්ඨ කරන්න පුළුවන් දේවල්. කමිටුව තාමත් ඉෂ්ඨ කරලා නැත්නම් සෝචනීය තත්ත්වයක් තියෙන්නේ.

ගරු නගරාධිපතිතුමනි, 02(15) ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක මගින් පරිපාලක ඒ. බී. එරන්ද අනුරාධ මහතා විසින් කමිටුව ඉදිරිපත් කරන ලද පහත සඳහන් ලිපිය සලකා බැලීම. පොහොර මුදල් ලබා ගැනීම සඳහා පහත නම් සඳහන් රියදුරු මහතුන් ඔවුන්ගේ කලාපවල කානු පස්වලට අමතරව රියදුරන් නොමැති අවස්ථාවන්වල එම කොට්ඨාශවල කසල ප්‍රවාහනය සඳහා මුදල් බැඳි ආයතන වලද කසළ ප්‍රවාහනය සිදුකරනු ලබයි. කසල ප්‍රවාහනය කරන රියදුරන් හට ලබාදෙන පොහොර මුදල ඔවුන් විසින් ඉල්ලා සිටින ලදී. ඒ නිසා එම රියැදුරු මහතුන් දෛනිකව රාජකාරි වලට අමතරව ඔවුන්ගේ කලාප වල ද කසල ප්‍රවාහනය සිදුකරන බැවින් එම රියදුරු මහතුන්හටද පොහොර මුදල ලබාදීමට සුදුසු බව සටහන් කොට ඉදිරිපත් කරමි. එරන්ද කියන මහත්මයා මේක දාන්නේ. අංක 01 යූ. සචින් ධනංජය කටුබැද්ද කලාපය අංක 02 සී. රොෂාන් අංක 03 තිළිණ මධුසංක මොරටුමුල්ල කලාපය. කමිටු තීන්දුව වෙලා තියෙන්නේ උක්ත කරුණු සලකා බැලූ කමිටුව ඉහත නම් සඳහන් සේවක මහතුන්ට පොහොර මුදල් ගෙවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා පලාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බැවින් ඉදිරි කටයුතු ලිපිගොනුවෙන් සිදු කිරීමට යටත්ව මෙම කරුණ වාර්තාවෙන් ඉවත් කිරීමට නිර්දේශ කරන ලදී. මේ සේවකයන්ට පොහොර සල්ලි දෙන්න මොකටද පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය. ඒ නිසා කරුණාකරලා මේ සේවකයො කුණු අදිනවා නම් එම සේවකයන්ට, මෙයට සභා තීන්දුවක් තියෙනවා. ඒ සේවකයන්ට දෙන්න පුලුවන්. බොරු කමිටු නිර්දේශ තමයි මේවට දාලා තියෙන්නේ. අනිත් එක තමයි "නිමා කරනු මිස වැඩ ඇති තමා වෙත පමාවට කරුණු මට උවමනා නැත" කියලා

කවියකුත් තියෙනවා. ඒ නිසා මේ ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය කියලා කියන්නේ නගර සභාවට ආදායම් උත්පාදනය කරන ප්‍රධාන ස්ථානයක්. මේ ස්ථානයේ මාසිකව කවුරුහරි ලෙඩ වුනා කියලා. ලෙඩ වුන නිසා වාර්තාව ඉදිරිපත් කරගන්න බැරිවුණා කියන එක නිදහසට කරුණක් නෙවෙයි. කරුණාකරලා මේකෙ ලක්ෂ අටයි ගානක් ආව කියල ඉවරවෙලා මුදල් කමිටුව සඳහන් වෙනවා. ඒක ආවෙ කොහොමද කියලා කරුණාකරලා මේ සභාවට ඉදිරිපත් කරන්න ඕන. මේක දැන් ලබන සභාවේදීවත් ඒ අදාළ මාස දෙකේම ඉදිරිපත් කරන්න. මොකද හේතුව මේක මගහැරීම නිදහසට කරුණක් නෙමෙයි. එතකොට අපිට කියන්න වෙන්නෙ මේක දැන් ආපහු මොකක් හරි වංචාවක් පටන් අරන්ද කියලා. ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ නගර සභාවට ස්වර්ණා මන්ත්‍රීතුමිය 2025.09.17 ඉදිරිපත් කරනවා ජලය බැසයාමේ තත්ත්වයක් තියෙනවා ඩෙංගු මදුරුවන් බෝවෙන්න පුළුවන්. හැබැයි ගරු නගරාධිපතිතුමනි, 2025.09.17 ඉඳලා මාර්තු 17 වෙනිදා තව දවස් කීපයක් පැන්න ගමන් අවුරුදු භාගයක් මේ යෝජනාවට. හරියටම එන්වීකිව් අපි කට්ටිය කළානම් මේසන් වැඩේ ඉගෙන ගෙන අපිට කරන්න තිබුණා. තාමත් අපට පෙදරේරුවෙක් හොයාගන්න බැහැ. වඩුවෝ ඉන්නවා මොරටුවේ පේදරේරුවො ඉන්නවා මොරටුවේ කුලසිංහ මහත්තයගේ ගෝලයෝ ඕනතරම් ඉන්න මේ මොරටුවේ තාමත් අපිට කාණුව හදාගන්න මේසන්බාස් කෙනෙක් හොයාගන්න බැහැ. අවුරුදු බාගයයි හරියටම 17 වෙනිදාට. ඒ නිසා තවත් අවුරුදු භාගයක් ගියොත් සම්පූර්ණ අවුරුද්දක් වෙනවා. සූර්යයාට මීන රාශියේ ඉඳලා මේෂ රාශියටත් යන්නේ දවස් 365 යි. අලුත් අවුරුද්දට මීන රාශියේ සිට මේෂ රාශියට එනකොට එතුමියගේ ප්‍රාර්ථනා ඉෂ්ඨ කරන්න. ජනතාවගේ ප්‍රාර්ථනා ඉෂ්ඨ කරන්න අලුත් අවුරුද්දට සූර්ය උදාවත් එක්ක පෙදරේරුවෙක් හොයාගන්න කියලා මම මේ වෙලාවේ කියනවා. නගර සභාවට අඩුවක් වෙනවා නගරාධිපතිතුමනි, ඒක ඉෂ්ඨ කරන්න එන්වීකිව් අපි කට්ටිය ගිහිල්ලා පුරුදු වුනානම් අපටත් කරන්න තිබ්බා හදිස්සියේවත් ලබන මාසෙ වැඩි වුනොත් මට කියන්න මම ඉගෙන ගෙන ගිහිල්ලා හරි මේ වැඩේ කරන්නම්. ඊලග කාරණාව තමයි ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය ගැන කතා කළා. ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ ප්‍රධාන ගැටලුව තමයි අර සේෆ්ටි මැනේජ්මන්ට් එක. එක සේවකයෙක් පහුගිය ටිකේ ඉතාමත් මරණාසන්න මොහොතට පත්වුනා. හැබැයි ඒ සේෆ්ටි මැනේජ්මන්ට් එක ඔවුන්ගේ ආරක්ෂාව අපි කියනවා සේව්ටි ෆර්ස් කියලා.සේව්ටි ලාස්ට් කියන එකවත් නෑ අපට නගරාධිපතිතුමනි, ඒ තත්ත්වය තුළ මට මතකයි ඒ සේවකයා මරණාසන්න මෙහොතට පත්වුනා. නැවත නැවතත් අඩුපාඩු රාශියක් සිද්ද වෙනවා. ඒ සඳහා කටයුතු කරන්න ඕනා. කරුණු එකොලහක් තියනවා. මමත් මේ සභාවට යෝජනා කළා. ඒ වගේ මේක කරුණ මේ කමිටුවෙන් ඉවත් කළා. අපි මේක ක්‍රියාත්මක කරනවා කියලා. අදත් ගරු නගරාධිපතිතුමනි, එන්වීකිව් එක පටන් අරගෙන තියනවා. මේ වෙනකොට විශේෂයෙන් ඝණ අපද්‍රව්‍ය අධිකාරියේ. අපි කාවද ඒකට යොමු කලේ? මේ ඉන්න සේවකයො කාවද ඒකට යොමු කලේ? නිර්දේශ කළේ කාවද? මේ වෙනකොට අවස්ථා දෙකකදී අවස්ථාව උදාවුනා. ඒ වගේම අපි හැමදාම කියන රිකවරි ප්‍රසිරිටි එකයි යටතේ ඔවුන් අනුග්‍රහය දැක්වූවා. ඒ නුග්‍රහය යටතේ අපි කාවද මේ යොමු කරල තියෙන මොරටුව නගර සභාවෙ ඉන්න සේවකයන්ගේ ඔවුන්ගේ තියෙන ශක්‍යතා මට්ටම වැඩිදියුණු කරන්න. අපි මේක කතා කර කර ඉඳලා වැඩක් නැහැ. සිස්ටම් චේන්ජ් කියලා ඔබතුමාට දුන්නේ ඒ නිසා සත්භාවයෙන් අපි ජනතාව වෙනුවෙන් මොරටුවේ ඉන්න සමස්ථ ජනතාව වෙනුවෙන් ආදරණීය මොරටුවේ ජනතාව වෙනුවෙන් ආදරණීය මිනිස්සු ටික අපි හදන්න ඕනා. ශක්‍යතාවය තියෙන. හැකියාව තියෙන. ඒ හැකියාව වෙනුවෙන් අපි යෝජනා දාලා විතරක් වැඩක් නැහැ. ක්‍රියාත්මක වෙන්න ඕනා. ගරු නගරාධිපතිතුමනි, මේ සඳහා ක්‍රියාත්මක වෙන්න ඔබතුමාට අත්දැකීම් තියෙනවා. අපි කයිවාරු සභාවක් බවට පමණයි පත්වෙන්නේ. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියලා අපි සභාවකදී එකඟ වුණා. කමිටුව එකඟ වුනා. අපි මේ ක්‍රියාත්මක වීමේදී අපේ සහයෝගය පූර්ණ ලෙස ලබා දෙනවා කියලා ජනතාව වෙනුවෙන්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපේ සුජිත් මන්ත්‍රිතුමා 2 (10) කරුණ ගැන අදහස් ප්‍රකාශ කළා වගේම නිර්දේශ පිළිබඳ පොදු ගැටලුවක් අපටත් තිබෙනවා. නමුත් අපි සෞඛ්‍ය කමිටුවට සහභාගි වන අය හැටියට ගරු සභාපතිතුමා අපි දැක්කා මේ කරුණු එකින් එකට අරගෙන දීර්ඝ වශයෙන් මේවා පිළිබඳ කතා කළා. නිර්දේශ ඇවිල්ලා තියෙන්නේ ඒ කරුණට විතරක් වුනාට අපි අනිත් කරුණු සියලු දේ ගැන කතා කළා. එතුමා සෑහෙන්න උත්සහයක් ගත්තා සාධනීය ලෙස අපි ඒවාට උත්තර ලබාගත්තා. නමුත් මේකට ඇතුළත් වෙලා නැහැ. එවලෙත් අපි කමිටුව නියෝජනය කරපු මන්ත්‍රිවරු හැටියට එතුමා සෑහෙන්න උත්සහයක් ගන්නවා නිලධාරින් එක්ක කතා කරලා එවලෙම උත්තර ලබාදෙන්න. ඉතින් යම් යම්

අඩුපාඩු තිබෙනවා ඒනිසා අපි සභාපතිතුමාටත් ඔබතුමාටත් ඉල්ලීමක් කරනවා මේවායේ අඩුපාඩු හදාගෙන නිවැරදි ගමන් මාර්ගයකට යමු. ඒ වෙනුවෙන් සෞඛ්‍ය කමිටුව හැටියට ඔබතුමාට දෙන්න පුලුවන් සහයෝගය සභාපතිතුමාට දෙන්න පුලුවන් සහයෝගය ලබාදීලා, මේ වලින් අපිත් සුජිත් මන්ත්‍රීතුමත් බලාපොරොත්තු වෙන්නේ මොරටුවේ ජනතාවට ලොකු සේවාවක් කරන්න. එවගේම තමයි චූටි අඩුපාඩුවක් මම කියන්නම්. කුණු කසළ ගෙවීමේ පොඩි අඩුපාඩු කිහිපයක් තිබෙනවා. අපි ඒවත් එදා සභාපතිතුමාට කිව්වා. යම් ඒවා වලට එවලෙත් පිලිතුරු ලබාදුන්නා. ඒවත් මම හිතන්නේ කඩිනමින් කරලා ඉක්මණින් කරලා ඔබතුමාගේ සහයෝගය මොරටුවේ ජනතාවට අප සියලු දෙනාට ලබාදෙන්න කියන පණිවුඩය දෙමින් සෞඛ්‍ය කමිටුවට අපේ කැමැත්ත ප්‍රකාශ කරනවා.

<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, සෞඛ්‍ය කමිටුවේ අංක 02(1) සහ 2(2) අපේ සෞඛ්‍ය කමිටුවේ සභාපතිතුමා කිව්වා මේ වාර්තාව හදන නිලධාරිවරිය හෝ වරයා අසනීප වූ බැවින් ඒ වාර්තාව අපට ඉදිරිපත් කරන්න ලැබුනේ නැහැ කියලා. නමුත් මම කියනවා අපි වගකිව යුතු සභාවක් හැටියට අපි කොහොම හරි ඒක ඉදිරිපත් කිරීම තමයි අපේ වගකීම. ඒනිසා ඒ දෙපාර්තමේන්තුවේ කවුරුහරි වෙන කෙනෙක් සිටිය යුතුයි. ඒ සම්බන්ධව වැඩ කරන්න. පුලුවන්නම් මීන් ඉදිරියට මේ වගේ වැඩ නොවෙන්න වගබලා කියලා මම කාරුණික ඉල්ලීමක් කරනවා. ඒ වගේම තමයි 2(10) අපේ ගරු මන්ත්‍රීවරු තුන්දෙනෙක්ම සාකච්ඡා කළා මේකේ කරුණු 11ක් තියෙනවා. ඒ කරුණු 11 ඉතාමත් වැදගත් කරුණු කිහිපයක්ම තියෙනවා. ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා කාරුණිකව ඉල්ලා සිටිනවා. ඒවගේම 2(12) ඒකෙත් රෙකෝඩ් එකක් තියෙනවා ගේට්ටුව සම්බන්ධව මේ තුන්වෙනි වතාවට නැත්තම් හතරවෙනි වතාවට මේ කමිටුවට එන්නේ. අපිට ගේට්ටුවක් දාගන්න බැරුව දඟලනවනේ මාස ගාණක්. සායන ගොඩනැගිල්ල ඉදිරිපස ගේට්ටුව සම්බන්ධවයි. මේ කරුණ සභා වාර කිහිපයකදීම ආවා. මේ වතාවෙදිත් ඇවිල්ලා තියෙනවා. මේකට කවුරුහරි අවධානය යොමු කරන්නේ නැත්තම් අපිට හරි කණගාටුයි මේ සම්බන්ධව. ඒනිසා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

නාගරික ඉංජිනේරුතුමා, මෙතුමිය මතු කරන කාරණාව සම්බන්ධයෙන් සොයා බැලුවේ නැද්ද කියලා කියන්න. මේසන් කෙනෙක්ගේ ප්‍රශ්ණයක් නම් කොන්ත්‍රාත් පදනමින් මේසන් කෙනෙක් ගන්න පුලුවන්නේ. මේවා අපි අතර සංවාද කරගන්න නෙමෙයි, මාතෘ සායනයේ ගේට්ටුව. මට දේශපාලන විවේචනය දරාගන්න පුලුවන් හැබැයි මේ ගේට්ටු හැදෙන්නේ නෑනේ. ලබන මාසේ මේක එන්න එපා.

<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, අපි මේ දේශපානයෙන් තොරව, මේ සභාව සතු වගකීමක්. මේක අනිවාර්යෙන් ලබන වාරයේ නෙමෙයි ලබන සතියේ ඉවර කළොත් සුදුසුයි කියලා යෝජනා කරනවා. ඒවගේම 2(8) කොම්පෝස්ට් ව්‍යාපෘතිය. දිගරොල්ල දිනපොළ භූමියේ පවතින කොම්පෝස්ට් අංගනය පරීක්ෂා කරන ලද අතර, එහිදි දිනපොළ භූමියෙන් ඉවත් කරන ලද භාවිතයට නොගන්නා දෛනික කුණු අපද්‍රව්‍ය ගණන් මෙම අංගණය මගින් පාලනය වේ. එය විධිමත්ව වන බව නිරීක්ෂණය විය. එතන මම එකඟ වෙන්නේ නැහැ ගරු නගරාධිපතිතුමනි, මමත් එතැනට ගියා බලන්න. එතන තියෙන කුණු කසල ඒක විධිමත්ව කෙරෙන්න අමාරුයි. ඒකේ පොල්කටු තියෙනවා, බෙලි කටු තියෙනවා, පොලිතින් මිශ්‍ර වෙලා තියෙනවා, ඒ මිනිස්සුන්ට අත දාලා තමයි ඒවා ඉවත් කරලා ගන්න වෙන්නේ. දිගරොල්ලෝ කඩ කරන කට්ටියට අපිට දැනුවත් කිරීමක් කරන්න වෙනවා මේ කුණු කසළ ටික වෙන් කරලා දෙන්න කියලා. එතකොට අපිට පහසුවක් ඇති වෙයි. ඒනිසා මෙතන මේක නිවැරදි කිරීමක් විය යුතුයි කියන කාරණාව මම ඉස්මතු කරනවා. ඒවගේම තමයි 2(7) ඇමුණුම් අංක 5. පරීක්ෂා කළේ සහ සකස් කළේ , අනිත් එක අනුමත කිරීම අත්සන පේන්නේ නැහැ. මේවා වගකිවයුතු ලියකියවිලි. ඇයි මෙහෙම වගකීමකින් තොරව එවන්නේ. මේ සභාවක්. මේවා එවන කට්ටිය කරුණාකරලා බලන්න මේක මොකක්ද වෙන්නේ කියලා. එක වාක්‍යයක් හරි වගකීමෙන් එවන්න. අපි මාසයක් තිස්සේ ඉඳලා මේකට එන්නේ වගකීමෙන් කටයුතු කරන්න. ඔගොල්ලන්ගේ වගකීම පැහැර හරිනවා නම් අපි දන්නේ නැහැ අපි කොහොමද වැඩ කරන්න ඕන කියලා. එකක් දෙකක් වරදින්න පුලුවන්. මේක හැම මාසෙම

වරදිනවනේ. ඒ නිසා කරුණාකරලා අවධානය යොමු කරන්න ලබන සැරේට නම් මේවා දකින්න තියන්න එපා. අපි හැම මාසෙම මේක කියනවනේ. ඒ නිසා මේ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මොරටුව නගර සභාව යටතේ පාලනය වන කලාප තුළ සේවය කරන සේවකයන් යෙදවීමේදී විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් සිද්ධ වෙනවා. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු ගිහිල්ලා උදේට ඒ ස්ථානයේ ඉදලා, ඒ සේවකයන් යොදවන්නේ, හසුරවන්නේ ඒ අයගේ අධීක්ෂණය යටතේ. මේවා කලින් වුනා ඒක හරි නමුත් ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වෙන්නේ ජනතාව මීට වඩා වෙනස් ක්‍රමයක් පොදුවේ හැම දෙනාටම එක වගේ මේ සේවාවන් සැලසෙනවට තමයි ජනතාව කැමති. හරියට ක්‍රමවේදයක් ඇතුලේ නීත්‍යානුකූල වැඩසටහනක් හදලා ඒ අනුව කටයුතු කරද්දී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ටම ලබා දෙන වරප්‍රසාදයම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටත් ලබා දෙන්න කියලා ඉල්ලනවා. සමහරක් අවස්ථාවල අපේ මන්ත්‍රීවරු ඇවිල්ලා නොයෙකුත් දේවල් කියනවා. ඒ නිලධාරී මහතුන්ගෙන් ඇහුවමත් අපිට ඒ අවස්ථාව ලබා දෙන්න එපා කියලා තියෙනවා කියලා ඔවුන් පවසනවා. ඒ නිසා නගරාධිපතිවරයා හෝ මන්ත්‍රීවරුන් හරහා එන්න කියලා අපට පවසනවා. විශේෂයෙන්ම අපේ මන්ත්‍රීවරුන් මේකෙන් අපහසුතාවයට පත්වෙනවා. මේ හැම දෙනාම ආවේ සේවය කරන්න. ඔබතුමන්ලාගේ සාධනීය ක්‍රියාමාර්ග වලට අපේ සහයෝගය ලබා දෙනවා. ඒ අවස්ථාව සැලකිල්ලට ගෙන අපේ මන්ත්‍රීවරුන්ටත් සාධාරණය ඉෂ්ට කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කරුණු රාශියක් තියෙනවා. පළවෙනි එක ඔසද මන්ත්‍රීතුමා ඇහුවා කලවම් කසල සම්බන්ධයෙන්, අපි කොහෙවත් කලවම් කසල එකතු කරන්නේ නැහැ. හැබැයි අපිට සමහර ස්ථාන තියෙනවා බේරගන්න බැරි, උදාහරණයක් ලෙස ගත්තොත් නගර මැද කලාපය අපි හැමදාම අතුගානවා, ඒ අතුගානකොට අපිට හැමදාම කලවම් කුණු යම්කිසි ප්‍රමාණයක් එකතු වෙනවා. සමහර කලාප තියෙනවා අපි හැමදාම උදේට අතුගානවා. සොයිසපුර, කටුබැද්ද මේ ස්ථානවල සැලකිය යුතු මට්ටමක කරත්ත ප්‍රමාණයක් එකතු වෙනවා කලවම් කසල. එතකොට ඒවා අපිට ඔක්කොම තෝරන්න බැහැ. මේක කලිනුත් සිදුවුණා එතකොට අපි උපරිම උත්සාහ කරනවා කලවම් කසල වෙනස් කරලා ඒ කසල සියල්ල වෙන් කරලා. විශේෂයෙන් නිවෙස් වල කොහෙවත් අපි කලවම් කසල ගන්නේ නැහැ, කිසිම ආයතනයකින් අපි කලවම් කසල ලබා ගන්නේ නැහැ. මොකද ඔබ කවුරුත් දන්නවා මේ වැඩ කරන සේවකයෝ තම තමන්ගේ ආදායම් මාර්ග යම් ප්‍රමාණයකට හදාගන්න ඒ ලොරි වලට මේවා පටවගෙන යනවා. සාමාන්‍යයෙන් අපට දිනකට ලොරි හතරයි දෙන්නේ කරදියානෙන්. මොකද ඒක බරපතල ප්‍රශ්නයක් අපි ඒකට විසඳුම් හොයමින් යනවා. විශේෂයෙන් කානුපස් අදිද්දී, ඉතින් අපි උපරිම වෙහෙස දරනවා කලවම් කසල කියන එක ඉවත් කර ගැනීමට. හැබැයි අපිට ප්‍රායෝගිකව මුහුණ දෙන්න වෙන්න යථාර්ථය තමයි පාරවල් අතුගානකොට ඒ පාරවල් වලින් අපට කලවම් කසල එකතු වෙනවා. උදාහරණයක් වශයෙන් බේල් එකෙත් තවමත් කරදියානට යවන්න සිද්ධවෙන කසල ප්‍රමාණයක් තිබෙනවා. ඒ ටික අපි යවන්න ඕනේ අපිට ඒවා ගොඩ ගහගෙන තියාගෙන ඉන්න බැහැ. මන් හැමදාමත් කියනවා වගේ හිටපු නගරාධිපතිතුමා එකතුවෙලා හොඳ වැඩක් කරේ ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය ස්ථාපිත කළා, ඒ පිළිබඳ අපි ඔහුටත් ඔහුගේ කණ්ඩායමටත් ඒ ගෞරවය ලබා දෙනවා. හැබැයි අපි මේක වැඩිදියුණු කරන්න ලොකු උත්සාහයක් දරනවා. පහුගිය සතියේ ඔබතුමත් මැදිහත් වෙලා අපි සෙවණත ආයතනය, යූඑන්ඩීපී එක සමඟ අපි සාකච්ඡා ගණනාවක් සිදු කරා මේක නැවත ප්‍රතිසංවිධානය කරලා වඩා විධිමත් ලෙස මේක පවත්වාගෙන යන්නේ කොහොමද කියලා. අපි අත තියලා තියෙන්නේ අපිට මැජික් නැහැ මේක මාසෙන් දෙකෙන් තුනෙන් නිම කරන්න. නමුත් අපි විශාල උත්සාහයක් දරමින් ඉන්නවා, අපේ සේවකයෝ විශාල මහන්සියක් දරනවා. අඩුපාඩු ගොඩක් සේවකයන්ට තියෙනවා. අපි මේ පාර කමිටුවේදීත් දාලා තියෙනවා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව මම දිගින් දිගටම මේ අදාල නිලධාරීන් සමග සාකච්ඡා කරනවා. නමුත් කණගාටුවක් තියෙනවා මොකද අපට පස්සෙන් පන්නපන්න කියන්න වෙලා තියෙනවා, ඒක ඔබතුමාලත් වින්ද දේ. මම උනත් නගරාධිපතිතුමා උනත්

නිලධාරීන් එක්ක නරක විදිහට කතා කරමින් බැන වදිමින් එහෙම ගමනක් යන අය නෙමෙයි. ඒත් අපි උත්සාහ කරනවා කලවම්කසල එන එක අඩු කරගන්න.

ගරු නගරාධිපතිතුමනි, ඊළඟට මතුවුණා ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය පිළිබඳව අපි විශාල වැඩ කොටසක් කරනවා. මම විශේෂයෙන් ස්තූතිවන්ත වෙනවා අපේ සෞඛ්‍ය කමිටුව නියෝජනය කරන තිලකසිරි මන්ත්‍රීතුමා කතා කරා, මේකෙ අඩුවක් තියෙනවා අපි මේක තියාගත්තෙත් මේ එකින් එක කරුණු ගැන සාකච්ඡා කරන්න ඕන හින්දා මැෂින් ගැන පමණක් නෙමෙයි. ඒ නිසා තමයි මේක කමිටුව ඇතුලේ අපි තියාගෙන තියෙන්නේ. අපි මේ එකින් එක ඉටු කරමින් යන්නේ. සේවක සුභ සාධනය, සේවකයන්ට ඉදිරි දීමනා ලබාදීම. දැන් ප්‍රශ්නයක් මතුවුණා පොහොර දීමනාව සම්බන්ධයෙන් ඇත්තටම නීත්‍යානුකූලව අපට පොහොර ලබාදීම කියලා එකක් දෙන්න බැහැ සභා සම්මතය හරි හැබැයි ඔඩිට් එකකදි ඒක ප්‍රශ්න ගත වෙනවා. ඒ නිසා ඒකට අපි සමස්තය විදිහට අවසරයක් ඉල්ලලා එවලා තියෙනවා, පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් හැබැයි මම සෞඛ්‍ය කමිටුවට මේ යෝජනාව ගේනවා. පොහොර දීමනාව නෙමෙයි මේ සේවකයන්ට, බේල් එකේ කසල එකතු කරන, ට්‍රැක්ටර් වල කසල එකතු කරන සියලු සේවක මහතුන්ට , රියදුරු මහත්වරුන්ට සැලකියයුතු  දිරිදීමනාවක් හදන්න පොහොර දීමනාව වෙනුවට ඔවුන්ට ලබා දෙන්න. එයින් ඔවුන්ව අපිට දිරි ගන්වන්න පුළුවන් අපිට ආදායම ලබන්න පුළුවන් කසල ටික මේ බේල් එකට ගෙන්න ගන්න පුළුවන් දිරි දීමනාවක් හදන්න. ඊළඟ කමිටුවේදී අපි ඒක ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඊට අමතරව ගත්තොත් එන්වීකිව් පාඨමාලාව සඳහා මේ වෙනකොටත් පස්දෙනෙක් අපි යොමු කරලා තියෙනවා. මේ කටයුත්ත සිද්ධ වෙනවා. අඩුපාඩු තියෙනවා, වාහන ප්‍රශ්න තියෙනවා, වෙනම වාහනයක් අපි ඉල්ලලා තියෙනවා බේල් එකේ පාවිච්චිය සඳහා. එතකොට අපි ඉක්මනින් මේ එහා පැත්තේ කටයුත්ත ලැස්ති කරනවා ඒකත් බේල් එකට අනුයුක්ත කරලා. සෙවණත එකෙන් අපිට විශාල උදව් ප්‍රමාණයක් කරන්න සූදානම්. එන්ඩීපී එක අපිට උදව් කරන්න සූදානම්. මිලියන 15ක් අපේ බේල් එක වෙනුවෙන් යූඑන්ඩීපී එක වෙන් කරලා තියෙනවා. එතකොට ඒ අය අපිට ප්‍රොපෝසල් එක ගෙනල්ල දෙනවා. එතකොට අපි ඒකේ පයෝරිටි එක තෝරලා, අපි තරාදියකුත් ගන්න සූදානම් කරගෙන ඉන්නවා. මෙහෙම කටයුතුවලට අපි උත්සහ කරමින් ඉන්නවා. අපි තාම සාම්ප්‍රදායික ක්‍රමයකට හුරු වෙච්ච පිරිසක් සමඟ වැඩ කරන්නේ ඔවුනුත් මහන්සි වෙනවා වැඩ කරන්නේ නැහැ නෙමෙයි. ඒ නිලධාරීන්වත් තල්ලු කරගෙන සේවකයෝ තල්ලු කරගෙන මේ ගමන යන්න ලේසි නැහැ. අපි හැමදාම මේ ගැන කතා කරනව නමුත් ක්‍රියාවේදී යම් පසුබෑමක් තිබෙනවා අපිට යම් තැන්වලදී ලැබෙන සහයෝගය මදි. අපි ඒ උත්සාහය දරමින් ඉන්නවා අනිවාර්යයෙන් අපි බලාපොරොත්තු වෙනවා මේ වසර අවසන් වෙනකොට ද්‍රව්‍ය ප්‍රතිශෝධන මධ්‍යස්ථානයේ සැලකිය යුතු වෙනසකට ලක් කරන්න. චෝදනා ස්වරූපයෙන් මතු වුණා මේකෙ වංචාවල් සිද්ධ වෙනවද කියලා. නගරාධිපතිතුමත් දන්නවා ඔබත් දන්නවා අපි කවුද කියලා ඒ නිසා මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනේ මදූෂා මහත්මිය එතුමිය තමයි දීර්ඝ කාලයක් තිස්සේ මේ ෆයිල් ටික කරේ, එතුමිය රෝගාතුරවීම නිසා මේ කමිටු වලට ආසන්නම කාලයේදී ඒ සඳහා දැන් අපි අලුත් නිලධාරීයෙක් පත් කරලා තියෙනවා. දැන් ඔහු ඒ වැඩ කටයුතු කරමින් යනවා එතකොට අපිට මේක ඉදිරිපත් කරන්න කාලය මදි වුණා. ඒක අඩුවක් විදිහට දකිනවා. අපිට එහෙම නිදහසට කරුණු කියන්න බැහැ. මේ අඩුපාඩු ඊළඟ පාර වෙන්න තියන්නේ නැහැ. මේ වේලාවේදී මේ කමිටුවට අදාලව වාර්තාව ඉදිරිපත් වෙයි කියලා මම හිතුවා නමුත් ඉදිරිපත් වුනේ නැහැ. මේ 6 වෙනි කරුණෙහි ප්‍රධාන පරිපාලකවරු පැය 20ක අතිකාලයක් ඉල්ලලා තියෙන එකට අදාලව පහුගිය සභාවේ මතුවුනා සොයිසාපුර කලාපයේ ප්‍රධාන පරිපාලකයා සම්බන්ධයෙන් චෝදනාවක්. ඔබතුමත් අපිත් කිව්වා ඒ සම්බන්ධයෙන් ඉක්මනින් පරික්ෂණ කරන්න කියලා. අපි ඉතාමත් සතුටු වෙනවා මාසයක් ඇතුලත ඒ පරික්ෂණ වාර්තාව ඇවිල්ලා තියෙනවා. ඔබතුමාට අමතක වෙන්න ඇති එය ඉදිරිපත් කරන්න, මේ වාර්තාවේ නිර්දේශයේ තියෙනවා විශාල චෝදනා ගණනාවක්, පලවෙනි නිර්දේශය නිර්නාමික ලිපියක් ඊළඟට ඒ ලිපියේ සඳහන් කරලා තියෙන කෙනා ආර්.පී.එල්. ප්‍රනාන්දු ඒ ලිපිනයේ එහෙම කෙනෙක් නැහැ. එතනම ගැටළුවක් තියෙනවා. ඒ ලිපිය එවපු කෙනාට ඒ අදාල පරික්ෂණ කරන කණ්ඩායමෙන් ලිපි යැවුවා. හැබැයි එහෙම කෙනෙක් නැහැ. එතකොට අපිට එතනින්ම පැහැදිලි අපේ අරමුණ මොකද්ද කියලා. මේ අරමුණ සොයිසාපුර ඉන්න ප්‍රධාන පරිපාලකවරයා ඉලක්ක කරගෙන යන අරමුණක් නෙමෙයි. මෙය වෙනත් දේශපාලන අරමුනක්. ඔබතුමන්ලා කවුරු හෝ සොයිසාපුරට ගියොත්

මිනිස්සුන්ගෙන් ඇහුවොත් කසල කළමනාකරණය සම්බන්දයෙන් කොහොමද තත්ත්වය කියලා මිනිස්සු උත්තර දෙයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි අපේ සියළු දේ නීතියට යටත් ඒ නිසා 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුව ඕනෑම කෙනෙක්ට නිර්ණාමිකව එච්චත් සෘජුව එච්චත් නාමිකව එච්චත් විමර්ශනය කිරීමට අයිතිය තියෙනවා. ඒ නිසා ඒක නාමික එච්චද, නිර්ණාමික එච්චද කියන එකට වඩා වැදගත් වෙන්නේ සභාවක් විදිහට මේ සභාවේ ඒ අවශ්‍යතාවය ඉටු කරනවද කියන එක. ඒ නිසා මෙතුමා කියන ප්‍රශ්නෙත් එක්ක 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතත් එක්ක එකඟ නැහැ කියලයි මම කියන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මම කිසිම අවස්ථාවක කියලා නැහැ ඒ පරීක්ෂණය නීති විරෝධී කියලා. මම කියන්නේ මේකේ අරමුණ ගැන.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වලා ඒ පරීක්ෂණ වාර්තාව ඇවිල්ලා තියෙනවා. ඒ වාර්තාව පදනම් කරගෙන තමයි කියන්නේ. මම ඒ වාර්තාව සභාගත කරන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් මේ පැමිණිල්ල ඔබතුමාටයි මටයි, උප නගරාධිපතිතුමියටයි, මං දන්නෑ ඒකේ ලියලා තිබුණ විදිහට නගර සභාවට තමයි ඇවිල්ලා තියෙන්නේ. මටත් නගර සභාවේ පොතෙන් තමයි ගෙනල්ලා දුන්නේ. ඒක ආයාචනා හා පැමිණිලි පෙත්සම් යටතේ තමයි ඉදිරිපත් කරන්නේ ඒ ඉදිරිපත් කිරීම කරන්නේ අපි ඔබතුමාට. එතකොට ඒ සඳහා පිළිතුරු ලැබෙන්න බැහැ මෙතුමාගෙන්. ඒක සභාවක් ගත කරන්න ඕනේ ඔබතුමා විසින් එතුමට බැහැ මේ සඳහා උත්තර ලබා දෙන්න. මේ සභාගත කිරීමට මෙතුමාට බලයක් නැහැ ඔබතුමාගේ නිවේදන යටතේ ඔබතුමා මේ සභාගත කරන්න ඕන.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, එතුමා සෞඛ්‍ය කමිටුවේ සභාපතිවරයා ලෙස එතුමාගේ කොට්ඨාශයට නතු වෙච්ච ගැටළුවක් නිසා. ඒ වාර්තාව මගේ ලඟ තියෙනවා. මම එය සභාගත කරන්නම්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මට මන්ත්‍රීවරයෙක් ලෙස විමසීම් කරන්න පුළුවන්. මෙහි නිර්දේශය ගත්තහම එහි තියෙනවා මෙම පැමිණිල්ලේ සඳහන් අක්‍රමිකතාවයක් සිදුවෙන බව කිසිදු ලිඛිත හෝ වාචික සාක්ෂියකින් අනාවරණය වී නොමැත කියන එක. මම මේ සම්බන්ධයෙන් මීට වඩා කතා කරන්න යන්නේ නැහැ. ඔබතුමා මේ සම්බන්ධයෙන් මීට වඩා පරීක්ෂණ පවත්වන්න මොකද අපි නිදහස් විය යුතුයි. අපි සතපහක වංචාවක් කරන්න ආපු මිනිස්සු නෙමෙයි. ඒක මේ මොරටුවත් මුළු රටක් දන්න දෙයක්. මම ඉදිරිපත් කරන්න කැමති ඒ කරුණෙම සඳහන් වුණා ඔය කියන ප්‍රධාන පරිපාලකවරයා එයාගේ ස්ථිර පත්වීම තිබුනේ ප්‍රජාශාලා භාරකරු කියලා, එක හරි ගැටළුවක් නැහැ. මේ සභාවේ ඕන තරම් ඒ දෙපාර්තමේන්තු වල අවශ්‍යතාවය මත ඒවා පවරලා තියෙනවා.

**සභා ඝෝෂා**

ගරු නගරාධිපතිතුමනී, සත්‍ය ජනතාව දැනගනී මට කියන්න තියෙන්නේ අවසාන වශයෙන් මේ සෞඛ්‍ය කමිටුව විදිහට සැහෙන්න මහන්සියක් දරණවා. මේ කටයුත්ත හරියට ක්‍රමවත්ව, විධිමත්ව කරගන්න. අපි කසල ගැණුම්කරුවන් පවා ලියාපදිංචි කරගෙන මේ වැඩේ කරගෙන යනවා. මොරටුවේ ඉතිහාසයේ කවදාවත් කසල ගැණුම්කරුවන් ලියාපදිංචි කරලා නැහැ. මේවා එක එක්කෙනාගේ බූදල් වෙලා

තිබුණේ. එක එක්කෙනාගේ දුරකථන ඇමතුම් වලට මේවා ක්‍රියාත්මක වුනේ. ඒ නිසා අපි ඉතාම විධිමත් ලෙස මේ කටයුතු කරගෙන යනවා. අඩුපාඩු තියෙනවා නමුත් අපි තවත් මෙය විධිමත් කරනවා, ජනතාවට විවෘත කරනවා. අපිට කිසිම හේතුවකින් මේක හැංගිලා, හංගලා වැඩ කරන්න දෙයක් නැහැ. අපි මේ කටයුත්ත ඉදිරියෙදී කණ්ඩායමක් වශයෙන් තවත් ශක්තිමත් කරන්න බලාපොරොත්තු වෙනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි තමයි ඒ හොරු අල්ලලා දුන්නේ. ඔබතුමාලගේ පාලන කාලෙත් ඒ හොරු හිටියා අපි කියලා තමයි ට්‍රාන්සර් දීලා යැවුවේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සෞඛ්‍ය කමිටුවේ සභාපතිවරයා ලෙස ඔහුට පැවරිච්ච වගකීම ගැනනේ ඔහු ප්‍රකාශ කළේ ඒ නිසා ආයේ කතා කරන එක සුදුසු නැහැ. මේ මතු වුණ කරුණු ඇතුළේම යම් දෙයක් දැක්කා ඒකට පිළිතුරක් ලැබුණේ නැහැ ඔබතුමාගේත් 2(15) කරුණේ, පොහොර දීමනාව සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරියට යොමු කරලා අනුමැතිය ගන්න ඕන කියලා එකක් ආවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒක සිද්ධ වෙන්නේ මෙහෙමයි පොඩි අතපසුවීමක් මෙතැනදී සිදුවෙලා කියලා මටත් හිතෙනවා. මේ සිදුවුනේ නගර සභාවේ සමස්ත පොහොර දීමනාවක් ලබා දෙනවා එය සභා සම්මතයකින් සිදු වෙච්ච එකක් බව ඇත්ත. හැබැයි මේක නීත්‍යානුකූල බවට පත්කරගන්න එහෙනම් අනුමැතියක් අවශ්‍යයි කියලා කියනවා. දවස් විසිතුනක් විසි හතරක් ඇතුළත අනිවාර්යයෙන් එන්න ඕනේ ඒ ආපු අයට තමයි එතකොට පොහොර දීමනාව හැදෙන්නේ. ඔබතුමා දන්නවා අපිට තියෙන වාහන ප්‍රශ්න අපිට ඉන්න සේවකයන්ගේ කළමනාකරණ ප්‍රශ්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ සම්බන්ධයෙන් අර්ථ නිරූපණයක් වඩාත්ම හොඳයි මෙතන අපේ කොමසාරිස් තුමියත් ඉන්නවා එතුමියන්ලාගෙන් අපි දැනගත්තා නම් හොඳයි මේක යවන්න ඕනද නැද්ද කියලා. අපිට එතකොට ඒ සම්බන්ධයෙන් තීරණයක් ගන්න පුළුවන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, පොහොර දීමනාවට අනුමැතිය ලබාගත යුතු නම් ඒ ලබාගන්නේ යවන එක වෙනම කතාවක්. නමුත් අපි කියන්නේ මේ සේවකයන් තුන්දෙනෙකුට විතරක් මේක යවන්නේ මොකටද කියලා. සමස්තයටම යන්න ඕන නම් ඒක ප්‍රශ්නයක් නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේකෙ ගැටලුවක් තියෙනවා මේ යන්නේ තුන්දෙනාට විතරක් නෙමෙයි මෙය සමස්තයටම යවලා තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සමස්තයටම යවන්න තීන්දු කරන්නේ මේ තුන්දෙනාගේ ඉල්ලීමත් එක්කද.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සමස්තයම මීට කලින් යවලා තියෙනවා. මේ තුන්දෙනාගේ නම් එයට ඇතුළත් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි දන්නා ආකාරයට පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ඕනේ නැහැ. මේක සභා අනුමැතියෙන් ගෙවන්න පුළුවන්, මොකද මෙච්චර කාලයක් අපි මේක ගෙව්වා. ඔඩිට් ඉන්කුවරි එකක්වත් ආවේ නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරන්න නාගරික කොමසාරිස්වරියට අවස්ථාව ලබා දෙනවා.

<u>නාගරික කොමසාරිස් - එල්. පී. මනෝජා එස්. පතිරණ මෙනවිය</u>

ගරු නගරාධිපතිතුමනී, සභාවෙන් සම්මත කරලා පලාත් සභාවේ දීමනා කමිටුවක් තියෙනවා. එම දීමනා කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුයි ඕනෑම දීමනාවක් ගෙවීමට. අපි සභාවෙන් සම්මත කරාට එහි නීත්‍යානුකූලභාවය පිළිබඳ ගැටළුවක් තිබෙන නිසා තමයි එයට විධිමත්භාවයක් ලබා ගන්න මෙම දීමනාව අපි පළාත් දීමනා කමිටුවට ඉදිරිපත් කරලා තියෙන්නේ. නැතුව පළාත් පාලන කොමසාරිස්වරියට නෙමෙයි. එතුමිය හරහා යවන්න ඕන නිසා තමයි එතුමිය හරහා මෙය යවලා තියෙන්නේ. මේ සිදුවෙලා තියෙන අඩුපාඩුව නිවැරදි කර ගැනීම සඳහා තමයි මෙය යවලා තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ මහා ලොකු තර්ක අවශ්‍ය වෙන්නේ නැහැ. අපි දැන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ දීමනාව ගෙව්වනේ. එතකොට අවුරුදු ගණනාවක් ගෙවනකොට අපිට හැම වර්ෂයකදීම ගවමන්ට් ඔඩිට් එකෙන් අපිව ඔඩිට් කරනවා. දැන් මම අහන්නේ කිසිදු විගණන විමසුමක පොහොර දීමනාව සම්බන්දයෙන් මතුවෙලා තිබෙනවද ගැටළුවක්. එහෙම ඇවිල්ලා තියෙනවනම් මෙතුමිය කියන එක හරි අපි අවසර ලබා ගතයුතුයි. එහෙම ඇවිල්ලා නැත්නම් මොකටද මේ අපි අනවශ්‍ය ප්‍රශ්නයක් දාගන්නේ. අපි මෙය ඔබතුමා කිවුවා වගේ දෙන්නේ දිරි දීමනාවක්, අපිට දිරි දීමනාවක් දීමට බලය තියෙනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කියන දේට එකඟයි. හැබැයි සමහර පැවතිච්ච එවා ගැටළු සහගතයි, දැන් කමිටු පත් කිරීම ගැටළු ආවා. ජනවාරි වෙනකන් ඔබ ඒ සම්බන්ධයෙන් ලොකු විවේචනයක් කරා පසුව එය නිවැරදි කරා. එතකොට ඔය මාර්ග පවරා ගැනීමත් එහෙමනේ. හැබැයි අපි මෙච්චරකල් කලා. හැබැයි මෙවැනි ප්‍රශ්න එනකොට ප්‍රශ්නයක් නොවන තැනකට ගෙනිය ගන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මෙතන ගැටළුවක් තියෙනවා එතකොට හිටියෙත් මේ නිලධාරින්මයි. ඇයි එතකොට ඒ අයට පෙන්වලා දුන්නේ නැත්තේ මේ හේතුව.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, සමහර කරුණු දීර්ඝ කාලයක් පුහුණුවකනේ යන්නේ. හැබැයි අපි එවා හොයලා බලලා එවා වල තියෙන නෛතික තත්ත්වය තේරුම් ගත්තට පස්සේ ඒ නෛතික තත්ත්වයට මේවා ගෙන්නේ කොහොමද කියන එක උත්සහා කරන්න ඕන. පොහොර දීමනාව කියන එක සභාව අනුමත කළා දෙන්න පුලුවන්. පොහොර දීමනාව කියන එක නමින්ම වැරදියි ඒක කසල දිරි දීමනා බවට පත්කර ගන්න ඕන. පළාත් පාලන විශයට අදාළව පළාත් පාලන ගෙවීම් කරනකොට අනුමැතිය ගතයුතු ස්ථානයක් තියෙනවානම් අපි ඒක ගමු.

**2026.02.10 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | ගරු නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |

10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - පී.සජිත් දුමින්ද පීරිස් මහතා
30. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
31. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා
32. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
33. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
34. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
35. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
36. මහා නගර සභා මන්ත්‍රී - එස්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
37. මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
38. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
39. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
40. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
41. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
42. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
43. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
44. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
45. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිලිනි නෙත්සරණී මෙනවිය

**2026.02.10 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කරුණු වලට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.02.10 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.02.10 දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා)

**6(5) 2026.02.10 වන දින පැවති ක්‍රීඩා හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සළකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අපි අවස්ථා කිහිපයකදි විශේෂයෙන් මමත් අපේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුත් මතු කරලා තිබුනා අපේ නගර සභාව සතු ක්‍රීඩා කණ්ඩායම් ශක්තිමත් කරලා වෙළඳ සේවා තරග වලට වගේම අනෙක් තරගවලට යන්න සුදුසු කණ්ඩායමක් ශක්තිමක් කණ්ඩායමක් අපට ඉන්නවා.ඒවගේම අපේ පාපැදි තරඟ සඳහා නිරන්තරයෙන් සහභාගී වන ක්‍රීඩකයත් අති දක්ෂ ක්‍රිඩකයෙක්.ඔවුන්ට අවශ්‍ය කරන නිවාඩු අනුමත කිරීම පුලුවන්නම් ඒ ටික, ඒවගේම වෙනම පෝෂණ සහාය අවශ්‍ය නම් ඒ ටික, ඒත් එක්කම ඔවුන්ට තරඟ පවත්වන දිනයේදී අවශ්‍ය කරන පහසුකම් තියෙනවා නම් ඒ සඳහා අපට යම් ප්‍රතිපාදනයත් තියෙනවා. ඒ නිසා ඒ සඳහා ඊළඟ සභාවේදි ක්‍රියාත්මක වුනොත් එහෙම ඉතාමත් වැදගත් ඒ නිසා සමහරක් වෙලාවට පැඩ් නෑ, මම දැක්කා බැට් එක අනිත් ටීම් එකෙන් ඉල්ලා තමයි දෙන්නේ. ඒනිසා අපිට යම්කිසි අනුග්‍රහක වට්ටමක් දෙන්න පුලුවන් නම් කවුරුහරි සම්බන්ධ කරලා, ඒවගේම ඒ අවශ්‍ය කරන පහසුකම් සැපයීමද ඉතාමත් වටිනවා ගරු නගරාධිපතිතුමනි,

**<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දැන් මේ මාසේ මහා ක්‍රිකට් තරඟ පැවැත්වෙනවා ද සොයිසා ක්‍රීඩාංගණයේ ඒ නිසා අපිත් බලන්න යනවා. මම හිතන්නේ අඩුපාඩු ඔක්කොම වගේ හදලා වගේ තියෙන්නේ. ඒ වුනාට සේවක සංඛ්‍යාව වැඩිකරලා හරි කමක්නෑ ඒ ටික කරන්න. නැත්තම් අපිට බැනුම් තමයි අහන්න වෙන්නේ හැමදාම. ගරු නගරාධිපතිතුමා ඒ තරඟ වලට මන්ත්‍රීවරුන්ට ටිකට් එක ලබා දෙනවද?

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අද දෙනවා කිව්වා.

**<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, පාස් එක ලබාදෙන්නේ මේන් පැවිලියන් එකේද, නැත්තම් කොහොමද

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මට අද උදේ කථා කළා වී.අයි.පී. වලට වෙන තනතුරු ටිකක් තමයි කිව්වේ. මන්ත්‍රීවරුන්ට වෙන පොදු වෙන ස්ථානයක් මට දැනිච්ච දේ, හරිද දන්නේ නැහැ අද දෙනවා කිව්වා.

**<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසද හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ශාන්ත සෙබස්තියන් විද්‍යාලයෙන් කරන්නේ මේ පාර. ඒගොල්ලන්ගෙන් නගරාධිපතිතුමාට ටිකට් ටික එන්න ඕන.

**<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, අංක 04 එම්.ඊ.පෙරේරා මාවතේ සමන්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු බැට්මින්ටන් කෝඩ් එක හදන එක සම්බන්ධව ඔබතුමාගේ අවධානය පොඩ්ඩක් යොමු කරන්න. ඒ මන්ත්‍රීතුමා මේක ඉදිරිපත් කලා ඇත්තේ සත්භාවයෙන් වුවත් එම ව්‍යාපාරික ස්ථානයේ මෙවැනි දෙයක් සෑදීම මම හිතන්නෑ කාලෝචිතයි කියලා. ගරු නගරාධිපතිතුමා, ඒ ඉඩම අපේ කියලා හිතෙනවා නම් සභා සතු ඉඩමක් කියලා එතන කඩ කාමර දෙක තුනක් හැදුනවා නම් ගරු නගරාධිපතිතුමා මාසෙකට ලක්ෂයක ආදායමක් ගන්න පුලුවන් තැනක්.මෙතට බැට්මින්ටන් කෝඩ් එකක් ගහලා සභාවේ මුදල් නාස්ති කරනවට වැඩිය සභාවට ආදායමක් ගේන්න පුලුවන් මාර්ගයක් ඉදිරිපත් කළානම් හොදයි කියලා මම යෝජනා කරනවා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මැදිහත්වීම කරලා තියෙන්නේ, මේ සමහර සමහර දේපළ නිශ්චිත සභාවට තහවුරු කළ හැකි ලේඛණ මත නෙමෙයි තියෙන්නේ.දැන් මේවා නිශ්චිත තහවුරු කරගන්න ක්‍රමවේද අනුගමනය කර ගන්න වෙනවා.සමහර උපක්‍රම තෝරනවා.මෙතට අවතීර්ණ වෙනවා ප්‍රදේශයේ

තරුණයින්ට බැට්මින්ටන් හරි මොකක් හරි, මෙතන්ට ඇතුල්වෙලා මේ කටයුතු කරනකොටම දැන් මේ ඉඩමේ අයිතිකරුවාගේ ඥාති පුතෙක් ඇවිල්ලා අයිතිය ගැන කථා කරන්න අරගෙන.ඔිහොම ගැටලු ටිකක් තිබෙනවා.අපේ අනන්‍යතාවය, අපේ අයිතිය තහවුරු කරගැනීමේ ක්‍රියාවලියකට මේක අරගන්න ඕන නිසා මේක නිශ්චිත බැට්මින්ටන් කෝඩ් එහෙකට යන එකක් නෙමෙයි. දැන්ට මේ කටයුතු කරගෙන යනවා.

<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම හිතන්නේ ගරු නගරාධිපතිතුමා මොරටුව මහා නගර සභාව සතු නිශ්චල දේපළ විශාල ප්‍රමාණයක් තියෙනවා. සමහරක් ඒවා හඳුනාගෙන නැති, පහුගිය කාලේ මම සභාවේ ඉන්නකොට 10%කට රුදවුම්, ලොකු ඉඩමක් නම් කට්ටි කිරීමේදි කවුබැද්දේ ඉඩමක් සම්බන්ධවයෙන් මම ප්‍රශ්ණ කළා තමුන්නාන්සේට මතකත් ඇති. මේ වගේ ඉඩම් සම්බන්ධයෙන් තිබෙන ගැටලු වලදී යෝජනාවක් කරනවා තාවකාලිකව හරි ගෙවීමක් කරලා සභාව තීරණයක් අරගෙන ඉඩම් නිලධාරි කෙනෙක් පත්විමක් කරගෙන ඒ අයගෙන් කෙටි කාල සීමාවක් තුළ මේ නගර සභාව සතු ඉඩම්වල නිරාකරණය කර ගැනිමේ ක්‍රමවේදයක් තිබ්බානම් අපිට ඒක වැදගත් වෙයි කියලා හැඟීමක් තියෙනවා. ඒක සභාවට මුදලක් ගියත් ඒක අනාගතයට ලොකු ප්‍රයෝජනයක් වෙයි කියලා මම විශ්වාස කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, මට මතෙක තියෙනවා, හරියට කාලේ මතක නැහැ අපේ තිබිච්ච සේප්පුවක විශාල ඔප්පු ප්‍රමාණයක් කුඩු හැලෙන ගානට ගියා. අපිට අයිති ඉඩම්වල අපි සතුව තිබ්බ්ච ඔප්පු අල්ලනකොට කුඩු, අපේ සජිත් මන්ත්‍රිතුමා මට මතකයි එතුමාගේ මැදිහත්වීමෙන් තමයි තිබිච්ච ඔප්පු ටික රැකගන්න සංරක්ෂණය කරන්න මහන්සි වුනේ. ඒ නිසා යම් ප්‍රමාණයක් සංරක්ෂණය කරගන්න හම්බවුනා. හැබැයි විශාල ප්‍රමාණයක් සම්පූර්ණයෙන්ම දිරාපත් වෙලා ගියා. ඒ දිරාපත් වෙච්ච ඒවා මොන මොන ඉඩම් ද කියලාවත් දන්නේ නැහැ. දැන් සමහර ඉඩම් සම්බන්ධයෙන් සාකච්ඡා කරනකොට අපි කියනවා අපිට තහවුරු කරගන්න ලේඛණ නැහැ. මම කියන්නේ අපිට තිබිච්ච ලේඛණ තමයි අහිමි වුනේ. අපේ කියලා කඩ කාමර තියෙනවා ඉඩමේ අයිතිය සනාථ කරන්න ලේඛනයක් නෑ.බොහෝ ඉඩම් අපි දැන් ඒවා අපේ කියලා සනාථ කරගන්න ක්‍රමවේදයක් අනුගමනය කරන්නම වෙනවා. ගොඩක් ඉඩම් තියෙනවා ඒවා නගර සභාවේ ඉඩම් බවට තහවුරු කරගත යුතුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඩික්ෂන් පීරිස් ක්‍රීඩාංගනයේ ප්‍රතිසංස්කරණ කටයුතු, අපි කමිටුව පටන් ගත්තේ දා ඉඳන් එන එකක් තමයි. තාම මේකේ ඇස්ටිමේට් එක ඇවිල්ලා නෑ. ඒත් එක්කම මේකේ ගේට්ටුව හදලා කර්මාන්ත අංශය ලඟ වැස්සට තෙමිලා දිරලා යනවා. ඒක තාම හයි කරගන්න බෑ. එදා අපි ක්‍රීඩා කමිටුවේදිත් කථා කතා කරලා කිව්වා සභාවේ මේසන් බාස් කෙනෙක් වෙනම කාවහරි පෞද්ගලිකව දවස පඩියට අරගෙන හරි ඒ කටයුතු ඉටු කරන්න. මොකද ඒ ක්‍රීඩාංගනයේ නගරාධිපතිතුමා, ලොකු ලොරි නවත්තනවා, කරන්න පුලුවන් හැම දෙයක්ම වෙනවා. මං දැක්කා ඊයේ පෙරේදා රාත්‍රියක පොලීසියත් ඇවිල්ලා කාවහරි කට්ටියක් එලෙව්වා. මම හිතන්නේ ඒ අවට කවුරුහරි මිනිස්සු කෝල් කරන්න ඇති. ඉතින් ගරු නගරාධිපතිතුමා මම කියන්නේ ඉක්මනට මේ ගේට්ටුව හයිකරන්න ඕනා කියලා. නැත්තම් මේකේ වෙන දේවල් නවත්තගන්න බැරි වෙනවා.

**2026.02.10 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | ගරු නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |

7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලීප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.02.10 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - පී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්.චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
18. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
20. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිලිනි නෙත්සරණි මෙනවිය

**2026.02.10 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කරුණු වලට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.02.10 දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා

**06(6) 2026.02.10 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, එදත් මම කථා කළා, ලක්ෂ 34ක් දීලා ගෙනාපු ජේ.සී.බී.යන්ත්‍රය කොහොම හරි ගෙනාවා. පහුවෙනිදා කැඩුනා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සල්ලි දුන්නේ නැහැ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, සල්ලි දුන්නේ නැහැ, වෙරි ගුඩ්. ඔබතුමාගේ අනුමැතිය යටතේ ද ජේ.සී.බී.එක හදන්න ගියේ. අපි ඒ ගැන හොයලා බලන්න එපැයි. සල්ලි දුන්නැති එක හරි. ඒ මිනිස්සු අපට නඩුවක් දායි ද දන්නෑ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මගේ කාලේ නෙමෙයි හිටපු නගරාධිපතිතුමාගේ කාලේ

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඒ කියන්නේ සල්ලි දීලා නැනේ. එතකොට අනිත් ජේ.සී.බී.එක

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, අනිත් ඒක අපි හදන්න දැම්මා. ඒකේ සැලකිය යුතු වැඩ ප්‍රමාණයක් කරගෙන ගියා. ඇත්ත, ප්‍රශ්ණයක් තියෙනවා ඔබතුමා මතු කරන එක හොඳයි. මේ යන්ත්‍ර සූත්‍ර මම කියන්නේ මේවා ලොකු වියදම් දරලා හදන්නේ විශ්වාසයක් සහිතව වැඩක් කරන්න. හැබැයි මේ එක ජේ.සී.බී. යන්ත්‍රයක්වත් විශ්වාසයෙන් වැඩ කරන්න පුලුවන් විදිහට නෑ. ඒ නිසා අපි ගාල්ලේ හදන කෙනෙක් ගෙනල්ලා වාහනයක් හැදුවා ඒකත් සතියක් වැඩ කරනකොට ඒකෙත් නැවත පොඩි අලුත්වැඩියා කටයුත්තක් ආවා. මම හිතන්නේ ඒකේ වැඩ කටයුතු අද අවසාන වෙයි. අනෙක් එක පිළිබඳ අපට වහාම පරීක්ෂණයක් ඕන වෙයි.

**2026.02.10 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී. තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා

14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී. සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා
27. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
28. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
29. මහා නගර සභා මන්ත්‍රී - පී.සජිත් දුමින්ද පීරිස් මහතා
30. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
31. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා
32. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
33. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
34. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
35. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
36. මහා නගර සභා මන්ත්‍රී - එස්.චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
37. මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
38. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
39. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
40. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
41. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
42. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය
43. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා
44. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය
45. මහා නගර සභා මන්ත්‍රී - එච්.එල්.තිලිනි නෙත්සරණි මෙනවිය

**2026.02.10 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කරුණු වලට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.02.10 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.02.10 දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු සභා ගැබෙහි නොසිටියහ

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා

**06(7) 2026.02.11 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්ථාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම හිතන්නේ මේ ඵලදායිතා කියන කමිටුවේම තියෙන්නේ යම් ඵලදායිතාවට අවශ්‍ය කරන යම් නිර්ණායක සකස් කිරීම ඒ වගේම ඒ තියෙන සංකල්ප ක්‍රියාත්මක. ඒනිසා මම හිතන්නේ අපේ සභාපතිතුමා බොහොම දක්ෂ සභාපතිවරයෙක්, හැබැයි ඒ සහයෝගයෙන් ඵලදායිතාව කමිටුවේ සිද්ධ නොවන්නෙම ඵලදායිතාව නෙවෙයි කියලා තමයි මට හිතෙන්නේ. ඒ නිසා මේක වඩා ඵලදායි කරගන්න එතුමාගේ තියෙන ශක්‍යතාවයත් අරගෙන අවශ්‍ය කරන කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඵලදායිතාව සම්බන්ධය මටත් කරුණක් ඉදිරිපත් කරන්න තිබෙනවා. මොරටුව මහා නගර සභාවේ ඉඩම් , අන්යූස් ලෑන්ඩ් විශාල ප්‍රමාණයක් තියෙනවා. ඒවායින් ආදායම් උපයන මාර්ගයක්වත් කිසිම දෙයක් සාකච්ඡා වෙන්නේ නෑ. ඵලදායිතා කමිටුවක් තියෙනවා නම් ඒවා හරහා මේවා සාකච්ඡ කළ යුතුයි. මෙතන ජනවාරි මස බැනර් නාම පුවරු සඳහා ලබලා තියෙන ආදායම් මේකේ සඳහන් වෙනවා. මොරටුව වැනි මෙච්චර විශාල නගරය දැන්වීම් නාමපුවරු සඳහා මෙච්චර සුළුතර ආදායමද ලැබෙන්නේ. ඇත්තටම මේවා හාස්‍යයට කරුණු නගරාධිපතිතුමා. ඔබතුමන්ලා පරිපාලනය භාරගත්තනම් කලින් පරිපාලනයන් වලදි කරපු දේවල් එහෙම්මම කරනවනම්, ඇත්තටම ඔබතුමන්ලගේ අර පුනරුදය කියන එකටත් හරිම ලැජ්ජාවක්. පුනරුදයක් ගේනවානම් අඩුම ගානේ රටේ පුනරුදයක් විතරක් නෙමෙයි නගරයෙත් පුනරුදයක් ගේන්න මේ ඵලදායිතා කමිටුවේ සභාපතිතුමා ඔබතුමා අඩුම ගානේ මේ වැදගත් යෝජනා දෙකක් තියෙනවා. පුනරුදය හීනයක් නෙමෙයි පුනරුදය යථාර්ථයක් කරන්න කටයුතු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**2026.02.11 දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදන පිළිබද ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සදහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ජේ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |

| | | | |
|---|---|---|---|
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | ජේ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්.තිළිනි නෙත්සරණි මෙනවිය |

**2026.02.11 දින පැවති එලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කරුණු වලට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදි.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා |

**2026.02.11 දින පැවති එලදායිතාව හා මුදල් උත්පාදන පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |

**06(8) 2026.02.11 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම නිර්දේශයන් සලකා බැලීම.**

<u>ගරු මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 2(4) කරුණ කමිටුවෙන් ඉවත් කිරීමට නිර්දේශ කරලා තියෙනවා ඉදිබැද්ද ඩග්ලස් ප්‍රනාන්දු ක්‍රීඩාංගනයේ තිබෙන විශාල අඩුපාඩුකම් රාශියක් මම පෙන්නලා දීලා තිබෙනවා. කාර්මික නිලධාරී වාර්තාවෙත් ඒක පැහැදිලි කරලා තිබෙනවා. නමුත් මේක කමිටුවෙන් ඉවත් කරන්න තීරණය කරලා තියෙනවා මේ කිසිම දෙයක් වෙන්නේ නැතුව.ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා කමිටුවෙන් ඒක ඉවත්කරන හේතුව එන මුකුත් නෙවේ මේ වෙනකොට ක්‍රීඩා අමාත්‍යාංශය මගින් නගර සභා සතු ක්‍රීඩාංගනවල අඩුපාඩු සියල්ල ඉල්ලා ලේඛණයක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒනිසා ඩග්ලස් ක්‍රීඩාංගණය විතරක් නෙමෙයි අනිත් ක්‍රීඩාංගණ සියල්ලටමත් ක්‍රීඩා අමාත්‍යාංශයෙන් මුදල් අරගෙන ඔය සියල්ලෙම නඩත්තු කටයුතු පුළුවන් තරම් ඉක්මනින් අපි නිම කරනවා.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඉතින් අපි මේක තියමුකෝ කමිටුවේ.

<u>**ගරු මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිමා, මෙම කරුණු එක්කෝ කමිටුවේ තියෙන්න ඕනා, නැත්තම් ඒ නිර්දේශය එන්න ඕනා. මෙන්න මෙහෙම සියලුම තිබෙන ක්‍රීඩාංගන මේ වගේ සංවර්ධනය කරන්න තීරණයක් අරන් තිබෙනවා කියලා.

<u>**ගරු මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. රවීන්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, නිර්දේශයන් ආවට පස්සේ අපි ඊළඟ කමිටුවේදි ඉදිරිපත් කරමු.

<u>**ගරු මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, නැත්තම් මේක කමිටුවෙන් ඉවත්වුනා කියන්නේ එතනින්ම ඉවරයි.

<u>**ගරු මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, පළමුවෙනි එක තමයි මේ කර්මාන්ත කමිටුවේ බහුතර ඇමුණුම් සංඛ්‍යාවක් කියන්න බැරි මට්ටමේ තියෙන්නේ පේන්නේ නැහැ සමහර ඒවා. ඒනිසා ඇමුණුමක් එවනකොට ඒක කියවන්න පුළුවන් ආකාරයට එවන්න කියන ඉල්ලීම කරනවා. මේකේ 2(7) උක්ත කරුණ සළකා බැලූ කමිටුව මෙම වාර්තාවේ කරුණු අංක 2(3) හා මෙම කරුණ එකම කරුණක් ලෙස සම්බන්ධ කිරීමටත් ඊට අදාළව ලබා දී ඇති නිර්දේශ පරිදි ඉදිරි කටයුතු කිරීමටත් නිර්දේශ කරනවා, බොහොම හොඳයි ඒක. හැබැයි මේක සුරේෂ් ප්‍රේමකුමාර මන්ත්‍රීතුමා මේ එයා ගෙනාපු යෝජනාව එයා තමයි ඉස්සෙල්ලම ගෙනාවේ, එයා ගෙනාපු යෝජනවා අනිත් මන්ත්‍රීතුමා ගේනකොට මේක පැහැදිලිව සභාවේ කිව්වා. මේක අද නෙමෙයි කරන්න ඕන. සභාවේ කිව්වා එතුමා. කිව්වට පස්සේ එතුමම ගණන් ගන්නේ නැතුව ඒදා මේක යෝජනාව ගෙනල්ලා අද වෙනකොට ඒ යෝජනාවටම අරක සම්බන්ධ කරලා තියෙනවා. කන්න ඕන උනාම ගබරගොයා තලගොයා කියලා හිතාගෙන කනවනේ, අන්න එහෙම එකක් තමයි වෙලා තියෙන්නේ. අනිත් එක 2(11) තුසිත් මන්ත්‍රීතුමා ගෙනල්ලා තියෙනවා යෝජනාවක් පුරන්අප්පු රථ ගාලේ ඉහළ මහල සම්මන්ත්‍රණ සහ රංග ශාලාවක් බවට පත් කිරීම සම්බන්ධයෙන් ලිපිය සලකා බැලීම කියලා තියෙනවා. පුරන්අප්පු ග්‍රවුන්ඩ් එකේ උඩ කෑල්ල තියෙන්නේ මන් හිතන්නේ ක්‍රීඩා පිටිය. ඒ ක්‍රීඩාපිටිය නැති කරලා රංග ශාලාවක් හදන එකට අපි තදින් විරුද්ධයි. ඒනිසා මේකේ දාලා තියෙන්නෙ මේ සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියෙන් විමසීමක් සිදුකිරීමට නිර්දේශ කරන ලදී කියලා. ඒ කියන්නේ මේක කෙරෙන දෙයක් නෙමෙයි. කොහොමටත් නාගරික සංවර්ධන අධිකාරියෙන් අහන්න දෙයක් නෑ මේක සභාවට ගන්න පුලුවන් තීන්දුවක්. සභාවේ දේපළක්. හැබැයි අපි ඒකට විරුද්ධයි. ඒක කරලා තියෙන්නේ ක්‍රීඩාංගණයේ.ඒ කරුණු දෙක සම්බන්ධයෙන් තමයි කථා කළේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීවරුනි, ක්‍රීඩාංගණය නැති කළාම පක්ෂයි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මම ආයවන හා පෙත්සම් පැමිණිලි යටතේත් මේ සම්බනුධයෙන් කිවුවා. ප්ලෑනින් සෙක්ෂන් එකත් එක්ක සම්බන්ධ නිසයි කියන්නේ. අවුරුදු 20ක් තිස්සේ ඉඳන් සම්බන්ධ වෙලා ඉන්නේ ඒ නිසා ඔබතුමන්ලාට හැඳෙන්නයි කියන්නේ. මේක කොමසාරිස් පාලනයක් නෙවෙයි නගරාධිපතිතුමා. මේ එන්පීපී ඔබතුමන්ලාගේ පාලනයක්. වීථි රේඛා සම්බන්ධයෙන් කතා කළා. දැන් ප්ලෑනින් කමිටි එකට ෆයිල් එකක් ගියාම ගරු නගරාධිපතිතුමා ඒ ෆයිල් එකට අත්සන් කරන්න ඉන්නවා කිහිපදෙනෙක්. ඔබතුමා, නියෝජ්‍ය නගරාධිපතිතුමිය, නාගරික කොමසාරිස්තුමිය ඒ ඔක්කොම අත්සන් කරලා එවනකොට සුමානයක් විතර යනවා නගරාධිපතිතුමා. දැන් අපි කමිටුවකට ආවෙ නැත්නම් අපිට කමිටු දීමනාව හම්බවෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමන්ලා මේ දීමනාව ගන්නවානම් මේ නිලධාරීන් ටිකයි ඔබතුමන්ලයි ඒ කමිටුවේදීම අත්සන් කරලා දුන්නානම් නගරාධිපතිතුමා මිනිස්සුන් දැඩි අපහසුතාවයකට පත් වෙන්නේ නැහැ. අනෙක් එක තමයි ගරු නගරාධිපතිතුමා, දැන් දිගින් දිගටම එන්න එන්නම නීතිය දානවා යූඩී එකේ නිලධාරීන් සහ අපේ

ඉංජිනේරු අංශය බිම් කට්ටි පිඹුරු පතක් අනුමත කිරීමේ දී පර්චස් 06ට වැඩි වෙන්න එපැයි. අපේ ගෙදර පරණ ගෙයක් තියෙනවා. මම බිම් කට්ටි සැලැස්ම දානවා අනුමත වෙන්න. එතකොට ඒක අනුමත කරන්නේ නැහැ බිම් කට්ටිය ගොඩනැගිල්ල කඩා ඉවත් කරනවායි කියලා සටහන් කරන් ආවේ නැතිනම් අනුමත කරන්නේ නැහැ. යූඩී එකට ඕන විදියට වැඩ කරන්න එපා නගරාධිපතිතුමා. ඒ මිනිස්සු හරි පව්. මේ පරණ ගොඩනැඟිල්ල මෙම අනුමැතියෙන් ආවරණය නොවේ කියලා. අපි එහෙමයි දාන්නේ. දැන් මේ මාසයක දෙකක ඉදන් කෙලින්ම දානවා මේ බිල්ඩින් එක කඩා ඉවත් කරගත යුතුය කියලා. එතකොට නගරාධිපතිතුමා බැන්ක් ලෝන් එකකට යන කෙනා අනිවාර්යෙන්ම බැන්ක් ලෝන් එක ගන්න බැහැ ගේ නැහැනේ. ටු බී ඩිමොලිෂ් කියලා දාලා තියෙනවා. එතකොට මේ බිම් කට්ටියෙන් පස්සේ මේ බිල්ඩින් ප්ලෑන් එක දාන්න ඉන්නේ. සමහරවිට 1986 පෙර බිල්ඩින් ප්ලෑන් දාන්න ඕනත් නැහැ. කොහෙන් එන එකක්ද? ඔබතුමා දන්නේත් නැහැ. ඔබතුමාව නොමඟ යවලා. මේ නිලධාරීන්ට ඕන විදියට කරන්න බැහැ නගරාධිපතිතුමා. මේ කොමසාරිස් පාලනයක් නෙවෙයි. කොමසාරිස් පාලනයෙත් මෙහෙම තිබුණේ නැහැ. අපේ ප්ලෑන් දාන්න යන්නේ නැහැ. මිනිස්සු බැන බැන යනවා අපි දකිනවා. නගරාධිපතිතුමා මේ ආයාචනය කරන්නේ මේ දුප්පත් මිනිස්සු එනවා පර්චස් 6යි 7යි ඒ නිවස කඩනවා කිවුවාම නගරාධිපතිතුමා කොහේටද මේ මිනිස්සු යන්නේ. කවුද බැන්ක් ලෝන් එකක් දෙන්නේ. ඒ නිසා නගරාධිපතිතුමා ඔබතුමා දන්නෙත් නැහැ දැන් වීපී රේප් සහතික වලදීත් මම කිවුවනේ ඔබතුමාව දැනුවත් කරන්න එපැයි. ඔබතුමාගේ උපදේශකවරු ලේකම්වරු ඉන්නවානේ. ඔය කාගෙන්හරි අහන්න. ඔබතුමා ගෙන්නලා අහන්න ඒ මිනිස්සු හරි පව්. කඩා ඉවත් කලේ නැතිනම් ඒ සර්වෙයර් ප්ලෑන් එක පාස් කරන්නේ නැහැ. ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා මේ මිනිස්සුන් හිර කරන්නේ නැතුව ඔබතුමා ගෙන්නනන්න සෙක්ෂන් එකෙන්. නිලධාරීන්ට අවශ්‍ය විදියට වැඩ කරන්න දෙන්න එපා නගරාධිපතිතුමා. මිනිස්සු ගොඩාක් දොස් කියනවා. ජාතික හැඳුනුම්පත අරගෙන එන්න ඕන ඔරියල් ප්ලෑන් අරගෙන එන්න ඕන. මේ මොනවද මේ? ඔබතුමා වෙනම ම පොඩ්ඩක් ඒ අංශයට ගිහිල්ලා පෞද්ගලිකව නිලධාරීන් එක්ක කතා කරලා බලලා නිවැරදි කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතුමනි, සභා කර්මාන්තයන් සඳහා පසුගිය කාලේ තමුන්නාන්සේලා පාරවල් සම්බන්ධයෙන් විශාල වශයෙන් මුදලක් වෙන් කරලා මම හිතන්නේ පාරවල් ගණනාවක් කරගෙන යනවා. එතනදී තමුන්නාන්සේලා ගන්න ව්‍යායාමය සාර්ථක ව්‍යායාමයක්ද කියන එක පොඩි ප්‍රශ්ණක් තියෙනවා. සමහරක් මම පෞද්ගලිකව කවුරුවක්වත් ඔය නම් වලින් අහලා තිබුණට පුද්ගලික ඒ නම් ආශ්‍රිතව අඳුරන්නේත් නැහැ ඒ කොන්ත්‍රාත්කරුවන්ව. නමුත් සමහරක් අය වැඩ ගොඩගස්ස ගන්න වැඩ ගොඩක් ගන්න ඕනවට අඩුවට ටෙන්ඩර් දාලා ඒ මිලට කරන්නත් බැරි ගානට අරගෙන මේ කර්මාන්ත කරලා තියෙනවා සමහරක් අය. ඒ කර්මාන්ත මේ වනවිට කැඩිලා ගිහිල්ලා තියෙන තැනුත් තියෙනවා. ඉතින් ඒක නිසා අර හුඟක් අය බඳාගෙන කරගන්න ගිහිල්ලා ඒ අයගේ ලාභයක් ගන්න උත්සහයෙන් කරද්දි අතිවිශාල මුදලක් බදු මුදල් විශාල ප්‍රමාණයක් වෙන් කරලා ඒ කාර්ය කරලා ඒක ජනතාවට සුභ සිද්ධියක් වෙන්නේ නැතිනම් ඇත්තටම ඒක වැරදි සහගතයි. එහි ප්‍රතිඵලයක් නැහැ අපිට. දැන් සමහරක් ටෙන්ඩර් දාපු උදවිය සමහර අය කරන්න පුලුවන් හැකියාවක් තියෙද්දි සමහරක් අය කියනවා ඒ අයගෙන් අරගෙන ග්‍රාම සංවර්ධන සමිතිවලට දෙනවා කියලා. හැබැයි මේ සංවර්ධන සමිති වල නියෝජනය කරන ඇතැම් සභාපතිවරු දන්නේ නැහැලු ඒ වැඩ ඒ අයට දාලා තියෙනවා කියන එක. මම දන්නේ නැහැ මේකේ ක්‍රමය මොකක්ද කියන එක. සමහරක් පාරවල් නම් වශයෙන් කියන්නත් පුලුවන් මේ වනවිට කැඩිලා ගිහිල්ලා තියෙන පාරවල්. ඒ නිසා ගෙවීම් කරද්දි ඒ රිටෙන්ෂන් ලබාදීමේ දී හරියට බලලා ඉවර වෙලා ඒක රිලිස් කරන්න කටයුතු කරන්න. නැතිනම් එයින් ප්‍රතිඵලයක් ලැබෙන්නේ නැහැ. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතුමනි, අපේ සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා කාර් පාර්ක් එක ගැන එහි කරන්න යන ගොඩනැඟිල්ල ගැන කතා කළා. ඇත්තටම ඒ ගොඩනැඟිල්ල මම පොඩි කාලෙත් දැකලා තියෙනවා එතැන ඒ පාර්ක් එක ලස්සනට තිබුණා. කෝච්චි පෙට්ටියක් තියලා, ගස් වවලා, එතැන ක්‍රිකට් ගහනවා ලස්සනට තිබුණා. අපිත් සෙල්ලම් කරලා තියෙනවා. හැබැයි ඒක අදටත් එහෙම තිබුණනම් හොඳයි.

නමුත් කවුරුන් හෝ කෙනෙකුගේ අවශ්‍යතාවයකට කෝටි 40කට ආසන්න මුදලක් වියදම් කරලා ඔය කාර් පාර්ක් එක හදලා තියෙනවා. එහෙම හැදුවට පස්සේ ඒක තවදුරටත් ක්‍රීඩාංගනයක් නෙවෙයි නගරාධිපතිතුමා. ඒක දැන් උඩ ලස්සනට තියෙනවා. ඒ වුණාට ඒ වියදම් කරපු මුදලේ හැටියට අපිට ඒක එහෙම තියන්න බැහැ. ඊට වඩා ඵලදායී දෙයකට එය යොමු කරන්න ඕන. මොකද ඒකට ආයෝජනය කරලා තියෙන මුදල ඒක නිකන් තිබුණානම් හොඳයි. හැබැයි දැන් ඒකට ආයෝජනය කරලා තියෙන මුදල අනුව අපිට අනිවාර්යෙන්ම ඒකට බැඳිලා ඉන්න ඕන මොකක්හරි දෙයක් කරන්න. කාර් පාර්ක් එකක් කියලා නිකන් කොන්ක්‍රීට් කණු ටිකක් දාලා තියෙනවා කොන්ක්‍රීට් ස්ලැබ් එකක් දාලා තියෙනවා විශාල වශයෙන් වියදම් කරලා. ඒක නිසා තමයි අපි මේ යෝජනාව කළේ. අනෙක් එක යූඩී එකට අපි මෙයින් ප්‍රශ්ණයක් අහලා නැහැ. මේ ගොඩනැඟිල්ල හදලා තියෙන්නේ යූඩී එකෙන්. අපේ ස්ට්‍රක්චරල් එක්සැමිනේෂනල් එකක් කරන්න ඩ්‍රොයින්ස් ටික ඉල්ලලා තියෙනවා යූඩී එකෙන්. ඒක ආවට පස්සේ අපි අපේ ස්ට්‍රක්චරල් ඉංජිනියර් කෙනෙක්ගෙන් ස්ට්‍රක්චර් ඇඩ්වයිස් එකක් ගන්නවා මේ උඩ අපි බලාපොරොත්තු වෙන දේ කරන්න පුළුවන්ද බැරිද කියලා. බැරිනම් අපි අතහැරලා දානවා. මේක ඇවිත් මේ අඩිය තිබ්බා විතරයි තවම.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතුමනි, සේනක මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයක් සම්බන්ධයෙන් පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕන. සමහර ව්‍යාපෘති දෙනකොට සමහර සමිතිවල සභාපතිවරු දන්නෙත් නැහැ වගේ අදහසක් ආවා. ඒක එහෙම වෙන්න බැහැ. මොකද සමිතියකට අපි ව්‍යාපෘතියක් දෙනවානම්, පළමුවෙන් ඒ සමිතිය ඒ ව්‍යාපෘතිය ඉල්ලා රික්වෙස්ට් කරලා ඒ ලිපිය භාර දෙන්න ඕන. අපේ මේ සමිතියට මේ ව්‍යාපෘතිය කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා අපිට හැකියාව තියෙනවා කියලා ඒ ලිපිය දෙන්න ඕන. ඊට පස්සේ ඉන් අවසානයේ ඒ සියලු ප්‍රොසිඩියර් ඉවර වුණාට පස්සේ ගිවිසුමක් අත්සන් කරන්න ඕන. මම හිතන්නේ ඒක පිළිගන්න බැහැ. ඒ සමිතියේ සභාපති හෝ ලේකම් හෝ බලය තියෙනවානේ. ඒ ඒ අයගේ අවබෝධයෙන් යන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එහෙම තියෙනවා. දොන් කරෝලිස් ඒක ඉස්සරහා තියෙන පාර හදලා තියෙන්නේ එහි ග්‍රාම සංවර්ධන සමිතියේ මහේෂි කියලා කෙනෙක් සභාපති ඉන්නේ. නමුත් ඒ අයගෙන් ලියුමක් ගන්නේ නැතුව ඊට අල්ලපු වසමේ සමිතියේ තමයි කොන්ත්‍රාත් එක කරලා තියෙන්නේ. ඉතින් එහෙම ඒවා තියෙනවා.

**සභා ඝෝෂා**

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතුමනි, ඒක හරි. ඒ කියන්නේ අදාළ සමිතිය නැතිනම් ඊළඟ සමිතියට යනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එගොඩඋයන උතුර ග්‍රාම සංවර්ධන සමිතිය ලියාපදිංචි වෙලා නැහැ. ඒ නිසා තමයි අල්ලපු ආසනයේ ග්‍රාම සංවර්ධන සමිතිය භාර ගත්තේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී. සජිත් දුමින්ද පීරිස් මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ කාරණය මතුවුණාට පස්සේ උත්තර නොදී බැහැ. ඒක දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වෙලා තියෙන සමිති වල වැඩිම මුදලක් තියෙන ශීර්ෂයක් තියෙන සමිතිය එගොඩඋයන උතුර ග්‍රාම සංවර්ධනය සමිතිය. ඒක අවුරුදු ගාණකට පස්සේ තමයි ඡන්ද විමසීම් කළේ. එතකොට ඔය කියන කාළය ඇතුලත තමයි හරිනම් ඔය භාර දුන්න එකේවත් තවම ඡන්ද විමසීමක් කරලා නැහැ. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, අපි කියන තර්ක නෙවෙයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසන්න ඕන. ඒ නිසා ඒකෙන් ගත්තාට පස්සේ රු.70000කට තිබුණ අද ශේෂය භාරලක්ෂ ගාණකට වැඩි වෙලා තියෙනවා. ඒ වගේම උතුර කොට්ඨාසයේ තියෙන එගොඩඋයන

ග්‍රාමසේවා නිලධාරී කාර්යාලය සුහුරු කේන්ද්‍රයක් විදියට ඵලදායිතා සම්මානය ලැබුවා. ඒක හැදුවෙත් ලක්ෂ 8ක වියදමින් ලක්ෂ 35කින් විතර එන ව්‍යාපෘතියක් නිම කරලා ඵලදායිතාව කළේ ඔය සමිතියෙන්. එහි අනුශාසකත්වය දැරුවේ අපි. ඒ නිසා අද වෙනකොට එහි සම්පතුත් වත්කමුත් අත්පත් කරලා දීලා තමයි තියෙන්නේ. ඒ නිසා කියන්න බැහැ ඒක එහෙම නෙවෙයි කියලා. එපමණක් නෙවෙයි අද ලක්ෂ තුන හතරක් වටින විශේෂයෙන් අපේ ශබ්ද විකාශන යන්ත්‍ර පද්ධතියකුත් ලබාදීලා තියෙනවා. ලක්ෂ 18කට විතර තියෙන වියදමක් ලක්ෂ 35කට විතර නිර්මාණයක්. ඔබතුමා ගිහිල්ලා බලන්න ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කොහොමද කරලා තියෙන්නේ කියලා. එන් පී පී එකෙන් පත්කරපු ආරක්ෂක කමිටුවේ සභාපති ගිහිල්ලා දොන් කරෝලිස් එකෙන් සල්ලි අරගෙන නෙවෙයි එවැනි දේවල් ඉල්ලලා නැහැ.

ගරු නගරාධිපතිතුමනි, අනෙක් එක තමයි මගේ හිතවත් තුසිත මන්ත්‍රීතුමා මතක් කළා ඒක එතුමා හරියට දැනගන්න ඕන කෝටි කීයද? ලක්ෂ කීයද? කියන එක පිළිබඳව එතුමන් දැනුවත් වෙන්න කියන දේ කියනවා. අනෙක් එක නගරාධිපතිතුමනි, ඕක හදනකොට ඔබතුමත් දන්නවා ඔබතුමත් අවුරුදු ගණනාවක් මෙතනත් හිටියා. මෙතන ඔය සභාව ඉස්සරහා තිබුණ වැසිකිලියේ තමයි වීපී ගණිකාවෝ ගිහිල්ලා රිංගුවේ. ඒ නිසා අපි අද යනකොට යූඩී එකෙන් යනකොට එහි වීපී ගණිකාවො දෙන්නෙක් හිටියා ඊට එහා පැත්තේ. අනෙක් එක හවස ගංජා, අයිස් ගහලා ඉන්නවා තරුණයෝ. ඒනිසා මේක හරි සුඛිත මුදිත වෙලා තියෙන එකක් නෙවෙයි. ගරු නගරාධිපතිතුමනි, මේක හරියට පරික්ෂණ කරලා ඒ වගේම යූඩී එකේ සල්ලිත් නෙවෙයි විශේෂයෙන් අමාත්‍ය වෙත භාර දෙනකොට ලොකු ලොස්ට් එකක් තිබුණේ. ඒක පියවලා ගත්ත ලාභයෙන් තමයි මෙයට ආයෝජනය කළේ ඒක භාණ්ඩාගාරයට යවලා. ඒක නිසා ඵලදායිතාවය කියන්නේ මෙහි තියෙන සංකල්ප ටික හරියට ක්‍රියාත්මක කරලා ක්‍රියාත්මක කරන එක. කෝ ඒ සංකල්ප. ඒක ගේන්න ඒකයි ඵලදායිතාවය. මේකේ තියෙන අර මොරටුව විශ්ව විද්‍යාලයත් එක්ක අපි කතා කලා කොහොමද ටෙක්ස්ටයිල් යුනිට් එකත් එක්ක කරන වැඩ ටික ගේන්න. අනෙක් පැත්තෙන් මෙහි තියෙන ඉතිරි කොටස අපි ගත්තම වඩු කෞතුකාගාරය සහ විශේෂයෙන්ම ආයෝජකයාගේ සංචාරක ආකර්ෂණය කරගෙන ඉදිරි වැඩ ටික ගේන්න. කෝ පුරන්අප්පු චත්‍රස්‍රය? මෙන්න මේ වැඩ ටික ගෙනාවොත් තමයි ඵලදායිතාවය එන්නේ. එහෙම නැතිනම් මේකේ අර තියෙන ග්‍රීන් ෂැඩෝ එක නැති කරලා අපිට ඕන හැටියට කඩලා හදන එක නෙවෙයි. ඒ නිසා ගිය ආණ්ඩුවත් සමහරක් විට මොන ආණ්ඩුව වුනත් තමන්ගේ හිතවතුන්ට කඩ දුන්නානම් ඒත් එක්ක ඩිගෝෂේට් කරලා වැඩේ කළා එහෙම නොවුන විදියට. ඒ නිසා මේකත් ඒ ප්‍රතිපත්තියට යනවා නම් ගරු නගරාධිපතුමනි ඒකයි වරද. ඒ නිසා ගරු නගරාධිපතුමනි, ඵලදායිතාවය කියලා කියන්නේ තියෙන අපේ පාරිසරික තිරසට සංකල්ප නැති කරලා ගහන ඒ එක කඩක් නෙවෙයි. ඒ කඩේට ගියොත් කේසෝන් එකෙත් කඩ පේළියක් තියෙනවා. කොස් කඩ ගහනවා වගෙත් නෙවෙයි. ඒ නිසා තවත් දූඹුරු සිනි කඩයක් ගහනවා වගෙත් නෙවෙයි නගරාධිපතිතුමනි. ඒක නිසා තවත් එය වීපී ගණිකාවන්ගේ සුරපුරයක් වෙලා තිබුණ තැනක්. ඒ වගේම අයිස්, හෙරෝයින් ගහන අයගේ මධ්‍යස්ථානයක් වෙලා තිබුණ තැනක්. අද යෝජනාවක් ගෙනෙල්ලා තියෙනවා ඒක ඵලදායිතාවයෙන් යුතුව ගෙනියන එක ඔබතුමාගේ වගකීමක්. ඒ නිසා එය ඉටු කරන්න. එහෙම නැත්නම් යන්නේ කොහොද මල්ලේ පොල් වගේ වැඩ කරන්න එපා.

**සභා ඝෝෂා**

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, සෝර නාඩු ගොඩක් තියෙනවා. ඒ කොච්චර තිබුණත් මේ රට දියුනු කරලා මේ රට අවශ්‍ය තැනට අරගෙන යන වැඩේ අපි අරගෙන යනවා. ඒ සංවාදයෙන් නෙවෙයි අපි හරි තැනකට ගෙනියනවා. එදා කමිටුව පැත්තෙන් වැදගත් දෙයක් මතු කළා ඔසඳ මන්ත්‍රීතුමා. එයට පිළිතුරක් දෙන්න ඕන. අපි හැමෝම දන්නවා අපේ කර්මාන්ත අංශයේ සැලසුම් පැත්තේ සැලසුම් පැත්ත විතරක් නෙවෙයි බොහෝ පැති එහෙමයි. නමුත් ඇත්තටම ජනතාව විශාල ලෙස රස්තියාදු වෙන සහ විශාල අක්‍රමිකතා සිද්ධ වෙච්ච ස්ථානය තමයි මේ කතා කළේ. එහි යම් අවම මට්ටමකට ඇවිල්ලා තිබෙනවා නමුත් තවදුරටත් බේරන්න ගැටලු ටිකක් තියෙනවා. ඒ නිසා මගෙ අනවබෝධයෙන් නෙවෙයි සමහර ඒවා සිද්ධ වෙන්නේ. මම දන්නවා ඒත් හොඳ අවබෝධයකින් මේ කටයුත්තට මැදිහත්

වෙමින් ඉන්නවා. මේ වෙනකොට මේ තිබුණ සැලසුම් කමිටු දෙකේම ඉන්න ඕන නිලධාරීන් 8.30 වෙනකන් තියාගත්තා. ඔබ කිවුවා හරි බාහිර නිලධාරියෙක් තමන්ට අවශ්‍ය විදිහට යම් හසුරවන්න උත්සාහයක් තියෙනවා. එකක් නොදැක්කා නෙවෙයි. නමුත් සැලසුම් වල තිබෙන තාක්ෂණික පැත්ත පිළිබඳව ඉගෙන ගනිමින් ඉන්නවා. ඒ අවබෝධ කරගන්න ප්‍රමාණයෙන් ඒවා ප්‍රශ්න කරනවා අපේ ඉංජිනියර්, අපේ කොමසාරිස්තුමිය ළඟ තියාගෙන. මොකද මට විශ්වාස මගේ නිලධාරීන්. ඒ නිසා මේ එකෙන් එක ප්‍රශ්ණ කරනකොට බොහෝ ගැටලු සහගත ඒවා තියෙනවා. ඒ නිසා මේ සභාවේම උදවු අවශ්‍යයයි. මම සති දෙකෙන් සැලසුම අනුමත කරන්න ඕන ඒ සඳහා පොරබදනව ඒ සඳහා වැඩ සැලැස්මක් හදල තියෙනවා. ඒක කොහොමද වෙන්න ඕනෙ කියලා අදාළ නිලධාරීන්ට ඒ අංශයේ ඉන්න ඔක්කොම අරගෙන තියෙනවා පීයන්ලාගේ ඉඳලම. නැවත නැවත පැහැදිලි කිරීම් කරලා තියෙනවා. ඒ නිසා දැන් ඉස්සරහට මේවා ක්‍රියාත්මක වෙන්න ඕන. හැබැයි තැන් තැන් වලින් මේවා පනින බව දන්නවා. ඒ නිසා ඒකත් එක්ක පොර බදනවා. වගකීමෙන් කියනවා ජනතාවට රස්තියාදු වෙන්න දෙන්නේ නැහැ. ඒ කියන්නේ ඒ ගැන තාක්ෂණික ගැටළුවක් නැතිනම්. මට හම්බවෙන සමහරක් ඒවා තියෙනවා එක්කෙනෙක් තමන්ගේම නිවස අනුමත කරගෙන. තනි කෙනෙක්. එහෙම ඒවා තියෙනවා. ඉතිහාසයේ පුදුම සහගත ඒවා වෙලා තියෙනවා. යූඩී එකෙන් දැන් දැනුම් දීල තියෙනවා නීතිමය කටයුතු කරන්න. ඉතිහාසය ඒ තරමට මේක සම්පූර්ණම ඉතාම දූෂිත වෙච්ච වැඩක්. ඒ නිසා මට උදව් කරන්න. මෙතැන ජේන වැරදි පෙන්නලා දෙන්න ජනතාව රස්තියාදු වෙනවානම් ඒ රස්තියාදු වීම ඔබට වාර්තා වෙනවා නම් කරුණාකරලා අරන් එන්න. අපි කොහොමද ඒ උදව්ව කරන්න පුලුවන්, මොන විදිහටද අපි මැදිහත් වෙන්න ඕන, දැන් මම දන්නවා මගේ ටී.ඕ. , ඉංජිනිය නේද ඉතාම වගකීමෙන් කියනවා මේ නිශ්චිත මොහොතේ මම හිතනවා මම විශ්වාස කරනවා අර හිටපු අය වගේ නෙවෙයි. ඒ අයගේ කාර්යක්ෂමතාවය හඳාගන්න ඕන. අර මෙතෙක් අපි දැක්කේ මුදල් වලට මම ඕනතරම් මේ සභාවේ විවේචන කරලා තියෙනවා. අද එහෙම මුදල් අතට ගන්න එකක් මට ඒ නිලධාරින්ගේ පැත්තෙ ජේන්නේ නැහැ. නමුත් පහළ මුදල් යන එකත් තියෙනවා. ඒක හෙට අනිද්දා වෙනකොටම කොටු කරගන්න එක කොටු කරගන්නවාම තමයි. බොහොම ස්තූතියි ඔබ ඒ ප්‍රශ්න මතු කළාට. හැම එකකටම උත්සාහ දරමින් ඉන්නවා සභාවෙ ඔබ හරි එය මතු කරපුවාම මම ගනිමින් ඉන්න ක්‍රියාමාර්ග පිළිබඳවත් ඒකේ තියෙන අඩු ලුහුඬුකම් පිළිබඳවත් මම දැඩි අවධානයෙන් ඉන්නවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතුමනි, තව පොඩි දෙයක් බලාපොරොත්තු වෙනවා ඔසඳ මන්ත්‍රීතුමා කියපු දේ අනුව, සැලසුම් කමිටුව නියෝජනය කරන සාමාජික සංඛ්‍යාව ඉන්නවානේ, ඇයි එදා දවසේ ඒ අයට අත්සන් කරන්න බැරි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, දැන් මේ පළවෙනි එක බැරි වුණේ උප නගරාධිපතිතුමිය හිටියේ නැහැ. එදා දවසේ කොමසාරිස්තුමිය ඉන්නවා. ඉංජිනේරුතුමා, කොමසාරිස්තුමිය අත්සන් කරනවා. සමහර වෙලාවට කොමසාරිස්තුමියගේ අත්සන යම් පමාවක් දවසකදී, කොහොමත් ඊට පහුවෙනිදා වරුවෙන් මේ අත්සන් ටික ඉවර වෙන්න ඕන.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම් තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් ඉදිබැද්දට සාමාන්‍යයෙන් ප්‍රයිවට් ත්‍රීවිල් එකක ගියා කියන්නකෝ. යන්න ගන්නේ පළවෙනි කිලෝමීටරේට රුපියල් 100යි. ඊට පස්සේ 80යි. හැබැයි ඉදිබැද්දට ගිහිල්ලා එන්න ප්‍රයිවට් ත්‍රීවිල් එකක ගියත් රුපියල් 450යි 500 වදින්නේ. හැබැයි මෙහෙන් අය කරනවා රුපියල් 900ක්. විල්ලෝරාවත්ත කෙළවරට ගිහිල්ලා එන්න රුපියල් 1500ක් අයකරනවා. ඉතින් මේක සංශෝධනය වෙන්න එපැයි ගරු නගරාධිපතිතුමා. මේක ලොකු අසාධාරණයක්නේ. මේවා ටිකක් නිවැරදි කරන්න.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලා මුදල් කමිටුවට මේ කාරණා යොමු කරන්න ඇවිල්ලා සාකච්ඡා කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම් තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැන් වරිපනම් එකට වීපී රේඛා ගන්නකොට වරිපනම් ගෙවලා කියලා මෙතන තියෙනවා ගිහිල්ලා කවුන්ටර් එකට ගිහින් අත්සන් කරගෙන එන්න පුලුවන්. නමුත් ඒක පිළිගන්නෙත් නැහැ. ඒ මනුස්සයා රිසිට් එක ගෙනාවේ නැතිනම් කියනවා අවුරුද්දටම ගෙවලා තියෙන්නෙ නැවත රුපියල් සීයක් හරි ගෙවලා රිසිට් එකක් අරන් එන්න ඕනේ මෙතනට. ඒක දුන්නේ නැතිනම් භාර ගන්නේ නැහැ. ඇයි දෙවියනේ මෙතනින් ගිහිල්ලා අතනින් අපි කවුළුව ළඟට අරගෙන ගිහිල්ල අපි ඒක අත්සන් කරගෙන එනවානේ ගෙවලයි කියලා. ඒක පිළිගන්නත් බැහැලු රිසිට් එකම ඕනලු. ඒ කියන්නේ අතින් ගෙවන එකවත් මේ අය පිළිගන්නේ නැහැ. එහෙනම් ඉතින් තේරුමක් නැහැ. මේ නගර සභාවේ එහා පැත්තේ අත්සන් කරන එක මේ පැත්තෙන් පිළිගන්නේ නැතිනම් ඒවා ටිකක් ලිහිල් කරන්න කියන ඉල්ලීම කරනවා ගරු නගරාධිපතිතුමනි.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ ගැටලු සහගත තැන් වෙන වෙනමත් ඇවිල්ල සාකච්ඡා කරමු කමිටුවලත් සාකච්ඡා කරමු. ඒ කියන්නේ මේ සභාවට යටින්නේ මමත් ඉන්නේ. නිලධාරීන් කාටවත් හිතුවක්කාර විදියට වැඩ කරන්න බැහැ. ඔවුන් අනිවාර්යෙන්ම නීතිය පැත්තෙන් කල්පනා කරලා වැඩ කරනවා. අපි කොහොමද මොරටුවේ ජනතාවට වඩාත් ගැළපෙන විදියට මේ තත්ත්වයන් වෙනස් කරගෙන යන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, දැන් සර්වයර් ප්ලෑන් එක බලන්න යන්න 1500යි. ආයේ බිල්ඩින් ප්ලෑන් එක බලන්න යන්න 1500යි. එකම ගේ. ආයේ වීපීරේඛා ගන්න 1500යි. රුපියල් 5000ට 6000ට වඩා යනවා එකම වැඩේට යන්න. ඒවා වෙනස් වෙන්න ඕන නගරාධිපතිතුමා.

**2026.02.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රි - - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රි - - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රි - - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රි - - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රි - - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රි - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රි - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රි - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රි - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රි - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රි - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රි - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රි - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රි - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රි - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රි - ජීවන්ත සෙනෙවිරත්න මහතා

| | | | |
|---|---|---|---|
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සරෝජනී මැන්දිස් මහත්මිය |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2026.02.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.එල්.තිලිනි නෙත්සරණි මෙනවිය |

**2026.02.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ කරුණු අංක 02 (26) හා කරුණු අංක 02 (27) ට පක්ෂවත්, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධවත් පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා |

**2026.02.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

| | | | |
|---|---|---|---|
| 01. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |

**2026.02.11 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය) |

**06(9) 2026.02.18 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සළකා බැලීම.**

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජීත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මුදල් පිළිබඳ ස්ථාවර කාරක සභාවේ දී ප්‍රථමයෙන්ම කියන්න තියෙන්නේ අපේ මේ මහා සභාව. මෙහි සෙල්ලම් කරන්න කාටවත් බැහැ. හැබැයි මේ මන්ත්‍රීවරුන්ට වාර්තා එවනකොට ඒ වාර්තාව සම්බන්ධයෙන් ප්‍රශ්ණ තියෙනවා. ඊට පස්සේ මේ තව වාර්තාවක් එවනවා. මේ වාර්තාව නිත්‍යානුකූල නැහැ. මෙහෙම වාර්තා එවන්න බැහැ. ලේකම්ට ඕන ඕන විදිහට අපිට වාර්තා එවන්න බැහැ. අපිට නිවැරදිව එවන්න ඕන. ඒ නිසා මේ වාර්තාව අපි පිළිගන්නේ නැහැ. මේක කියවන්නෙත් නැහැ. මේකේ තියෙන ඒවා අපිට අදාලත් නැහැ. ඒ නිසා අපේ මුදල් ස්ථාවර කමිටුව කියලා තියෙන්නේ එකයි. මේක තමයි අපි පිළිගන්නේ. එතකොට ගරු නගරාධිපතිතුමනි, අපිට එවල තියෙන මුදල් කමිටුවේ, මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා 02(1) මේ මේ දිගින් දිගටම මුදල් කමිටුව වරදක් කරනවා මේ අනුකමිටු පත්කරනවා. අනුකමිටු පත් කරන්න මුදල් කමිටුවට බලයක් නැහැ. අනු කමිටු පත් කරන්න බලය තියෙන්නේ මහා සභාවට. ඔබතුමාට බලය තියෙනවා පත්කරන්න කමිටු. මුදල් කමිටුවේ දී අනුකමිටු පත්කරන්න බලයක් නැහැ. ඒක එකක්. අනෙක් එක දැන් මේ නගර සභාවේ දැන් ලේකම්ට වැරදුනාම ලේකම් දෙපාර්තමේන්තුවෙන් අපිට එවනවා මේක නිවරදි කරලා අපිට ආපහු කොළ මිටියක් එවනවා. නමුත් මේ වාර්තාවේ අපිට අත්‍යවශ්‍ය ඇමුණුම අපි බලාගන්න ඕන ගිහිල්ලා පහුගිය සභා වාර්තාවල් හොයලා ඒ වාර්තාවල් පෙරලලා ඒවා බලාගන්න ඕන. අපිට හදිස්සියේදී මේ වාර්තාව පෙරළලා ඉවරවෙලා අපිට බලාගන්න බැහැ. දැන් මේකෙ උදාහරණයක් තමයි 2025.09.19 දිනැති මුදල් කමිටු වාර්තාවේ ඇමුණුම් අංක 11 ලෙස ඉදිරිපත් කර ඇත. අන්ත අසරණ වෙනවා මන්ත්‍රීවරු හැටියට මොකද හේතුව අපිට මේක ඒ අවශ්‍ය දත්තය හරියට ගන්න බැහැ. ඒක සමහර වෙලාවට මේ අවස්ථාවේ ඔබතුමාලගේ පැත්තටත් අවාසි වෙනවා අපේ පැත්තටත් අවාසි වෙනවා. සමහර වෙලාවට හරි දේ, අපි කතා කරන දේ වැරදි වෙන්න පුළුවන්. මොකද ඒ වාර්තා අපි දකින්නේ නැතුව තමයි මේ කතා කරන්නේ. එතකොට අපි කතා කරන දේ වැරදි වෙන්න පුළුවන්. එතකොට ඔබතුමන්ලාට අපි අසාධාරණයක් කළා වෙන්න පුලුවන්. ඒක එකක්. තව එකක් තියෙනවා නගරාධිපතිතුමා 02 (3) නාගරික ගණකාධිකාරී ආදායම් විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් කරුණු සලකා බැලීම. විශය වරිපනම් බදු මුදල් කපා හැරීමේ ගැටලු, අන්තර්ගත කරුණු තක්සේරු ප්‍රතිශෝධන වලදී සිදුවී ඇති වරදක් හේතුවෙන් කියලා මෙහි දිගට තියෙනවා උක්ත කරුණට අදාළව නාගරික ගණකාධිකාරී විසින් පහත සඳහන් වාර්තාව ඉදිරිපත් කරන ලදී කියලා ඉදිරිපත් කරලා තියෙනවා. ආපහු විෂය ලිපිගොනු අංකය කොට්ඨාශය කියල මේකේ ආපහු අංකයක් 02(3) යටතේ ඉදිරිපත් කර තිබෙනවා විශාල වාර්තාවක්. ඊට පස්සේ මේකේ අවසානයේ තියෙන්නේ මේකේ දෙකේ තුනද හතර ද කියලා අපි දන්නේ නැහැ. උක්ත කරුණු සලකා බැලූ කමිටුව කියලා ආපසු තියෙනවා එකක් සලකා බැලූ කමිටුව ඉහත වාර්තාවේ සඳහන් දඩ මුදල වන රුපියල් 3332.60 මුදල කපා හැරීමටත්, මේ වනවිට ඉහත දේපළ සඳහා 2026 එක කාර්තුව වනවිට ඇති රුපියල් 214346.20 ක බදු මුදල වාරික වශයෙන් අයකිරීමටත් නිර්දේශ කරන ලදි. එතකොට මේ දඩ මුදල් කපා හරින්න මේකේ දැන් ගෙවන්නේ නැතුව දඩ මුදල ගෙව්වාම ඒක කපා හැරලා තමයි මෙහි තියෙන්නේ. නමුත් මේක මොකක්ද කියලා අපි දන්නේ නැහැ. මොන කරුණෙද දඩ මුදල් කපා හැරලා තියෙන්නේ කියලා අපි දන්නේ නැහැ. අපිට අවබෝධයක් නැහැ මොකද 02 (3) තියෙන්නේ වෙන කරුණක්. මේකේ අන්තිමට එනකොට තියෙන වෙන කරුණක්. ඒ නිසා අපිට එතන ප්‍රශ්නයක් තියෙනවා අපි දන්නෙ නැහැ මේ සම්පූර්ණ මේ කමිටුවම කණපිට හැරිලා තියෙන්නේ. ඊට පස්සේ ආපහු අංකයක් නැහැ. ආපසු තියෙනවා උක්ත කරුණට අදාළව නීති නිලධාරී විසින් 2026.02.13 දිනැතිව පහත සඳහන් වාර්තාව ඉදිරිපත් කරන ලදී කියලා. ගිවිසුම් ප්‍රවේශ මුදල කපා හැරීමට තීරණයක් ගනු ලැබ ඇත. ගිවිසුම්ගත ප්‍රවේශ මුදල ඒ කියන්නේ මේකෙදි වෙලා යන නිසා මම මේක කියවන්නේ නැහැ. ආපහු තියෙනවා උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත නීති නිලධාරිගේ වාර්තාව සඳහන් පරිදි බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන නීති නිලධාරී වෙතින් උපදෙස් ලබා ගැනීමට නිර්දේශ කරන ලදී. මේවා මොනවාද කියන්න අපිට තේරෙන්නේ නැහැ. මේක පොඩ්ඩක් ඔබතුමාත් කියවලා බලන්න. ඔබතුමාට පැහැදිලි වෙන්නෙත් නැහැ. ඒක නිසා මේ වාර්තාවක් එවනකොට මේ වාර්තාවේ අවසාන වාර්තාව අත්සන් කරන්නේ සභාපතිවරයා හැටියට

ඔබතුමා. ඒ නිසා ඔබතුමාට සිද්ධ වෙනවා සියලු වගකීම් ගන්න. ඒ සම්බන්ධයෙන් අපි ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු නගරාධිපතිතුමනි, අංක 04 කියලා දෙකක් තියෙනවා. උත්සව අත්තිකාරම් සාමාන්‍යයෙන් උත්සව අත්තිකාරම් ගෙවන්න චක්‍රලේඛනයක් ආවට පස්සේ මම දන්නේ නැහැ මුදල් කමිටුවට එන්නේ ඇයි කියලා. එහෙම මුදල් කමිටුවට ඒමට වුමනාවක් තියෙනවාද කියන එක අපි දන්නේ නැහැ. හේතුව ඒක චක්‍රලේඛනයක් ඇවිල්ලා තියෙන එකක්. ඉතින් ඒක ආවට ප්‍රශ්ණයක් නැහැ අපිට. හැබැයි ඉතින් මේක මේ ඔබතුමා බලන්න මේ හතර හතර කියලා දෙකක් තියෙනවා උත්සව අත්තිකාරම් ගැන කරුණු දෙකක් තියෙනවා. ඊට පස්සේ හය තියෙනවා ඊට පස්සේ තියෙන්නේ අට. හත නැහැ හත අතුරුදහන් වෙලා. ඇමුණුම් අංක හතර කියල තියෙනවා. ඒකට ඇමුණුම් අංක හතරේ සඳහන් කරුණ නැහැ. එතකොට අට, නවය තියෙනවා දහය, එකොළහ තියෙනවා මේ ඒකෙත් ඇමුණුම් අංක හය සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා ඇමුණුම් අංක හය. මේ ඇමුණුම් අංක හය කියලා අතින් ලියපු එකක් තියෙනවා ඒක කියවන්න මම දන්නේ නැහැ කියවන්න පුලුවන්ද කියලා. ටයිප් කරපු ඒවත් තියෙනවා අංක 6 කියලා කරදියාන සම්බන්දයෙන් අංක හය කියලා විශාල කොළ තොගයක් තියෙනවා. මේකෙ ගිවිසුමක් තියෙනවා අංක හය කියලා. ඊට පස්සේ ආපහු දහතුන ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. දහතුනේ දෙකක් තියෙනවා. නාගරික ගණකාධිකාරී ආදායම් විසින් ඉදිරිපත් කරන ලද කරුණ සලකා බැලීම කියලා දහතුනෙන් දෙකක් තියෙනවා. එහි මම නිර්දේශයට අවධානය යොමු කරනවා. උක්ත කරුණු සලකා බැලූ කමිටුව ඉහත සඳහන් ඇමුණුම් පරිදි ස්ටිකර් 75000ක් මුද්‍රණය කරන්න දාලා තියෙනවා. මේ ස්ටිකරයේ ගහලා තියෙනවා මෙන්න මෙහෙම වගන්තියක්. එය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. මෙය මහා නගර සභාව සතු දේපළකි. අවසරය නොමැතිව ඉවත් කිරීම, විකෘති කිරීම දඩුවම් ලැබිය හැකි වරදකි. දැන් මේක ගිහිල්ලා ගහන්නේ දොරේ හරි උළුවහුවේ හරි. ගහපු ගමන් මේ දේපළ ඒ කියන්නේ ඒ දේපල ගැන කියලානේ මේක ගහන්නේ. ඒ දේපළ මේ මහා නගර සභාව සතු දේපළකි කියලානේ යන්නේ. ඉතින් ඕක ගිහිල්ලා අපේ නිලධාරියා දොරේ අලවන්න ගියාම හොඳ පොලු පාරක් තමා කලා එන්න වෙන්නේ. ඒ නිසා මේ වගේ ඒවා 75000ක් ගහන්න තිනේනේ. ඉතින් ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ නිලධාරීන් පව්. ඒ නිසා මේ ස්ටිකරේ මේ වචන හරඹය මේක අවශ්‍ය විදියට වෙනස් කරන්න කියන ඉල්ලීම කරනවා. මේවා ගහන්න දෙන්නේ නැහැ ගෙවල් වල ගිහිල්ලා.

ගරු නගරාධිපතිතුමනි, 16 ට මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මුහුදු වැලි ගැනීම සම්බන්ධයෙන්. මෙ පිළිබඳව කතා කරනකොට ඇතැම් මන්ත්‍රීවරු මුහුදු වැලි ටිපර් පිටින් පටවලා ගිහිල්ල යම් යම් තැන්වලට බාලා තියෙනවා. එහෙම බාන ගමන්, අපි මුහුදු වැලි ටික සල්ලි වලට ගන්නවා. මම දන්නේ නැහැ මොකටද ගත්තේ කියලා. සාමාන්‍යයෙන් ප්‍රාදේශිය ලේකම්ට කතා කළානම් මුහුදු වැලි ගන්න පුළුවන්. සල්ලි වලට ගත්තේ ඇයි කියන්න අපි දන්නේ නැහැ. අනෙක් එක තමයි නගරාධිපතිතුමා මම දිගින් දිගටම කියන කතාවක් 18(2) මේකේ 2020 වෙච්ච වරදක්. මේ 2020 වෙන වරද නිවරදි කරන්නේ 2026 දි තමා එවන්නේ. එතකොට අවුරුදු ගණනාවක් මොකද මේකට වුණේ? මේ පරක්කු වුණේ ඇයි? ඒකෙන් එක පැත්තකින් මිනිස්සු අපහසුතාවයට පත් වෙනවා. අනෙක් පැත්ත නගර සභාව හැටියට අපි අපහසුවට පත්වෙනවා. මොකද ලොකු ගානක් එකතු වෙනවා එතකොට. මේක මුලින් නිවැරදි කළානම් මේක නිවැරදි කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් තක්සේරු දෙපාර්තමේන්තුව දැන් මේ සැරේ තක්සේරු කරනවා මේ අවුරුද්දෙත් දාලා තියෙනවා තක්සේරු කරනවා කියලා. තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීමේදී වෙන අඩුපාඩු මාස ගානක් ඇතුලත ඒ අය හදනවා. මාස ගානක් ඇතුලත ඒ අඩුපාඩු හොය හොය නැවත වරක් නිවැරදි කිරීමකුත් කරනවා. නමුත් මටවත් අහුවෙන්නේ නැතුව අවුරුදු පහක් හයක් යනකම් මේක ආවෙයි කියන එකයි තියෙන ගැටලුව. මම හැමදාම කියනවා මේ 252 (3) න් කපා හරිනවා කියලා කියනවා. දැන් මේක ඔබතුමාගේ වරදක් විදියට අපි දකින්නේ නැහැ. නමුත් මෙය නිලධාරීන් කරන වරදක්. 252 (3) තියෙන්නේ වරිපනම් බදු කපා හරින්න පුලුවන් මෙන්න මෙහෙමයි. “අත්හැර දමනු ලබන මුදල නොසැලකිය යුතු තරම් වන බව හෝ අයකර ගත නොහැකි බව හෝ එම මුදල ගෙවීමට යටත් තැනැත්තාගේ දිලිඳු බව උඩ එම මුදල ලියා අත්හැරිය යුතු බව සභාවට පෙනී ගියහොත් යම් වරිපනම් බද්දක් හෝ බද්දෙන් යම් ප්‍රමාණයක් හෝ ඉන් යම් කොටසක් හා එම වරිපනම් බද්ද හෝ බද්ද අයකර

ගැනීමේ කාර්යය සඳහා දරන ලද යම් වියදමක් යෝජනා සම්මතයක් මගින් අත්හැර දැමීම මහ නගර සභාවක් විසින් කළ හැකිය කියලා" තියෙනවා. එතකොට මේක තමයි 252 (3) කියන්නේ. එතකොට මම අහන්නේ මේ එහෙම ඒවා නෙමෙයි. එතකොට මේගොල්ලන් ලේසියට වගන්තියක් කියලා දානවා 252 (3) වගන්තිය. අපේ මන්ත්‍රීවරු ටික අත උස්සනවා. මම අහන්නේ ඔඩිට් ඉන්ක්වයාර් එක ආවාම එන්නේ නිලධාරීන්ට නෙමෙයි මන්ත්‍රීවරුන්ට. මොකද මන්ත්‍රීවරු තමයි මේක අනුමත කරලා තියෙන්නේ අවසානයේ. මේ 252 (3) න් මේ බදු කපා හැරීම කරන්න බැහැ. ඒක තමයි අපි කියන්නේ. මේක වැරදියි. ඒ නිසා මේකට මොකක් හරි වෙන වගන්තියක් හොයාගන්න. මේ ඔයගොල්ලන් කරන වගන්තිය වැරදියි. ඊට පස්සේ මා ඔබතුමාගේ අවධානය යොමු කරනවා 14 වෙනි පිටුවට. ඒ පිටුව උඩින්ම තියෙන්නේ කාරණය කියලා තියෙනවා. 18(3), 18(5) තියෙනවා ඊට පස්සේ. 18(4) නැහැ. මෙහෙම වාර්තාවක් අපි දැක්කමයි. ලේකම්කමයි නියෝජ්‍ය කොමසාරිස්කමයි දෙකම කරනකොට මෙහෙම දේවල් වෙනවා. විනයානුකූල පියවර ගන්න ලියුම් ගහන්න නම් ලේකම්ට පුලුවන්. නමුත් තමන්ගේ වාර්තාව ඉදිරිපත් කරගන්න බැහැ. එතකොට 18(6) මෙහි ප්‍රශ්ණයක් තියෙනවා. ඒක එන්නේ ඔබතුමාට. මෙහි කියනවා, ගරු නගරාධිපතිතුමා මෙහි තියෙන්නේ 91999/- ක බදු මුදලක් කපා හැරීම. එතකොට ගරු නගරාධිපතිතුමා 2026.01.12 වන දින මේ සම්බන්ධයෙන් දුරකථනයෙන් විමසා ඇති අතර, කාගෙන්ද විමසුවේ? ඔබතුමා කාටද කතා කරලා තියෙන්නේ? දුරකථනයෙන් විමසා ඇති අතර, එහිදී මේ පිළිබඳව නැවත සාකච්ඡා කිරීමට මේක අය කරගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන්නද? මොකක් සාකච්ඡා කරන්නද? කියලා දන්නේ නැහැ. නැවත සාකච්ඡා කිරීමට සහ දඩ මුදල් කපා හැරීම සම්බන්ධයෙන් මුදල් කමිටුව වෙත නැවත ඉදිරිපත් කිරීමට යෝජනා විය කියලා දාලා තියෙනවා. එතකොට මෙහි කමිටු නිර්දේශයක් නැහැ. ඊට පස්සේ යටින් දාලා තියෙනවා බදු මුදල 91000යි. දඩ මුදල 14299යි ආදි වශයෙන් දාලා තියෙනවා. එතකොට මෙහි ප්‍රශ්ණය තියෙන්නේ නගරාධිපතිතුමා දුරකථනයෙන් කතා කළා කිවුවාම ගම්‍යමාන වෙන්නේ වෙන අදහසක්. එතකොට අපි අහන්නේ මොකක්ද මේ දුරකථනයෙන් කාත් එක්කද මේ සාකච්ඡා කරලා මේ දඩ මුදල කපා හරින්නේ. එහෙම දුරකථනයෙන් සාකච්ඡා කරලා කපා හරින්න පුළුවන්ද කියලා. එතකොට ඒක නීත්‍යානුකූල නැහැ. තව තියෙනවා මේ සම්පූර්ණයෙන්ම මේවා මේ සිටිනෙට් ආයතනයට ඇමරිකන් ඩොලර් 1300ක මුදලක් ගෙවන්න නිර්දේශ කරලා තියෙනවා. ලංකාවේ සල්ලිවලින් සාමාන්‍යයෙන් ගත්තොත් දළ වශයෙන් රුපියල් 390000ක්. සිටිනෙට් ආයතනයෙන් මොරටුව ජනතාවට කෙරෙන සේවාව සම්බන්ධයෙන් අපිට අවබෝධයක් නැහැ. ඉතින් ඒ නිසා ඒ සේවාව සම්බන්ධයෙන් අවබෝධයක් දෙන්න. අපේ 390000ක් වියදම් කරන්නේ මෙන්න මේ හේතුව නිසා. මෙන්න මේ මේ වරප්‍රසාද අපිට සිටිනෙට් ආයතනය තුලින් ලැබෙනවා කියලා ඉවරවෙලා ඔබතුමා කරුණාකරලා අපිට ඒ සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරන්න. 22 කරුණ නැහැ. ආපහු 22(1) නැහැ. 22 තියෙනවා 22(4) න් දෙකක් තියෙනවා. ඊට පස්සේ ඔබතුමාගේ අවධානය යොමු කරනවා 23 වෙනි පිටුවේ අංක 29ට. මේකේ තියෙනවා සැපයුම්කරුවන් දෙදෙනක් බඳවාගෙන හැබැයි සැපයුම්කරුවෝ මොන ක්ෂේත්‍රය සඳහා ද මේගොල්ලෝ බඳවා ගත්තේ කියන එක සම්බන්ධයෙන් නැහැ. ඒ සම්බන්ධයෙන් අපි දැනගන්න කැමතියි. ඊට පස්සේ 34 මේකේ තව ඔබතුමාට අපි මේ කියන දේ ඔබතුමා පිළිගන්නවා නම් ඔබතුමා පිළිගන්න නැත්නම් ඒක ප්‍රශ්නයක් නැහැ. ගරු නගරාධිපතිතුමනි, සාමාන්‍යයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුවුණාට පස්සේ ප්‍රසම්පාදනයේ සභාවේ අනුමත වෙනකල් මිල ගණන් කැඳවන්න නීත්‍යානුකූල නෛතිකභාවයක් නැහැ. නෛතික බලයක් නැහැ. හැබැයි මේ තියෙන වාර්තාව අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියත් එක්කම තමයි මිලදී ගැනීමට ඇණවුම් කිරීමේ ක්‍රියාවලියක් සිද්ධවෙලා තියෙන්නෙ. එතකොට ඒක විශාල වරදක් නීත්‍යානුකූල වශයෙන්. ඊට පස්සේ මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා 26 වැනි පිටුවේ 38 මේකේ තියෙනවා නගරාධිපතිතුමා මේ සමහර ඒවායින් ඉතින් මෙහි හිරකරලා තියෙන්නේ නගරාධිපතිවරයාව. ඒ නිසා පොඩ්ඩක් බලන්න ඒවා. නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ කර්මාන්ත අංශයෙහි සැපයුම් විෂය සඳහා 2026 වර්ෂය වෙනුවෙන් ලබාගත් රුපියල් 25000ක සුළු මුදල් වශයෙන් ලබා ගැනීමට සහ ආවරණ අනුමැතිය ලැබී අවසන් බැවින් මුදල් කමිටු නිර්දේශය හා මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුව වෙත ඉදිරිපත් කරමි. මොකක්ද මේ සභා ආවරණ අනුමැතිය ලැබී අවසන් බැවින් එහෙම දේවල් අපි මීට කලින් දැකලා නැහැ.

ගරු නගරාධිපතිතුමනි, අංක 40(4) ට ඔබතුමාගේ අවධානය යොමු කරනවා 27 පිටුවේ. ඇමුණුම් අංක 31 ට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මෙහි තියෙන්නේ දොන් කරෝලිස් ආයතනය ඉදිරිපිට වරිපනම් අංක 135 දරණ නිවස අසළ සිට බොල්ගොඩ ගඟ දක්වා වැසි ජලය බැස යන භූගත කානු පද්ධතිය සකස් කිරීම දෙවන අදියරය. රැස්වීම් දිනය මේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගැන මම මේ කියන්නේ ඇමුණුම 2025.12.24 ප්‍රසම්පාදන කමිටු නිර්දේශයේ තියෙනවා මෙම ව්‍යාපෘති සඳහා මිල සැහැදුම් ක්‍රමය යටතේ සභාවේ ලියාපදිංචි සියලු කොන්ත්‍රාත්කරුවන් වෙතින් ලියාපදිංචි තැපෑලෙන් මිල ගණන් කැඳවා ඇතත්, චතුරංග එන්ටප්‍රයිසස් ආයතනය විසින් පමණක් ලංසු ඉදිරිපත් කර ඇති අතර එම කොන්ත්‍රාත්කරු විමධ්‍යගත පළාත් සභා හා දිස්ත්‍රික් සංවර්ධන ප්‍රධාන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති බොහෝ ප්‍රමාණයක් ඉටු කිරීම සඳහා ගිවිසුම්ගත වී ඇති බැවින් මෙම ලංසුව අවලංගු කර ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය මගින් එවා ඇති ක්‍රියාකාරී ග්‍රාම සංවර්ධන සමිතියක් මගින් රුපියල් දොලොස්ලක්ෂ හත්දහස් තුන්සිය හැටපහයි ශත දොළහක සහා ඇස්තමේන්තු මුදලට මෙම ව්‍යාපෘතිය ඉටු කරගැනීමට නිර්දේශ කරන්නෙමු. ගරු නගරාධිපතිතුමා පළවෙනි වරද අපි අහනවා ඔබතුමාගෙන් මේ ආනන්ද කොන්ත්‍රාත්කරුවෝ සහ චතුරංග එන්ටර්ප්‍රයිස් කියන කොන්ත්‍රාත්කරුවන් දෙන්නගේ විශේෂයෙන්ම කොන්ත්‍රාත් ප්‍රධානයන් ඒ කියන්නේ මේ මිල ගණන් කැඳවලා ඔවුන් මිල ගණන් දැම්මට පස්සේ ඔවුන් අඩුම මිල ගණන් යටතේ නැත්නම් එකම මිල ගණන් යටතේ ඔවුන් ඉන්දැද්දි ඔවුන්ව අයින් කරනවා ඔවුන් අරගෙන තියෙන ප්‍රමාණය වැඩියි කියලා. නමුත් මේක දිහා බැලුවාම ඔබතුමා මේ ඉදිරිපත් කරලා තියෙන වාර්තාවේ තියෙන්නේ දැන් හිරු කන්ස්ට්‍රක්ෂන් ගත්තොත් එහෙම විශාල ප්‍රමාණයක් අරන් තියෙනවා. ජයන්ත එන්ටර්ප්‍රයිසස් ගත්තොත් විශාල ප්‍රමාණයක් අරන් තියෙනවා. ඒ වගේම සිසිර එන්ටර්ප්‍රයිසස් ගත්තොත් ඒකෙ විශාල ප්‍රමාණයක් මේකේ ව්‍යාපෘති අරන් තියෙනවා. දැන් මේ ආනන්ද කොන්ත්‍රාත්කරුවෝ සහ චතුරංග කොන්ත්‍රාත්කරුවන්ගේ බහුතර ව්‍යාපෘති සංඛ්‍යාවක් කපා හැරලා තියෙනවා. එතකොට ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඒ ක්‍රමවේදය හරියට අනුගමනය කරලා මේ මේගොල්ලෝ ගැන ප්‍රශ්න තියෙන්න පුළුවන් එහෙමනම් කරන්න ඔන සභාවට හරි යෝජනාවක් ගෙනෙල්ලා හරි බ්ලැක් ලිස්ට් කරන්න ඕන. එහෙම කළානම් ඒ අයට දෙන්න ඕන නැහැ. හැබැයි එහෙමත් නොකර ඒ කොනත්‍රාත්කරුවන් දෙදෙනා විතරක් මේ විදිහට ප්‍රතික්ෂේප කිරීම තුලින් ප්‍රසම්පාදන කමිටුව වරදක් කරලා තියෙනවා කියන එකයි අපේ හැඟීම. ඒක එකක්. අනෙක් එක මේ දොන් කරෝලිස් ආයතනය ඉදිරිපීට තියෙන පාර හදන්න අපි දන්නේ නැහැ ඔබතුමාද යැවුවේ කියලා. ඒ සම්බන්ධයෙන් අපිට අවබෝධයක් නැහැ. හැබැයි ඔබතුමාගේ අත්සනින් ලියුමක් යවලා තියෙනවා දොන් කරෝලිස් එකට දන්න විදිහටනම් රුපියල් ලක්ෂ හතරක් ඉල්ලලා. පෞද්ගලික එකවුන්ට් නම්බරයක් දාලා. මෙන්න මේ ගිණුමට රුපියල් ලක්ෂ හතරක් බැර කරන්න මේ ව්‍යාපෘතිය කරන්න කියලා ඔබතුමාගේම මන්ත්‍රීවරුයෙක් ගිහිල්ලා ලියුම භාර දිලා තියෙනවා. අදාළ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා. එතකොට දොන් කරෝලිස් ආයතනය ඒගොල්ලො දුන්න නොම්බරේට ඔබතුමාට කෝල් එකක් දීලා අහලා තියෙනවා මේක දෙන්නද කියලා ඊට පස්සේ කොහොම හරි මේකෙ විශ්වාසවන්තකම සම්බන්ධයෙන් මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා. සල්ලි දුන්නාද නැද්ද කියන එක පිලිබඳව අපිට පැහැදිලි අවබෝධයක් නැහැ. නමුත් සල්ලි ඉල්ලලා තියෙනවා. ඒ ලිඛිත ලිපිය අපි දැක්කා. එතකොට ඔබතුමා ඒ ලියුමක් ඔබතුමාද දන්නේ නැහැ ඒ ලියුම යැවුවේ. ඔබතුමා කියලා තියෙනවානේ ප්ලෑන් එකක්ටත් ඔබතුමාගේ අත්සන ගහලා තියෙනවා කියලා. ඒ නිසා අපි දැක්කේ නැහැනේ යවනවා. එනිසා හැබැයි නගරාධිපතිතුමා ලියුම දුන්නා කියලා දාලා දොන් කරෝලිස් එක ලක්ෂ 4ක් ඉල්ලලා ලියුම දීලා තියෙනවා. ඒ පිළිබඳව සාක්ෂි අපි සතුව තියෙනවා. ඔබතුමා පරීක්ෂණයක් කරන්න මේක විශාල චෝදනාවක්. මුදල් වංචාවක් සම්බන්ධයෙන් චෝදනාවක්. මොකද හේතුව මේ සභා මුදලින් තමයි මේක හදලා තියෙන්නේ. සභා අරමුදලින් හදන පාරකට කොහොමද ලක්ෂ හතරක් ඉල්ලන්නේ. මන්ත්‍රීවරයා ගිහිල්ල තමයි මේක ලියුම දීලා තියෙන්නේ. අපි ඔබතුමාගෙන් අහන්නේ කරුණාකරලා මේ සම්බන්ධයෙන් අපි ඔබතුමාට පැමිණිල්ලක් හැටියට කරන්නේ මේ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් පවත්වන්න. මොකද මේක නගර සභාව අපහසුතාවයට පත් කරන්නද? මේකේ වෙන කාවහරි අපහසුතාවයට පත් කරන්නද කියලා අපි දන්නේ නැහැ මෙහෙම දෙයක් වෙලා තියෙනවා කියලා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

ගරු නගරාධිපතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා 46(13)1 සහ 2 ලිපිගොනු අංක නැහැ. ඉතින් මේවායේ ලිපි ගොණු අංක නැතුව ඇයි මේක මේ සභා වාර්තාවට දැම්මේ. 46(14)ත් ලිපිගොනු අංක නැහැ. එතකොට 46(15) ඒකෙත් ලිපිගොනු අංක නැහැ. ඒකේ තියෙන්නේ ගාලු පාර දෙසින් ඇති ටෙරසේ ගැලරි ඇති දැල නැවත සවිකිරීම සඳහා යකඩ බට යොදා පුවරු සකස් කර ක්‍රීඩාංගනයේ ඇති අනෙකුත් ආරක්ෂිත දැල් කොටස් සකස් කිරීම කියලා තියෙනවා හැබැයි නගරාධිපතිතුමා මොන ක්‍රීඩාංගනයේද කියලා පැහැදිලිව නැහැ. ඇස්තමේන්තුව දාලා තියෙනවා දහසය ලක්ෂ විසිදාස් පන්සීයක් මොන ක්‍රීඩාංගනයද කියලා දාලා නැහැ. මේක ප්‍රින්ටින් මිස්ටේක් එකක්ද නැතිනම් ඇත්තටම දාල නැද්ද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. තව එකක් තියෙන 46(17) ඇමුණුම් අංක 70 උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත ඇමුණුමෙහි නාගරික ඉංජිනේරුගේ නිර්දේශයේ සඳහන් පරිදි පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් මාර්ගය කාපට් කරවා ගැනීමට නිර්දේශ කරන ලදි. ඔබතුමාගේ අවධානය යොමු කරනවා ඇමුණුම් අංක 70ට එහෙම නිර්දේශයක් නාගරික ඉංජිනේරු දීලා නැහැ. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙන් කරගන්න කියලා නිර්දේශයක් නාගරික ඉංජිනේරුට දීලා නැහැ. මේවා කියවන්න පරණවිතාන මහත්තයාව ගෙන්නන්න වෙනවා. දැන් මේකෙ තනතුරක් එහෙම නැහැ. මම හිතනවා නාගරික ඉංජිනේරු වෙන්න ඇති කියලා. නගරාධිපතිතුමා කියලා ඇඩ්‍රස් කරලා කාපට් යොදා ප්‍රතිසංස්කරණය කිරීමට සුදුසුනම් මිල ගණන් කැඳවා ඉටු කිරීම හැකි වුවත්, ඒ සඳහා කාලය ප්‍රමාණවත් නොවිය හැකිය. ඍජුව කොන්ත්‍රාත් ප්‍රධානය කිරීමට නැත්නම් සුදුසු ආයතනයක් වෙත කොන්ත්‍රාත් ප්‍රධානය කර ඉටුකරවා ගැනීම සුදුසුයි කියලා තියෙනවා. සුදුසු ආයතනය මොකක්ද කියලා සඳහන් කරලා නැහැ. හැබැයි මේකෙ තියෙන්නේ උක්ත කරුණු සලකා බැලූ කමිටුව ඉහත ඇමුණුමෙහි නාගරික ඉංජිනේරුගේ නිර්දේශයේ සඳහන් පරිදි පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය වෙතින් මාර්ගය කාපට් කරවා ගැනීමට නිර්දේශ කරන ලදී කියලා තියෙනවා. එතකොට ඉංජිනේරු දාලා නැති නිර්දේශයක් තමයි මේකට දාලා තියෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ඊට පස්සේ තව වැදගත්ම කරුණක් තියෙනවා පිටුව 42. කරුණ 56 මේ සභාවේ පසුගිය කාල සීමාව තුළ අපේ උගුර ලේ රහ වෙනකම් කෑගැහුවා කරුණු පෙන්නුවා. ඔජ්පු කළා කේඑන්කේ එන්ටප්‍රයිසස් පිළිබඳව. කේඑන්කේ එන්ටප්‍රයිසස් එක මේකේ හොරකම් කරලා තියෙනවා. සභාවට වංචා කරලා තියෙනවා. සභාවට බොරු කරලා තියෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කලා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ කරලා සෞඛ්‍ය අංශයේ හිටපු ඒඕ නෝනාව වැරදිකරු වුණා. ඒ මූලික පරීක්‍ෂණයකින් වැරදිකරුවෙලා ඒක හමස්පෙට්ටියේ දාගෙන ඉන්නවා කවුද නාගරික කොමසාරිස්වරිය. හැබැයි දැන් ආපහු කේඑන්කේ එන්ටප්‍රයිසස් වෙතින් රුපියල් 75000 ක බෑග් අරන් තියෙන මම හිතන්නේ බෑග් තමයි මේක කියවගෙන ගියොත් ගොඩක් තියෙනවා කියවන්න. දැන් අපි ඔබතුමාගෙන් අහන්නේ මේ හොරකම් කරලා සභාවට පාඩු කරලා ප්‍රසම්පාදන ක්‍රියාවලිය බොරු කරලා කරපු ආයතනයකින් එහෙම බඩු ගන්න පුලුවන්ද? මේක කොච්චර දුරට සාධාරණද? සදාචාර සම්පන්නද? ඉතින් මේවා කතා කරනකොට තමයි අමාරුයි. ඉතින් මේ කේඑන්කේ එන්ටප්‍රයිසස් ඇයි මේ තවත් කේඑන්කේ එන්ටප්‍රයිසස් එක හුරතල් කරන්නේ? අදාළ නිලධාරියා ඔබතුමාගේ ස්ටාෆ් එකේ ඉන්න නිසාද? එහෙම ප්‍රශ්ණයක් තියෙනවා අපිට. ඒනිසා කරුණාකරලා මේ සභාව මේ අනීතික දේවල් කරන්න එපා. මේ කේඑන්කේ එන්ටප්‍රයිසස් එක පැහැදිලිවම මේ බොරු කළා කියලා මේ දිදුල අයන් මෝර්ටස් කියලා ආයතනයක් මේ ප්‍රසම්පාදනයේ දාලා තියෙනවා. එහි දිදුල අයන් මෝර්ටස් අපි ඒ දවස් වල හොයනකොට හොයාගන්නවත් තිබුණේ නැහැ. හරියට ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කරලා තිබුණේ ඒ කාලේ. එතකොට එහෙම සභාවට වංචා කරපු ආයතනයකින් රුපියල් 15000කට ඉදිරිපත් කරලා ඒ කියන්නේ මේ බෑග් අරගෙන තියෙනවා කේඑන්කේ එන්ටප්‍රයිසස්. ඉතින් ඕව තමයි තියෙන ගැටළු නගරාධිපතිතුමා. මේ ආදාහනාගාරය සම්බන්ධයෙන් මම ඔබතුමාට කිව්වා ඉස්සෙල්ලා ඔබතුමා ඇස්තමේන්තු කරලා තියෙන්නේ රුපියල් තිස්දෙලක්ෂයයි. මේ තිස්දෙලක්ෂය තමයි ලොකු වෙලා තියෙන්නේ මේ මිනිසුන්ට කරන සේවයට වඩා. මේ කියපු කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටුවේ අංක 11 අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධව නිර්දේශයක් තියෙනවා. ඒ නිර්දේශයට අමතරව මම යෝජනා කරනවා මේ ඇමුණුම් අංක 06 ගැන අවධානය යොමු කරන්න කියලා නැත්නම් අපිට ලොකු කරදරයකට මුහුණ දෙන්න සිද්ධ වෙයි. එතකොට අංක 08 තක්සේරු ප්‍රතිශෝධනය සම්බන්ධව. අපිට තක්සේරු දෙපාර්තමේන්තුවට තක්සේරු ප්‍රතිශෝධන සම්පූර්ණ වටිනාකමින් 1% ක් අපි ගෙවිය යුතුයි තක්සේරු දෙපාර්තමේන්තුවට එම මුදලින් අපි 20% ක් අත්තිකාරමක් වශයෙන් ගෙවිය යුතු බවට ඒගොල්ලන් ඉල්ලීමක් කරලා තියෙනවා. ගරු නගරාධිපතිතුමනි, අපි දන්නවා ප්‍රතිශෝධන ක්‍රියාවලියේදී සෑහෙන්න වැරදි සිද්ධවෙලා තියෙනවා. ඒ නිසා මේ වැරදි ඒගොල්ලෝ පිළිගන්නවද නැද්ද කියන එක අපි දන්නෙ නැහැ. ඒගොල්ලන්ගේ වැරැද්ද නිසා අපි අපේ ආදායම අඩු කරගන්නවා. ඒනිසා අපි මේ සම්බන්ධයෙන් ඒගොල්ලන්ව ලිඛිතව දැනුවත් කළ යුතු බවට මම යෝජනා කරනවා සිටිනවා. වසර අවසානයේ අයවැය වාර්තාව හදනකොට වරිපනම් ආදායම තමයි අපේ ප්‍රධාන ආදායම එක කොටසක්. එතකොට අපි වරිපනම් ප්‍රතිශෝධනය මත අධි තක්සේරුවක් ඇස්තමේන්තු කරනවා. ඊට පස්සේ කරන්නේ හැම මාසෙම ගානක් හැම පැත්තෙන්ම අඩු කරගෙන යනවා වරිපනම් කපා හැරීම සම්බන්ධව. එතකොට ඒ අවස්ථාවේදි අපේ ආඥා පනතේ අංක 252(3) වගන්තිය බොහෝ අවස්ථාවල අවභාවිතා කරනවා අපි දැකලා තියෙනවා. ඒවා අවම කිරීම සඳහා මේ සැරේ ප්‍රතිශෝධනය කරන කොට එගොල්ලන්ට මේක දැනුවත් කර සිටිය යුතුයි සම්පූර්ණ වටිනාකමින් 1% ක අපි ඒගොල්ලන්ට ගෙවන නිසා. එගොල්ලන්ගේ වැරදි ඒගොල්ලන්ට යන්නේ නැහැ. ඒ වැරදි ටික එන්නේ අපට. ඒ නිසා මේ සම්බන්ධව අපි ලොකු අවධානයක් යොමු කරලා මේගොල්ලන්ට ලිඛිතව දැනුම්දිය යුතු බවට මම යෝජනා කර සිටිනවා. අංක 26 ජනවාරි මාසෙට සැලසුම් කමිටුවේ මාසික ප්‍රගති වාර්තාවක් ගැන සඳහන් කරනවා. ජනවාරි මාසයට අපි කමිටු වාර ගාණ හයක් තියෙනවා. ලිපිගොනු 164 ක් ඉදිරිපත් කරලා තියෙනවා, අනුමත කරලා තියෙනවා 101 ක්. අපි ජනවාරි මාසයට අපි ලිපිගොනු 62 ක් රිජෙක්ට් කරලා තියෙනවා. 62ක් කියන්නේ අපේ ජනතාව රස්තියාදු කරන වැඩක්. ඒනිසා අපේ මූලික අඩිතාලම වෙන්න ඕනෙ රිජෙක්ට් නොවී, අපි මේ ෆයිල් එක බාර ගන්නකොටම එතන නිවැරදිතාවය බලලා ෆයිල් එක බාරගන්න එක තමයි යුතුකම. ඒනිසා අපිට බොහෝ දුරට මේක අවම කරගන්න පුලුවන්. ඒවගේම තමයි එහිම සඳහන් කරනවා 2025 ට කමිටු වාර ගාණ 77යි, ලිපිගොනු සංඛ්‍යාව 1719, අනුමත කළ සංඛ්‍යාව 901යි. ෆයිල් ගණන 818යි. එතකොට අපි 818 දෙනෙක් හෝ අපි මේ ෆයිල් ටික නැවත නැවත ඉදිරිපත් කරලා තියෙනවා. මම දන්නවා පුද්ගලිකව මට අත්විඳින්න සිද්ධවෙච්ච දෙයක්, ෆයිල් එක භාරදීලා රිජෙක්ට් කියලා තියෙන ෆයිල් එක කස්ටර්ම එක්ක ගිහිල්ලා ඇහුවම ඇයි රිජෙක්ට් වුනේ කියලා කියන්න කෙනෙක් නැහැ, අපි මේ ෆයිල් එක හොයාගෙන යන්න ඕනා ඇයි මේ ෆයිල් එක රිජෙක්ට් වෙලා තියෙන්නේ කියලා. ඊට පස්සේ කරුණ හොයා ගත්තම කස්ටර්මට කිව්වා නඩු වාර්තාවක් ගේන්න සහ නිතීඥතුමාගෙන් දිවුරුම් පෙත්සමක් ගේන්න කියලා. ඒක ගෙනෙල්ලා දුන්නට පස්සේ දවස් දෙකකින් කමිටුවට වාර්තා කරනවා කිව්වා. දවස් දෙකෙන් ඇහුවම කිවුවා කමිටුවට දාන්න බැරිවුනා මොකද නඩු වාර්තාවේ ඔරිජිනල් එක දැක්කයි කියලා සීල් එකක් ගහලා තමයි නිතීඥ නිලධාරිතුමියට යවන්න ඕනේ කියලා. කොච්චර රස්තියාදුවක් ද, ඒ මනුෂ්‍යා ඒ ඩොකියුමන්ට් එක අරගෙන එනකොටම කියන්න තිබුනා ඔරිජිනල් එක බලන්න ඕන. එතකොට ඒ වෙලාවේ ඔරිජිනල් එක බලන්නේ නැතිව ඩුප්ලිකේට් එක ගන්නවා දවස් දෙකකින් පස්සේ කියනවා ඔරිජනල් එක ගේන්න කියලා. ඒවගේ දේවල් අපි වහාම නවත්වන්න ඕනා. මම හිතනවා කොමසාරිස්තුමියටත් ලොකු වගකීමක් තියෙනවා මේ සම්බන්ධව සොයලා බලන්න. ස්ටාෆ් ඇඩ්මිනිස්ට්‍රේෂන් එක වෙරි ඉම්පෝටන්ට්. 818 ෆයිල් රිජෙක් වෙනවා කියන්නේ කාර්යක්ෂමතාවයෙන් ඇත්තටම අපි පල්ලෙහාටම ඇවිල්ලා. අපිට මේ පේන්නැති ප්‍රපාතයක් මේක. කාටවත් පේන්නැද්ද මන්දා. ඇයි අපි මෙච්චර රිජෙක්ට් කරලා තියෙන්නේ කියලා. මේ රිජෙක්ට් වන ෆයිල් නැවත ඉදිරිපත් කරනවනේ කමිටුවට. කමිටු සිටින්ස් වලට අපි නැවත නැවත ගෙවීම් කරනවනේ. කවුරුත් වගකීම ගන්නේ නැද්ද මේකට. මේ රිජෙක්ට් වන ෆයිල් අවම වෙන්ඩ ඕනේ. දැන් ජනවාරි මාසෙට අපි ෆයිල් 62 රිජෙක්ට් කරලා තියෙනවා. මේ ෆයිල් නැවත ෆෙබ්රුවරි වලටත් එනවා. නැවත සමහර විට මාර්තු වලටත් එන්න පුළුවන්. ඒනිසා අපි මේක සම්පූර්ණයෙන් වෙනස් කළ යුතු ස්ථානයක්. මම හිතනවා ඔබතුමා මේ සම්බන්ධව අවධානය යොමු කරයි කියලා.ඒවගේම තමයි අංක 12 මාසික

ඉන්ධන සම්බන්ධව.අපි ඒක අනිවාර්යෙන්ම අනුමත කළ යුතු වැය ශීර්ෂයක්. නමුත් ඒකේ තියෙනවා ගැස් සිලින්ඩර් සම්බන්ධව මම ගිය සභා වාරෙදිත් කථා කළා මේ සම්බන්ධව කවුරු හෝ අවධානය යොමු කළාද කියන එක පේන්න නැහැ. අපිත් දන්නේ නැහැ මේක කොහොමද වෙන්නේ කියන එක. මම ඊට කලින් සභාවේ වාර්තාවත් ඉදිරිපත් කළා මගේ ලේඛන නෙමෙයි මගේ දත්ත නෙමෙයි සභා වාර්තාවේ තියෙන දත්ත තමයි මම සභාවට ඉදිරිපත් කළේ. නමුත් කවුරුත් මේ ගැන අවධානය යොමු කරලා නැහැ. නැවත මම ඒක අවධානයට යොමු කරනවා සභාවට. දැන් ඔක්තෝම්බර් මාසයේ ගැස් සිලින්ඩර් 27ක් නිකුත් කරනවා මරණ සංඛ්‍යාව 49යි, නොවැම්බර් මාසයේ ගැස් සිලින්ඩර් නිකුත් කරනවා 22 ක් මරණ සංඛ්‍යාව 20යි. දෙසැම්බර් මාසයේ අපි ගැස් සිලින්ඩර් 10ක් නිකුත් කරනවා මරණ සංඛ්‍යාව 44යි, ජනවාරි මාසයේ අපි ගැස් සිලින්ඩර් 34ක් නිකුත් කරනවා මරණ සංඛ්‍යාව 41යි. මේ වාර්තාවල ලොකු පරස්පරයක් තියෙනවා. අපි දන්නෙ නැහැ ඇත්තටම එක බොඩි එකක් අපිට ආදාහනය කරන්න කොච්චරක් ගැස් අවශ්‍ය වෙනවද කියලා. කාගෙන් හරි ටෙක්නිකල් ඉෂු එකක් තියෙනවා නම් ඒක අහලා ඉදිරිපත් කරන්න. නැත්තම් අපිට වැරදි අවබෝධයක් තියෙන්නේ. ඇත්තටම ලොකු පරස්පරයක් තියෙනවා මෙතන. දෙසැම්බර් මාසේ මරණ සංඛ්‍යාව 44යි ගැස් සිලින්ඩර් 10යි. නොවැම්බර් මාසේ මරණ සංඛ්‍යාව 20යි ගැස් සිලින්ඩර් 22යි. මේකට වගකිව යුතු කවුරුහරි කෙනෙක් ඉන්නවද ඩිරෙක්ට්ලි. දෙසැම්බර් මාසයේ මරණ සංඛ්‍යාව 44යි ගැස් සිලින්ඩර් 10යි. ජනවාරි මාසයේ මරණ 41යි ගැස් සිලින්ඩර් 34යි. එතකොට නොවැම්බර් මාසයේ ඔක්තෝම්බර් මාසයේ ආපස්සට ගියානම් හොයාගන්න පුලුවන් මේකේ තියෙන පරස්පරය. සභාවේ වාර්තාවල තියෙන ඒවා තමයි මම මේ ගත්තේ. අනිත් එක 12.5 එක නෙමෙයි මේක 34. ගිය සභා වාරෙත් මම මේක කතා කළා මේ ගැන අවධානය කවුරුත් යොමු කරන්නේ නැහැ. සෑහෙන්න ලොකු මුදල් ප්‍රමාණයක් අපි වියදම් කරනවා. අපේ චීෆ් අකවුන්ටනුත් මේ ගැන අවධානය යොමු කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ලබන මාසෙට අපිට මේකේ තියෙන පරස්පයට ටෙක්නිකල් රිපෝර්ට් එකක් හරි දෙන්න. අපි දන්නේ නැහැ ආදාහනය කරන්න කොච්චරක් ගැස් යනවද කියන එක. ඒ නිසා අපි වැරදි අවබෝධයක් තියාගන්න හොඳ නැහැ. ටෙක්නිකල් රිපෝට් එක අනුව අපිට බලන්න පුළුවන් එක මරණයක් ආදාහනය කරන්න ගැස් ලීටර් කොච්චරක් අවශ්‍ය වෙනවද කියලා. මට තේරෙන්නේ නැහැ ඕගොල්ලන්ගේ පැත්තේ කවුරුත් හොයන්නෙත් නෑ බලන්නෙත් නෑ කතා කරන්නෙත් නැහැ. අපි සියලු දෙනාම වගකියන්න ඕන. මේක යූ.එන්.පී. ද , ශ්‍රී ලංකා ද, ජේ.වී.පී. ද කියලා නැහැ. එළියට ගියාම ඔක්කොම නාගරික මන්ත්‍රීවරු. හැමෝම එකටම බැනුම් අහනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න ගරු නගරාධිපතිතුමා. අනිත් එක ප්‍රසම්පාදන නැති වියදම් ටිකක් මේකේ සඳහන් කරලා තියෙනවා. මං පොඩි අඩුපාඩු ටිකක් කියන්නම් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න ඒවා ප්‍රමුඛතාවේ දිය යුතු වියදම් ඒ නිසා ඒ වියදම් ටික කොයි වැය ශීර්ෂයෙන් ද අපි වියදම් කරන්නේ කියලා අපිව දැනුවත් කරන්න. ඒ වගේම තමයි කමිටු වාර්තා වලින් ඉතාම වැදගත් වාර්තාව තමයි මුදල් කමිටුව. ඒ නිසා මේ වාර්තාවට එවන හැම ඇමුණුමකටම ඒ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ අත්සන අනිවාර්ය වෙනවා. මේකෙත් තියෙනවා දෙපාර්තමේන්තු ප්‍රධානි අමතක වෙච්ච කොටස්. ඒ නිසා ඒවා ගැන අනිවාර්යෙන් අවධානය යොමු කරන්න. අනිත් එක අපි ලේකම් ඩිපාර්ට්මන්ට් එකට හොඳ ෆොටෝ කොපි මැෂින් එකක් ලබාදිය යුතුයි. මොකද ඒගොල්ලන්ට බ්ලේම් කරලත් වැඩක් නැහැ, ප්‍රසම්පාදන ඇමුණුම් ටික අපිට කියව ගන්න බැහැ කලු පාටයි ඒ වගේම තමයි මේකේ බයින්ඩ් කරන කට්ටියට කියන්න ඕනේ මේ ෆොටෝ කොපි ටික බයින්ඩ් කරනකොට වැය ශීර්ෂය එක දිගට බලන්න පුළුවන් ක්‍රමයට තියන්න ඕනේ කියලා. එකක් අර පැත්තේ එකක් මේ පැත්තේ, කොළ එකක් දෙකක් නෙමෙයිනේ. අපේ මුදල් කමිටු වාර්තාව තමයි වැඩිපුරම තියෙන වාර්තාව මම හිතන්නේ ඉතින් ඒක අතේ තියාගෙන කියවන්න අමාරුයි. අපි ඒ කමිටු වාර්තා ටික ඇමුණුම් ටික බැලුවනම් අපිට පහසුයි මේක කියවන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, උත්තර දෙක තුනක් දීලා මුදල් කමිටුව අවසාන කරන්නම්. මතු වෙච්ච කාරණා අතර තියෙනවා වැදගත් කාරණාවක්, මුදල් වාර්තා සකස් කරද්දි ඒ වැදගත්කම ගැන සැලකිලිමත් වන ලෙස ලේකම්තුමාට උපදෙස් ලබා දෙනවා. ඒ නිසා ඉතාම වගකීමෙන් සැලකිලිමත් වෙන්න ඕන ලේකම් අංශය. මේක පරිපාලනය පැත්තේ තිබෙන දුබලතාවයක්. මේක මේ ගණන් හිලව් වල තියෙන මොකක්වත් වෙනස්කම් නෙමෙයි. ඔබට එවපු එක සුජිත් මන්ත්‍රීතුමා පිලිගන්න බැහැ

කිව්වා. ඒක හරි කමක් නැහැ. මේ වාර්තාව අකුරෙන් අකුර ඉස්පිල්ලෙන් ඇලපිල්ලෙන් ඇලපිල්ල මේවා බලන්න ඕන ඒවා හරියට. අවාසනාව කියන්නේ අත්සන් කළාට පස්සේ වෙච්ච එකක්. මේවා ගහද්දි වෙච්ච වරදක්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මම මේ ගොඩක් ඒවට කතා කළේ නැත්තේ, ගොඩක් දේවල් ගැන කථා කරලා තේරුමක් නැති නිසා. නමුත් මේ කාරණාව බරපතල කාරණාවක්. ඔබතුමා නගරාධිපති, මුදල් කමිටුවේ නිල බලයෙන් සභාපති, නිල බලයෙන් සභාපති වුණ නගරාධිපතිවරයා අත්සන් කළාට පස්සේ මුදල් කමිටුව වෙනස් වෙනවා කියන්නේ නගරාධිපතිතුමා ඒක සරල නැහැ. මම මේ නගර සභාවේ අවුරුදු 22ක් හිටියා මේ නගර සභාවේ නගරාධිපතිවරයෙක්ගේ අතින් ඔය විදිහේ කතාවක් කියවෙච්ච පළවෙනි වතාව.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මේ මුදල් මේ පැත්තේ මොකක්වත් ලොකු වෙනස්කම් නෙවෙයි කරුණු වල අනුපිළිවෙලේ යම් යම් වෙනස්කම් වෙලා තියෙනවා. එකම අයිතමය තැන් තැන් වල තියෙනවා. ඒ නිසා ඒ අදාළ ආයතන ප්‍රධානීන් මම කියන්නේ මේවා නිකන් සුළුවෙන් තකන්න එපා. අත්සන් කළායින් පසු වෙනස් කරපු ලේඛනයකුත් මගේ අවධානයේ තියෙනවා. මේවා දීර්ඝ කාලයක් මෙහෙම යන්න ඇති. ඉතාම සංකීර්ණ කාරණාවක් මේ පිළිබඳව ඉතා ඉක්මනින් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සමාවෙන්න ඔය වගේ තත්ත්වයක් නම් මේ අභ්‍යන්තර පරීක්ෂණයක් කරලා හරියන්නේ නැහැ ඕක ඔබතුමා ගිහිල්ලා සී.අයි.ඩී එකේ පැමිල්ලක් දාලා පරීක්ෂණයක් කරන්න ඕන.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, දැන් මම ඉතාම හොඳින් ඉවසුවා. දැන් ගන්නකෝ ඔබ කරපු චෝදනාව මම ලියුමක් යැවුවා කියලා අත්සන් කරලා දොන් කරෝලිස් එකට. මම එහෙම කලබල වුනොත්, ඒ කියන්නේ ඉතාමත් වගකීම් විරහිත ප්‍රකාශ. ඒවට මම කාලය අරගෙන ලොකුවට පැහැදිලි කිරීම කරන්න යන්නෙ නැහැ. සමහර ඒවා අවලාද, මඩ, අපහාස දේශපාලන වශයෙන් කරන ඒවා. ඒවා හොඳින් තේරුම් ගන්න. ඒවත් එක්ක හැප්පි හැප්පි ඉන්න ගියොතින් ගමන යන්න වෙන්නේ නැහැ. කාටහරි සැකයක් තියනවානම්, අවිශ්වාසයක් තියෙනවානම් මම අත්සන් කරලා දොන් කරෝලිස් එකට ලියුමක් යවලා කියලා, හෙට ගිහිල්ලා පොලිසියේ පැමිණිල්ලක් දාන්න.ඒකට පරීක්ෂණයක් ඉල්ලන්න. මගේ ආයතනය තුළ මගේ අත්සන ගැහුවට පස්සේ වෙලා තියෙන එක ඒක මම බලාගන්නම්. එවැනි දැන් ලේඛන කිහිපයක් මගේ අතේ තියෙනවා. මම උත්සහ කරන්නේ මන්ත්‍රීවරුනි, මේ දීර්ඝ කාලයක් මේ ආයතනයේ සිද්ධ වෙච්ච දේ මේ වෙන්නේ. හැබැයි දැන්වත් ඒවා නවතින්න ඕනා. ඉතින් ඒවා නවතින්න නම් මුළු මහත් සභාවම එකට උදව් කරන්න ඕනා. අරවැනි ප්‍රකාශයක් එනකොට, එතන දීර්ඝ කාලයක් තිබ්ච්ච ප්‍රශ්ණයක් තිබුණා ජලය බස්ස ගන්න බැරි, මුළු ප්‍රදේශයක් පාසල් දරුවෝ ප්‍රමාණයක් සැහෙන්න ප්‍රශ්ණයකට මුහුණ දුන්නා. ඒ ප්‍රශ්ණේ විසඳන්න ඒගොල්ලෝ උදව් කරන්නම් කිව්වා. එතකොට මේ පැත්තෙන් මුදල් ප්‍රතිපාදනයක් වෙන්කරලා ඒගොල්ලෝ උදව් කරනවානම් කැමතියි. මම වචනයක්වත් කතා කළේ නැහැ. ඒ පැත්තේ අපේ සමිතියක් කරපු සාකච්ඡාවක්. මම කියන්නේ ඒ සාකච්ඡාව කිසිලෙසක ලියුම් දීලා මුදල් අරගත්තු එකක් නොවෙයි. ගැටලුවක් විසඳගැනීම සඳහා දරණ උත්සහයක වෙච්ච එකක්. ඒක විකෘති වෙනවා මගේ අත්සනින් ලියුම් ගියා කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපිට පැහැදිලිව දැන ගන්න කැමති තමුන්නාන්සේ මීට කලිනුත් සඳහන් කළා, තමුන්නාන්සේගේ අත්සන් යොදලා යම් යම් වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක වෙලා තියෙනවා කියලා. හොර වැඩ වෙලා තියෙනවා කියලා. අපි දැනගන්න කැමති තමුන්නාන්සේ ඒවා හංගන් ඉන්න නෙමෙයි අවශ්‍ය වෙන්නේ. අපිටත් අවශ්‍ය දැනගන්න කවුරු කළත් ඒ වැරැද්ද වෙලා. අපි අනුමත කරන්නේ නැහැ. අපි එතන කෙලින් හිට ගන්නවා. ඒ නිසා තමුන්නාන්සේ කියන්නේ ඒ වගේ වැඩවලට පහුගිය කාලේ වුණානම් ඒවා නවත්වන එක තමුන්නාන්සේගේ වගකීමක්. දැනගෙන නොකියා ඉන්නා එක ලොකු

ප්‍රශ්ණයක්. ඒනිසා ඒවා එළි කරන්න අපිත් කැමතියි දැනගන්න මොකද හේතුව මොන පක්ෂයේ හිටියත් ඒවට අවස්ථාවල් දෙන්න යන්න එපා.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මේ සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගණනාවක් තියෙනවා. ඔබට ඉතා වගකීමෙන් කියනවා. සමහර අපේ රටේ නීතිය හැසිරෙන විදිහ. ඒ කියන්නේ සමහර කටයුතු කරන්න ගිහිල්ලා මේ අපරාධකරුවන්ට ඒවා හරියටම පොයින්ට් කරලා අල්ල ගන්න බැරි වුනොත් එතකොට ඒක වරදක් ලෙස තහවුරු කරගන්න බැරි වුනොත් මොකද ඒ සියයට සීයකින් ඒ විශ්වාසය එන්න ඕන. වරද දැන් පැහැදිලියි. හැබැයි මේවා කරන මිනිස්සු හොයාගෙන යන්න ඉතාම හොඳ පරීක්ෂණයක් ආරක්ෂක අංශ පැත්තට දෙන්න ඕන මට ඒ විශ්වාසය තියෙන්න ඕන.

මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා

ගරු නගරාධිපතිතුමනි, දැන් ප්‍රශ්ණයක් මතු වෙනවා මෙන්න මෙහෙම. අපිත් කමිටු වාර්තා කිහිපයක් සම්මත කළා. මුදල් කමිටුව, මේක සම්මත කරනවද නැද්ද කියන එක, දැන් ඔබතුමාම කියනවනම් ඔබතුමාගේ අත්සන යොදලා වාර්තා වෙනස් වුනා, ඒ කමිටු වාර්තාවල තියෙන එකක් විශ්වසනීය ප්‍රශ්නේ, අපි දැන් මේකට විරුද්ධයි කියමුකෝ අපි කියන ඒක අදාල නැහැ. දැන් මෙතුමන්ලා පක්ෂ වෙන්නේ ඒ අවිශ්වාස වෙච්ච වාර්තාවකට.

මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු මහත්මිය

ගරු නගරාධිපතිතුමනි, දැන් ඔබතුමා කිව්වා ඔබතුමාගේ අත්සනෙන් පස්සේ ලේඛනය වෙනස් වුනා කියලා. ලේකම් අංශයනේ අපිට එන අවසාන ලේඛනයේ වගකිවයුත්තා. මේ අවස්ථාවේ මම දෙයක් ඔබතුමන්ලගේ පරිපාලනය තුළ අවසානයේ වගකීම ගන්නේ ඔබතුමා ද, ලේකම්තුමා ද එහෙනම් ඔබතුමා මේ කරපු චෝදනාව සම්බන්ධයෙන් ලේකම්තුමාගෙන් පැහැදිලි කිරීමක්.

ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි ලේකම්තුමාගෙන් පැහැදිලි කිරීමක් දෙන්නම්. මගේ කණ්ඩායමට වගකීමක් තියෙනවානේ. මේ නිශ්චිත මොහොත වනවිට සැලසුම් දෙකක් ගියා අත්සන් වලින් දැනට හම්බවෙලා තියෙන, ඒ වෙනම පරීක්ෂණයක් ඇතුළේ තහවුරු කරන්න. ඊළඟට මේ ලේඛන වෙච්ච එක. ඒක හොඳින් හොයලා බලපුවම මූල්‍ය පිළිබඳව මොකක්වත් ඇතිවෙච්ච වංචාවක් නොවෙයි මේ ප්‍රින්ට් කරද්දි සිද්ධ කරගත්ත වරදක්. ඒක මම ලොකු එකක් ලෙස සලකන්නේ නැහැ නමුත් මුදල් කමිටුව ලෙස, මම කිව්වේ ඉතා වගවීමෙක් කටයුතු නොකිරීමේ චෝදනාව තියෙනවා. ඒනිසා ඒක සම්මත නොකර ඉන්න තරම් හේතුවක් එතන නැහැ. හැබැයි වෙන දෙපාර්තමේන්තුවක කරපු වරදක් තමයි මගේ අත්සන ගැහුවට පස්සේ ඒගොල්ලෝ ඒ ගේන භාණ්ඩය වෙනස් කළා.ඒ නිසා මම කියන්නේ ඔවැනි දේවල් සිද්ධ වෙනවා ආයතනයක් ඇතුළෙ ඒවා වෙන එක වළක්වගන්න ක්‍රියාමාර්ග අවශ්‍යයි.

මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා

ගරු නගරාධිපතිතුමා, ඔබතුමත් එක්ක තර්ක කරනවා නෙමෙයි. දැන් ඔබතුමා ගිය සභාවෙදි හෝ ඊට ඉස්සෙල්ලා සභාවෙදි ප්‍රකාශයක් කළා, එක ප්ලෑන් එකකට ඔබතුමාගේ අත්සන ගහලා තියෙනවා කියලා. දැන් ඔබතුමා කියනවා ප්ලෑන් දෙහෙකට ගහලා තියෙනවා කියලා. ඊටපස්සේ ඊළග සභාවේදි ඔබතුමා කියයි ප්ලෑන් තුනකට ගහලා තියෙනවා කියලා. ඒ නිසා අපිත් මේකේ සභිකයෝ. එතකොට දැන් ඔබතුමාගේ එන චෝදනා අපි මේ 51යි, නෑ එතුමා නැතුව 51යි. එතකොට මේ 51ටම විහිදෙනවා. එතකොට අපි බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයකට යන්න ගරු නගරාධිපතිතුමා. එතකොට කවුද මේක කළේ කියලා, සමහර වෙලාවට මේක අදිසි හස්තයෙන් ක්‍රියාත්මක වෙන දෙයක් වෙනන් පුලුවන්. ඒ නිසා තුන්වෙනි එකට යන්න ඉස්සරවෙලා  මේකට වහාම ඇක්ෂන් එකක් ගන්න ඕන. නැත්තම් 03 වෙනි එකත් කියලා ඔබතුමාට කියන්න වෙයි මගේ අත්සන ගහලා තුනක් අහුවුනා කියලා. ඔබතුමාගේ කාල සීමාව ඉවර වෙනකොට තව බරගානක් අහුවෙයි. දැන්ම ම පළවෙනි එකෙන්ම කඩා ගන්න කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, මේ බොහෝ ඒවා පිළිබඳ මම කියන්නේ මොරටුව මහා නගර සභාව දවසට දෙකට තුනක හතරක සතියක මාසෙක අවුරුද්දක නෙමෙයි හොරාට ගහපු අත්සන් පිළිබඳව හොර හොර සීල් ළඟ තියාගෙන ගහපු ප්ලෑන් පිළිබඳව මේ රටේ නීතිය ඉදිරියේ බොහෝ ඒවා තියෙනවා. මේ විශාල කාලයක් මේවා පැවතුනා පවත්වගෙන ගියා. ඕනතරම් මිනිසුන්ගේ සැලසුම් අනුමත කළා මේ උණ පඳුර යට. කොමසාරිස්ලා ගොඩක් හිටියා. මේ සභාවේ හිටියානම් මන්ත්‍රිවරු ගොඩක් දන්නවා. මම අනන්ත අප්‍රමාණ කියලා තියෙනවා. ඒනිසා දැන් මෙය නවත්තන්න නම් කලබල වෙලා නවත්තන්න බැහැ. කලබලවීමෙන් නවත්තන්න බැහැ. දැන් ඒ අදාළ කටයුත්ත කරන්න තියෙන ඉඩ අහුරන එක තමයි පළමු වෙනි එක. ආයේ මේක නොවෙන්න තියෙන අවස්ථාව නැති කරන්න ඕන. මේ අවස්ථාව ගන්නේ දීර්ඝ කාලයක් මේ ස්ථානවල අරක්ගෙන ඉන්න කිහිපදෙනෙක්. ඔවුන් දීර්ඝ කාලයක් ස්ථානවල අරක්ගෙන ඉන්නවා. එනිසා ඒ අවස්ථාව නැති කිරීම, ඒ ගමන් අර පරීක්ෂණයට අදාළ කරන කටයුතු සිද්ධ කිරීම. සමහර ඒවා සමත් වෙයි, සමහර ඒවා අසමත් වෙයි. මම ඉතා විවෘතව ඔබට කියන්නේ, මීට පෙර යම් යම් දේශපාලනයක් පිටුපස්සේ නැහැ, හස්තයන් ඇතුළේ මේවට පිටුබලය ලැබුණත් මේ නිශ්චිත මොහොතේ කිසිදු දේශපාලන බලයක් මේවා පිටිපස්සේ නැහැ වගකීමෙන් කියනවා. එහෙම නැහැ. මේ මුදල් කීයක් හරි හොයා ගැනීම අරමුණු කරගෙන තමයි මේ කටයුතු සිද්ධ වෙන්නේ. ඒනිසා සභාවක් ලෙස සටන් වදිමු. ඔබ කියන දේ කරනවා පරීක්ෂණ කටයුතු ඉල්ලනවා, පරීක්ෂණ වලින් හෙළිදරව් කරගන්න උපරිම උත්සහ දරනවා. ඒ ගමන් මේවා වෙන්න තියෙන ඉඩ වළක්වනවා. මට පෞද්ගලිකවත් දේශපාලනිකවත් විශාල චෝදනා ප්‍රමාණයක් කරලා තියෙන්නේ එක වරදක් කරලා නෙවෙයි. හැබැයි ඒවා හොඳට දරාගෙන හොඳට ඉවසලා මට අරමුණක් තියෙනවා ඒ අරමුණ වෙනුවෙන් මම මගේ කණ්ඩායමත් එක්ක ගමනක් යනවා. ඒනිසා විපක්ෂය විදිහට මම ඔබෙන් බලාපොරොත්තු වෙනවා. ඒ කියන්නේ මොරටුවේ මහජන නියෝජිතයා, මං මේ යූ.එන්.පී, ශ්‍රී ලංකා, පොහොට්ටුද කියල නෙවෙයිනේ හැමතිස්සෙම ආරම්භ කළේ. හැබැයි ඒ බෙදීම පවත්වාගෙන යන්න අවශ්‍ය කරන තත්ත්වයන් නිර්මාණය කරද්දී තල්ලු කරද්දි ඒක වළක්වන්න බෑ. ඒනිසා මට අවශ්‍යයි මගේ අවුරුදු හතර ඇතුලේ, මට දීර්ඝ කාලයක ප්‍රාර්ථනාවක් නෑ. හැබැයි ඒ හතර ඇතුලේ ඊළඟට එන කණ්ඩායමට මේක හරියට අරගෙන යන්න පුළුවන් තැනට මෙය පත්කර ගන්නවා. ඒ කියන්නේ එකින් එක එකින් එක වෙනම වෙනම මාව ප්‍රශ්ණ කරයි. කමක් නැහැ කරන්න. හැබැයි ඉතාම හොඳින් හොඳ අවබෝධයකින් මෙයට ඇතුල්වෙමින් ඉන්නවා.සමහර වෙලාවට සමහර දැනුමේ ප්‍රමාණය මදිවෙන්න පුලුවන් සමහර සම්බන්ධකම් හැසිරෙන විදිහ ඒ මතුපිටින් පෙන්නන එක නෙමෙයි යටින්.ඉතා සූක්ෂමව විදිහට මේ කටයුතු කරගෙන ඒ කියන්නේ මොරටුව ජනතාවගේ පූජනීය දේපළක් ලෙස මම මේක සලකන්නේ. අපිට දීලා තියෙන්නේ ඒ පූජනීය දේපළ. ඒ දේපල අපි කල්පනා කරන අර්ථයෙන්ම ආරක්ෂා කරලා දෙන්න අපිට පුලුවන් හැම එකක්ම කරනවා.

**2026.02.18 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රිවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝග්ෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනි වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |

13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ෂර්මන් පිලිසියන් ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
24. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
26. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.02.18 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 17, 18(05), 18(6), 26, 27, 30, 56, 57, 58, 62, 63 යන කමිටු නිර්දේශයන්ට විරුද්ධවත්, අංක 02(3), 12, 16, 18, 19, 22(1) සිට 22(10) දක්වා, අංක 40, 41, 46(10) සිට 46(15) දක්වා අංක 49, 50, 52, 53 යන කරුණු වලට පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටිය අතර, අනෙකුත් සියලුම කමිටු නිර්දේශයන් සඳහා පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - පී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
16. මහා නගර සභා මන්ත්‍රී - එච්. එල්. තිළිනි නෙත්සරණි මෙනවිය

**2026.02.18 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.02.18 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.02.18 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.මනෝජ් මධුරංග විජයරත්න මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |

## 07 ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදින්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 2026.02.18 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 60යටතේ 2026 ජනවාරි මාසයට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම 78 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08 පුද්ගලික ස්වභාවයේ කරුණු - නැත

## 09. වෙනත් කරුණු - නැත

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2026.03.03 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.